	පටුන	පිටු අංකය

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ විගණකාධිපති විශේෂ වාර්තාව

---

01. යථෝක්ත වාර්තාව නිකුත් කිරීමේ අරමුණ.

උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගෙන යාමේදී විවිධ ගැටළු උද්ගත වී තිබූ අතර එය මේ වනවිට ප්‍රාදේශීය වශයෙන් සමාජ අර්බුදයක් බවට පරිවර්තනය වී ඇත. එසේම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ ගැටළු හේතුවෙන් විනිවිදභාවය පිළිබඳ ප්‍රශ්නගත තත්ත්වයක් මතුවී ඇති අතර වර්තමානය වන විට ජාතික ප්‍රශ්නයක් බවට පත්වී ඇත. මේ හේතුවෙන් මෙම ව්‍යාපෘතිය මගින් රාජ්‍ය වියදමට වන බලපෑම, වරින්වර මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධ රේඛීය අමාත්‍යාංශ විසින් නිසි කාර්යසාධනයක් යටතේ සිදු කර ඇත්ද යන වග හා මෙම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු රජයට අවම පිරිවැයක් වැයවන අයුරින් සිදුවන බව තහවුරු කරගැනීම සඳහාත් මෙම අධ්‍යයනය සිදු කෙරේ.

02. මෙම වාර්තාව පිළියෙල කිරීමේදී පහත දැක්වෙන ක්‍රමවේදය අනුගමනය කරන ලදී.

පහත සඳහන් ලේඛන පරීක්ෂා කිරීම.

2.1 මහවැලි මහ සැලැස්ම

2.2 කඩිනම් මහවැලි සැලැස්ම

2.3 **1989** වර්ෂයේ මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය (CECB) විසින් ශ්‍රී ලංකාවේ ගිණිකොන වියලි කලාපයේ සංවර්ධනය සඳහා ප්‍රධාන සැලැස්මට ඇතුළත් යෝජනාව පරිශීලනය

2.4 **1989** සිට **2017** දක්වා වූ අමාත්‍ය මණ්ඩල සංදේශ හා තීරණ පරිශීලනය

2.5 එකඟතා ගිවිසුම - 2007 පරිශීලනය

2.6 ව්‍යාපෘතියට අදාල අවබෝධතා ගිවිසුම පරිශීලනය

2.7 ව්‍යාපෘතියට අදාල කොන්ත්‍රාත් ගිවිසුම පරිශීලනය

2.8 ව්‍යාපෘතියට අදාල ණය ගිවිසුම පරිශීලනය

2.9 ව්‍යාපෘතියට අදාල මූල්‍ය ගිවිසුම පරිශීලනය

2.10 ව්‍යාපෘතියට අදාල උපදේශන සේවා ගිවිසුම පරිශීලනය

2.11 වාර්ෂික ඇස්තමේන්තුව

2.12 ආයතනය පවත්වාගෙන යන ලිපිගොනු

2.13 අදාල පාර්ශවයන් සමඟ කරන ලද සාකච්ඡා

- ව්‍යාපෘති අධ්‍යක්ෂ සමඟ කරන ලද සාකච්ඡා
- මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය (CECB) සමඟ කරන ලද සාකච්ඡා
- විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සමඟ කරන ලද සාකච්ඡා
- කරදගොල්ල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ (ඒකකය) කාර්යාලයේ නිලධාරීන් සමඟ සාකච්ඡා
- බදුල්ල දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම්වරු (ඇල්ල, බණ්ඩාරවෙල හා බදුල්ල)

2.14 ශක්‍යතා වාර්තා අධ්‍යයනය

2.15 වෙනත් අදාල ලේඛන හා වාර්තා අධ්‍යයනය

2.16 ස්ථානීය පරීක්ෂාව

03. විෂය පථය සීමා වීම

මෙම වාර්තාවේ දක්වා ඇති නිරීක්ෂණයන් තුළින් නිගමනයන්ට එළඹීමේදී මාගේ විෂය පථය තුළ මතු දැක්වෙන සීමා කිරීම්වලට යටත් වූ බව අවධාරණය කරනු ලැබේ.

3.1 විෂයගත ක්‍රියාවලිය පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීම ආරම්භකළ දිනය හා අදාල සිද්ධිය සිදුවූ දිනයන් අතර සැළකිය යුතු කාල පරාසයන් තිබීම.

3.2 ව්‍යාපෘතියට අදාල කැණීම් හා ඉදිකිරීම් පරීක්ෂා කිරීමට අදාල විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රමාණවත් දැනුමක් නොවීම සහ ඒ සඳහා විශේෂ සහයක් ලබා නොගැනීම.

3.3 ව්‍යාපෘතියට අදාල පාරිසරික ඇගයීම පසුව සිදුකර තිබීම.

3.4 ව්‍යාපෘතියේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ අවස්ථාවලදී නිලධාරීන්ගේ වෙනස්කම් සිදුවීම හේතුවෙන් ඇතැම් තොරතුරු ලබාගත නොහැකි වීම.

3.5 මෙම වාර්තාව පිළියෙල කිරීම සඳහා අත්‍යාවශ්‍ය ලෙස මා සලකන ලද (ඇමුණුම I) හි සඳහන් තොරතුරු මා වෙත ඉදිරිපත් කර නොතිබීම.

3.6 ව්‍යාපෘතිය ආරම්භ කිරීම එක් අමාත්‍යාංශයක් හා ක්‍රියාත්මක කිරීම තවත් අමාත්‍යාංශයක් මගින් සිදුවීම නිසා පරීක්ෂණයට අදාළ වැදගත් තොරතුරු විගණනයට ලබාගැනීම දුෂ්කර වීම

3.7 රජයන් අතර එකඟතාවයක් මත කොන්ත්‍රාත්කරු ඉරාන රජය මගින් තෝරාදීම හේතුවෙන් එම ක්‍රියාවලිය පරීක්ෂාවට ලක් නොවීම.

3.8 ඉරාන රජයට සම්බාධක පැනවීම හේතුවෙන් රජයන් දෙක අතර පැවති ගිවිසුම සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු ලබාගත නොහැකි වීම.

3.9 අන්තර් අමාත්‍ය කමිටුව මගින් සමාලෝචනය කිරීමෙන් අනතුරුව සකස්කර ඇති දෙවන ශක්‍යතා අධ්‍යයනය යටතේ විෂයය නිර්ණය (TOR) ඉදිරිපත් නොවීම.

3.10 මෙම වාර්තාවේ 5.2.3 ඡේදයෙහි දැක්වෙන තත්ත්වය මත වර්ෂ 1990 සිට 2005 දක්වා අදාල තොරතුරු පරීක්ෂා කළ නොහැකි වීම.

04. විධායක සාරාංශය

දශක කිහිපයක් පුරාවට විවිධ අවස්ථා වලදී උමා ඔය ද්‍රෝණිය ආශ්‍රිතව විවිධ අධ්‍යයනයන් සිදුකර තිබූ අතර උමා ඔය ජලාධාර ප්‍රදේශය සඳහා වන අන්තර් ද්‍රෝණි සංවර්ධනය සහ ද්‍රෝණිය තුළ සංවර්ධනය යන විකල්ප දෙකෙන් වඩා ආකර්ශනීය විකල්පය නිර්ණය කිරීම සම්බන්ධයෙන් පසුකාලීනව වැඩි අවධානය යොමුකර තිබුණි. ඒ අනුව මේ සඳහා ශක්‍යතා අධ්‍යයනය අදියර දෙකකට බෙදා පළමුවන අදියර වශයෙන් අන්තර් ද්‍රෝණි සහ ද්‍රෝණි තුළ ශක්‍යතා අධ්‍යයනය කොට මින් වඩාත් යෝග්‍ය විකල්පය නිර්දේශ කිරීමටත්, දෙවන අදියරින් නිර්දේශිත විකල්පය සම්බන්ධව විස්තීරණ ශක්‍යතා අධ්‍යයනයක් කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට හැකියාව උදාකර ගැනීමට කටයුතු කර තිබුණි. මෙම ශක්‍යතා අධ්‍යයනයේ පළමු අදියර 2002 වර්ෂයේදී සීමාසහිත එස්.එන්.සී.ලැවලින් සමාගම මගින් සිදුකරන ලද අතර අන්තර් ද්‍රෝණි යෝජනාව නිර්දේශ කර ස්වකීය වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

පසුව 2007 වර්ෂයේ ඉරාන රජය හා ශ්‍රී ලංකා රජය අතර ඇතිකර ගත් අවබෝධතා ගිවිසුම ප්‍රකාරව කිලෝමීටර් 20 ක් දිග භූගත උමගක් තුළින් උමා ඔයේ ජලය කිරිඳි ඔයට හැරවීම මගින් ගිණිකොන දිග වියළි කලාපයේ හෙක්ටයාර 5,000 ක භූමි ප්‍රදේශයකට වාරිමාර්ග සැපයීම හා ජල විදුලි බලාගාරයක් ඉදිකිරීම මගින් මොගාවොට් 100 ක ධාරිතාවයකින් යුත් විදුලි බලය නිපදවීම සඳහා ඉරාන රජයේ ආධාර ඇතිව කොන්ත්‍රාත්කරු ලෙස ඉරානයේ ෆරාබ් සමාගම නම් කරමින් ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගිවිසුම් ගත වී තිබුණි.

ඒ අනුව ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදයන්, විස්තීර්ණ ශක්‍යතා අධ්‍යයන සිදු කිරීමේ ප්‍රමාදයන් යනාදී විවිධ හේතු නිසාවෙන් මෙම උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු 2010 වර්ෂයේ ආරම්භ කර තිබුණි. 2013 වර්ෂයේ ඉරාන රජයට සම්බාධක

පැනවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සම්පාදනය කර ගැනීමේ ගැටළු මතු වී ඇති අතර පසුව ශ්‍රී ලංකා රජය විසින්ම මේ වනතෙක් වූ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාල සියලු වියදම් දරා තිබුණි. එසේම 2014 දෙසැම්බර් මස ඇති වූ පළමු ජල කාන්දුව හා 2016 දෙසැම්බර් මස ඇති වූ විශාල ජල කාන්දුව හේතුවෙන් විශාල පාරිසරික හා සමාජීය ගැටළු රැසකට මුහුණපෑමට සිදුවිය.

05. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය

5.1 ව්‍යාපෘතිය හැඳින්වීම

උමාඔය ද්‍රෝණියේ පාරිසරික හා අනෙකුත් ජල අවශ්‍යතාවලට බලපෑමක් ඇති නොවන අයුරින් එම ද්‍රෝණියේ සිට ජල ඌණතාවයෙන් පෙළෙන දක්ෂිණ කලාපයේ කිරිඳිඔය ද්‍රෝණියට ජලය ඝන මීටර් මිලියන 145 ක් වාර්ෂිකව හැරවීම ප්‍රධාන අරමුණ කොටගෙන ශ්‍රී ලංකා රජය හා ඉරාන රජය අතර අවබෝධතා ගිවිසුමක් 2007 නොවැම්බර් 27 දින අත්සන් කර තිබුණි. යථෝක්ත ව්‍යාපෘතියේ හඳුනාගෙන තිබූ විශේෂිත අරමුණු හා ප්‍රතිලාභ පහත පරිදි විය.

5.1.1 මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය හා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පිහිටි නව ඉඩම් හෙක්ටයාර 4,500 ක් හා දැනට වගා කෙරෙන ඉඩම් හෙක්ටයාර 1,500 ක් සඳහා වාරි ජලය සැපයීම.

5.1.2 මෙගාවොට් 100 ක ධාරිතාවයෙන් යුත් භූගත විදුලි බලාගාරයක් මගින් ගිගාවොට් 231 ක විදුලිය නිපදවා ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීම.

5.1.3 ව්‍යාපෘති ප්‍රදේශයේ පානීය හා කර්මාන්ත සඳහා ඝන මීටර් මිලියන 30 ක ජලය සැපයීම.

5.1.4 ඩයබරා හා පුහුල්පොල ඉදි කෙරෙන ජලාශ මගින් බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල සහ ඇටැම්පිටිය ප්‍රදේශවල පානීය ජල අවශ්‍යතා සැපයීම.

5.2 ව්‍යාපෘතිය ආරම්භය

5.2.1 මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ පවතින මෙම ව්‍යාපෘතියට අදාල ලිපිගොනු අධ්‍යයනයෙන් හෙළිවූ කරුණු අනුව 1968 වර්ෂයේදී පාර්ලිමේන්තුව විසින් අනුමත කර තිබූ එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකාර්මික සංවිධානය (FAO) විසින් සකස් කරන ලද මහවැලි ගඟ සම්බන්ධයෙන් වාරිමාර්ග සහ ජලවිදුලි බල සමීක්ෂණ වාර්තා මත සකස් කළ මහවැලි මහ සැලැස්මට (ඇමුණුම II) ඉහළ උමා ඔය සහ පහළ උමා ඔය ජලාශ ඇතුළත් වී තිබුණි. මහවැලි සැලැස්මට අනුව යෝජිත වැඩ කටයුතුවලින් ප්‍රථම පියවරෙහි ව්‍යාපාර අංක 01 ට අදාල ඉදිකිරීම් 1970 – 1977 කාල වකවානුවේදී සිදු කළ අතර ව්‍යාපාර කිහිපයක් තෝරාගෙන කඩිනම් මහවැලි සැලැස්ම ක්‍රියාත්මක කරන ලදී. ඉදිරියේදී සිදුකිරීමට නියමිත වැඩ කොටස් අතරින් එකක් ලෙස ඉහළ උමා ඔය සහ පහළ උමා ඔය ජලාශ ව්‍යාපාරය ඇතුළත් වී තිබුණි. රන්ටැඹේ ජලාශ ප්‍රදේශයේදී මහවැලි ගඟට එක්වන දකුණු ඉවුරෙහි පිහිටි උමා ඔය අතු ගංගාව ඉහළ කඳුකරයේ වැලිමඩ සානුව තුළින් ආරම්භ වී උතුරු දෙසට ගලාවිත් මහවැලි ගඟට එක්වේ. උමා ඔය ආශ්‍රයෙන් ජලාශ දෙකක් ඉදිකිරීමට යෝජිතව තිබූ අතර ඉන් ජල විදුලි බලය නිෂ්පාදනයෙන් පසුව ජලය රන්ටැඹේ ජලාශයට මුදා හැරීමට යෝජනා වී තිබුණි.

5.2.2 1989 ජූලි 17 දින ඉඩම්, වාරිමාර්ග හා මහවැලි අමාත්‍යාංශයේ ලේකම් විසින් South East Dry Zone Development Preliminary Project Proposal සකස් කර දෙන ලෙස මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය (CECB) වෙත කරන ලද ඉල්ලීම පරිදි 1989 සැප්තැම්බර් මස එම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කර තිබුණි. (ඇමුණුම III) එම යෝජනාව මගින් උමා ඔය ද්‍රෝණිය ඇතුළු තවත් ද්‍රෝණි හතරක් පිළිබඳ කරුණු දක්වා තිබුණි.

5.2.3 අනතුරුව 2005 වර්ෂය දක්වා කාලය තුළ මෙම ව්‍යාපෘතියට අදාලව කටයුතු සිදුවූ ආකාරය පිළිබඳ කිසිදු වැදගත් තොරතුරක් විගණනයට අනාවරණය නොවුණි.

5.3 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

5.3.1 කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබූ 2005 ජනවාරි 04 දිනැති අංක අමප/05/0036/039/002 දරන "උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය"යන මැයෙන් ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශයට (ඇමුණුම IV) අනුව පහත කරුණු අනාවරණය කර තිබුණි.

5.3.1.1 උමා ඔය ජල සම්පත් උපයෝගි කොටගෙන ද්‍රෝණිය තුළ ජල විදුලිය සංවර්ධනය කිරීම සඳහා අධ්‍යයන කිහිපයක් කර ඇති බව.

5.3.1.2 හම්බන්තොට හා මොණරාගල දිස්ත්‍රික්කවල සංවර්ධනය සඳහා **2030** වන විට ඇතිවන ඝනමීටර් මිලියන **100** ජල අවශ්‍යතාවයන් හා ගෘහස්ථ ජල විදුලි, කෘෂිකාර්මික ජල අවශ්‍යතාවයන් සපුරාගැනීම සඳහා උමා ඔයේ ජලය අග්නිදිග වියලි කලාපයන්ට හැරවීම හැර වෙනත් විකල්පයක් නොමැති බව.

5.3.1.3 උමා ඔය ජලධාර ප්‍රදේශය සඳහා වන අන්තර් ද්‍රෝණි සංවර්ධනය සහ ද්‍රෝණිය තුළ සංවර්ධනය යන විකල්ප දෙකෙන් එකක් තෝරාගත යුතුව තිබූ බව.

5.3.1.4 එම තෝරාගැනිම පළමු ශක්‍යතා අධ්‍යයනය මගින් සිදුකළ යුතු බව

5.3.1.5 පළමු ශක්‍යතා අධ්‍යයනයෙන් වඩාත් යෝග්‍යයැයි එම ශක්‍යතා අධ්‍යයනය සිදුකළ සීමා සහිත එස්.එන්.සී ලැවලින් ස්විඩන් සමාගම **(2002)** යෝග්‍ය විකල්පය ලෙස අන්තර් ද්‍රෝණි සංවර්ධනය නිර්දේශ කර ඇති බව (ඇමුණුම V).

5.3.1.6 එම නිර්දේශය අන්තර් අමාත්‍ය කමිටුව මගින් සමාලෝචනය කිරීමෙන් අනතුරුව දෙවන ශක්‍යතා අධ්‍යයනය යටතේ විස්තීර්ණ වාර්තාවක් (TOR) සකස් කර ඇති බව.

5.3.1.7 මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන **15,000** ක් වැය කිරීමට අපේක්ෂිත අතර ව්‍යාපෘති කාලය වර්ෂ **04** ක් පමණ ගතවන බව.

5.3.2 තවද ඉහත **5.3.1** හි සඳහන් සංදේශයෙන් පහත කරුණු සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කර තිබුණි.

5.3.2.1 ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනයේ දෙවන අදියර සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් ලබාදී එය ක්‍රියාත්මක කිරීම.

5.3.2.2 එයට අවශ්‍ය සම්පත් දායකත්වය ලබා ගැනීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට යොමු කිරීම.

5.3.3 ඉහත සඳහන් සංදේශය සඳහා මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ (ඇමුණුම VI) වූයේ සංදේශයේ පළමු යෝජනාවේ පරිදි ශක්‍යතා අධ්‍යයනයේ නිර්දේශයන් සැලකිල්ලට ගැනීමෙන් පසුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට තීරණය කළ යුතු බවට එකඟවන බවත්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් දැනටමත් මෙම ශක්‍යතා අධ්‍යයනයේ දෙවන අදියර සඳහා ප්‍රදායක සහය ලබාගැනීමට ව්‍යාපෘති ලැයිස්තුවට ඇතුළත් කර ඇති බවත්ය.

5.3.4 2005 ජනවාරි 26 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඉහත සංදේශයට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සමඟ සලකා බලා ශක්‍යතා අධ්‍යයනයේ නිර්දේශ සලකා බැලීමෙන් අනතුරුව අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ තීරණය කිරීමට යටත්ව, සංදේශයේ (1) හි (ඉහත 5.3.2.1 හි සඳහන්) යෝජනාව අනුමත කරන ලද අතර එහි (2) යෝජනාව සම්බන්ධයෙන්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ත්‍යාගදායී සහය අපේක්ෂිත ව්‍යාපෘති ලැයිස්තුවට මෙකී ශක්‍යතා අධ්‍යයන දෙවන අදියර දැනටමත් ඇතුළත් කොට ඇති බැව් සැලකිල්ලට ගෙන තිබුණි. (ඇමුණුම VII)

5.3.5 2007 නොවැම්බර් 27 දින ශ්‍රී ලංකා ජනාධිපතිවරයාගේ ඉරාන සංචාරයේදී උමා ඔය ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ඉරාන ඉස්ලාමීය ජනරජය අතර එකඟතා ගිවිසුමක් (MOU) (ඇමුණුම VIII) අත්සන් කර තිබුණි. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ සහයෝගීතාවයද සහිතව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය (Executing Agency) වශයෙන් වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය නම් කර එම එකඟතා ගිවිසුම පරිදි ප්‍රධාන කොන්ත්‍රාත්කරු වශයෙන් ඉරාන ඉස්ලාමීය ජනරජය විසින් ඉරානයේ ෆරාබ් (FARAB) සමාගමට බලය පැවරීමටද එහිදී එකඟ වී තිබුණි.

5.3.6 ඉහත 5.3.5 ඡේදයේ සඳහන් පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය නම් කළද, පසුව ඉදිරිපත් කළ පරිශිෂ්ඨ II මගින් එය මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ලෙස සංශෝධනය වී තිබුණි.

5.3.7 විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබූ 2007 දෙසැම්බර් 14 දිනැති අංක අමප/07/2274/353/030-1 දරන "අතිගරු ජනාධිපතිතුමාගේ ඉරාන සංචාරය අතරතුරදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ඉරාන ඉස්ලාමීය ජනරජය අතර එකඟතා ගිවිසුමක් (MOU) අත්සන් කිරීම " යන හිසින් යුතු අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් (ඇමුණුම IX) එකඟතා ගිවිසුමේ සඳහන් කරුණුවලට ආවරණ අනුමැතිය ඉල්ලා තිබුණි.

5.3.8 ඉහත සඳහන් සංදේශය මගින් උමා ඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම සඳහා වූ අවබෝධතා ගිවිසුම ඇතුළුව ගිවිසුම් 04 කට 2007 දෙසැම්බර් 19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ආවරණ අනුමැතිය (ඇමුණුම X) ලබාදී තිබුණි.

5.3.9 වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යවරයා විසින් 2008 පෙබරවාරි 12 දිනැති අංක අමප/08/0309/356/002 දරන "උමා ඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය" යන මැයෙන් යුතු අමාත්‍ය මණ්ඩල සංදේශය (ඇමුණුම XI) ඉදිරිපත් කර තිබූ අතර එම සංදේශයේ පූර්ව ශක්‍යතා අධ්‍යයන කිහිපයක් මීට පෙර 1988/89 කාල වකවානුව තුළ ශ්‍රී ලංකාවේ විදුලිබල මහ සැලැස්ම යටතේ ලංකා විදුලි බල මණ්ඩලය විසින්ද, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) විසින් 1991 වසරේ ද, පසුකාලීනව 2000 වසරේ එස්.එන්.සී - ලැවලින් අන්තර් ජාතික සමාගම විසින්ද සිදුකොට ඇති අතර, ඒ සඳහා උමං හෑරීමේ විශේෂ යන්ත්‍රයක් මගින් උමං කැනීම සිදු කරන්නේ නම් එක්සත් ජනපද ඩොලර් මිලියන 140.5 ක් ද නොඑසේව සාමාන්‍ය උමං කැනීමේ ක්‍රමවේදය භාවිතා කරන්නේනම් එක්සත් ජනපද ඩොලර් මිලියන 151.7 ක් ද වැය වෙතැයි ඇස්තමේන්තු කර තිබෙන බවද 2007 වර්ෂයේදී සම්පූර්ණ අධ්‍යයනයක් සඳහා විෂයය නිර්ණේය (TOR) සකස් කොට ඇති බවද සඳහන් කර තිබුණි.

5.3.10 එම සංදේශයේ (ඇමුණුම XI) 04 හා 05 ඡේද පරිදි කඩිනම් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම ඇතුළුව පහත සඳහන් කරුණු සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා තිබුණි.

5.3.10.1 ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු පත්කොට ව්‍යාපෘති කාර්යාලයක් ආරම්භ කිරීම. මෙහිදී එච්.බී. ජයසේකර නැමැත්තෙකු මෙම තනතුර සඳහා සුදුසු බව නිර්දේශ කර තිබුණි.

5.3.10.2 එකඟතා ගිවිසුම පරිදි ඉරාන ෆරාබ් ඉංජිනියරින්ස් ඇන්ඩ් වෝටර් ප්‍රොජෙක්ට් (FARAB Engineering & Water Projects) සමාගමෙන් පළමු පියවර සඳහා තාක්ෂණික හා

වාණිජමය යෝජනා කැඳවීම හා කොන්දේසි සාකච්ඡා කොට එකඟතාවයට එළඹීම සඳහා මණ්ඩලයක් පත්කිරීම.

5.3.10.3 ශක්‍යතා අධ්‍යයනය සම්පූර්ණ කිරීම ඇතුළුව මූලාරම්භක කටයුතු සඳහා 2008 වර්ෂය තුළදී අමතර ප්‍රතිපාදන ලබා ගැනීම.

5.3.10.4 මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අදාල අමාත්‍යාංශ/ ආයතන ඇතුලත් වන ජාතික නියාමන කමිටුවක් ස්ථාපනය කිරීම.

5.3.11 ඉහත සඳහන් සංදේශයට අදාළව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් කරුණු (ඇමුණුම XII) දක්වා තිබුණේ (i), (ii) හා (iv) යෝජනා සම්බන්ධයෙන් එකඟ වන අතර (iii) යෝජනාව සම්බන්ධයෙන් 2008 වසර සඳහා ලබාදී ඇති රුපියල් මිලියන 30 ක ප්‍රතිපාදන යොදා ගැනීමට අමතරව ව්‍යාපෘති වියදම් හා ණය ගිවිසුම් අත්සන් කිරීමත් සමඟ අවශ්‍ය පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමට හා 2009 අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ලබා ගැනීමටත් කටයුතු කළ යුතු බවටය. තවද ජාතික නියාමන කමිටුව පත් කිරීමේදී ඒ සඳහා සම්බන්ධ වන සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන ආවරණය වන පරිදි අවශ්‍ය නිලධාරීන් පත් කිරීම සුදුසු බවටද නිරීක්ෂණය කර තිබුණි.

5.3.12 2008 පෙබරවාරි 21 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සමඟ සලකා බලා ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල සංදේශයේ i, ii, හා iv යෝජනාවලට අනුමැතිය දෙන ලද අතර ජාතික නියාමන කමිටුව පත් කිරීමේදී අදාල සියළු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතනවල නියෝජනය තහවුරු කළ යුතු බවත්, එහි සඳහන් iii වන යෝජනාව සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් මෙකී නිරීක්ෂණවල දක්වා ඇති ආකාරයට ක්‍රියා කළ යුතු බවත් (ඇමුණුම XIII) තීරණය කර තිබුණි.

5.3.13 වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2008 අප්‍රේල් 28 දිනැති අංක අමප/08/0810/356/002-1 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ පහත කරුණු (ඇමුණුම XIV) ඇතුළත්ව තිබුණි.

5.3.13.1 මෙවැනි බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමයක් ආරම්භකොට ක්‍රියාත්මක කිරීම සඳහා ගතයුතු පියවර හා ක්‍රියා පටිපාටියට පහත දෑ ඇතුළත් බව.

5.3.13.2 අවබෝධතා ගිවිසුමෙන් බලාපොරොත්තු වූ පරිදි දැනට කෙරී ඇති ශක්‍යතා අධ්‍යයන සම්පූර්ණ කිරීම. එම ගිවිසුමෙහි සඳහන් අන්දමට එම ශක්‍යතා අධ්‍යයන යාවත්කාලීන කර සාර්ථකව සම්පූර්ණ කොට සවිස්තරාත්මක ඉංජිනේරුමය සැලසුම් සම්පාදනය කිරීම ඇතුළුව ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමේ පියවර දක්වා අවතීර්ණය වීම සඳහා නම් කරන ලැබූ කොන්ත්‍රාත්කරු වෙතින් තාක්ෂණ හා වාණිජමය යෝජනා කැඳවීම කළ යුතු බව.

5.3.13.3 කොන්ත්‍රාත්කරු විසින් එම ශක්‍යතා අධ්‍යයන සඳහා හැකිතාක් දුරට දේශීය මානව සම්පත් උපයෝගී කොට ගනිමින් ක්‍රියාත්මක කිරීමේ විධායක ආයතනයේ අනුමැතිය සහිතව උපදේශකවරුන් යොදවා ගැනීම.

5.3.13.4 ශක්‍යතා අධ්‍යයනය සම්පූර්ණ කළ විට, ක්‍රියාත්මක කිරීමේ විධායක ආයතනය විසින් එය පිළිගෙන අනුමත කිරීමෙන් පසු සවිස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සම්පාදනය කිරීම හා ඉදිකිරීම් කටයුතුවල නිරත වීමට කොන්ත්‍රාත්කරු වෙත අවසරය ලබාදීම.

5.3.13.5 මෙහිදී ප්‍රසම්පාදන මණ්ඩලය විසින් එම සැලසුම් පරීක්ෂා කිරීම හා මිල ගණන් සඳහා එකඟවීමද අවශ්‍ය වන බව.

5.3.13.6 ඉදිකිරීම් ආරම්භකොට පවත්වාගෙන යෑමේදී අනුක්‍රමයෙන් ඒවා පිළිගෙන අනුමත කොට භාරගැනීම සඳහා සිවිල් ඉංජිනේරු වැඩ සහ විද්‍යුත් - යාන්ත්‍රික සවිකිරීම් යනාදී අංග හා එහි එක් එක් අවස්ථා වර්ගීකරණය කළ යුතු බව.

5.3.13.7 මෙවැනි සංකීර්ණ අංග ඇතුළත්වන ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතියක, කොටස් වශයෙන් සම්පූර්ණ කළ යුතු එක් එක් අංගවල ස්වභාවය හා විශාලත්වය අනුව පහත ක්‍රියා පටිපාටිය අනිවාර්යෙන්ම අනුගමනය කළ යුතු බව.

5.3.13.8 කොන්ත්‍රාත්කරණයේදී ගිවිසුම්වලට එළඹීමේ අවස්ථාවන්, ශක්‍යතා අධ්‍යයන අවධිය හා ඉදිකිරීම් කටයුතු කිරීමේ අවධිය වශයෙන් වෙන්කොට හඳුනා ගත යුතු බව.

5.3.13.9 පහත වර්ගීකරණය අනුව ව්‍යාපෘති අංග හා එහි එක් එක් අවස්ථා අනුක්‍රමයෙන් පිළිගෙන අනුමත කිරීම පිළිඹිඹුවන සේ කොන්ත්‍රාත්කරු සමඟ මිල ගණන් සඳහා එකඟතාවට එළඹීම.

පළමු පියවරෙහිදී ශක්‍යතා අධ්‍යයනය හා සැලසුම් පිළියෙල කිරීම.

මංමාවත් සහ තාවකාලික වැඩ

වේලි හා ජල විද්‍යාත්මක නිර්මිති

ජල මාර්ග, උමං මාර්ග හා පතල් ළිඳ

ජල විදුලි බලාගාර සිවිල් ඉංජිනේරු වැඩ

විද්‍යුත් - යාන්ත්‍රික හා ජල විද්‍යා යාන්ත්‍රික උපකරණ සවි කිරීම.

උපදේශක, ඉංජිනේරු කළමනාකරණ සේවා

5.3.13.10 ශ්‍රී ලංකාවට 2008 අප්‍රේල් 28 දින ඉරාන ඉස්ලාමීය ජනරජයේ ජනාධිපතිතුමා රාජ්‍ය නිල චාරිකාවකට පැමිණෙන අවස්ථාවේදී මෙම ව්‍යාපාරයෙහි සමාරම්භක උත්සවය පැවැත්වීමට නියමිත බවත් මෙම අවස්ථාවේදී ඉරාන ෆරාබි සමාගම සමඟ ගිවිසුමකට එළඹීමේ අවශ්‍යතාවය උදාවී ඇති බව

5.3.13.11 කාල සීමාව නොමැති බැවින් එම ගිවිසුමෙහි කෙටුම්පත නීතිපතිවරයා විසින් අනුමත කොට නොමැති බව.

5.3.14 සංදේශයේ සඳහන් ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් අවස්ථානුකූලව ගතයුතු ක්‍රියාමාර්ග වශයෙන් පහත යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කර තිබුණි.

5.3.14.1 අමාත්‍ය මණ්ඩලයෙන් පත්කරනු ලබන එකඟතාවට එළඹීමේ ප්‍රසම්පාදන කමිටුව පහත පරිදි පත් කිරීම.

විද්‍යාජෝති ඉංජි.ඒ.ඩී.එස්.ගුණවර්ධන - වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්

ඇම්.ඇම්.සී.ෆර්ඩිනැන්ඩු - විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්

මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙක්

5.3.14.2 පහත පරිදි ව්‍යාපෘති කමිටු සාමාජිකවරු පත්කිරීම.

ඉංජි.තිස්ස හේරත්, අතිරේක ලේකම් (විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය)

ඉංජි.ඩබ්.ඇම්.ඇස්.සී.පියදාස, සාමාන්‍යාධිකාරි (මධ්‍යම ඉංජි.උප.කාර්යාශය)

ඉංජි.කමනි ජයසේකර මිය, ප්‍රධාන ඉංජි. (ලංකා විදුලිබල මණ්ඩලය)

ඉංජි.ජී.වී.රත්නසාර, අධ්‍යක්ෂ (වාරිමාර්ග දෙපාර්තමේන්තුව)

මහා භාණ්ඩාගාරයේ නියෝජිත

ආයෝජන මණ්ඩල නියෝජිත

මහ බැංකුවේ නියෝජිත

නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජිත

5.3.14.3 විධිමත් ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් එකඟතාවට පැමිණි කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීම පදනම් කොට ගනිමින් සංදේශයේ අමුණා ඇති "උමා ඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය හා ඉරාන ඉස්ලාමීය ජනරජයේ ෆරාබ් බලශක්ති හා ජල ව්‍යාපෘති ආයතනය අතර කොන්ත්‍රාත් ගිවිසුම" වශයෙන් කෙටුම්පත් කොට ඇති ගිවිසුම අත්සන් කිරීමට වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයාට බලය පැවරීම.

5.3.14.4 මෙම ව්‍යාපෘතියේ සංවර්ධන යෝජනාවලියට බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ ප්‍රදේශයට ලැබෙන නවාංගයක් අන්තර්ගත කිරීම. (මේ සඳහා විස්තර යෝජනා සකස් කර යථාකාලයේදී ඉදිරිපත් කරනු ලබනු ඇත)

5.3.15 2008 අප්‍රේල් 30 දින පැවති ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඉහත සඳහන් සංදේශයේ යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය (ඇමුණුමXV) ලබා දී තිබුණි.

5.3.16 වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යවරයා විසින් 2008 ඔක්තෝබර් 08 දිනැති අංක අමප/08/1857/356/002 – IV දරන සංදේශයෙන් (ඇමුණුම XVI) 2008 අප්‍රේල් 28 දිනැති ඉහත සංදේශයෙන් පත්කළ ව්‍යාපෘති කමිටුවේ සභාපති හා කමිටුව ශක්තිමත් කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයෙන් ඉංජිනේරුවරු දෙදෙනෙකු පත්කිරීමට පහත සඳහන් කරුණු ඉදිරිපත් කර තිබුණි.

5.3.16.1 ඉංජී.ඩබ්.එම්.එස්.සී.පියදාස මහතා (ඉහත **5.3.14.2** හි සඳහන්) වෙනුවට කමිටුවේ සාමාජික හා සභාපති ලෙස ආචාර්ය ඉංජී.එස්.එන්.කේ.එන් ද සිල්වා මහතා පත්කිරීම හා,

5.3.16.2 දැනට පත්කර ඇති සාමාජික මහත්ම මහත්මීන් සත් දෙනාට අමතරව පහත නම් සඳහන් නිලධාරීන් දෙදෙනා ද ව්‍යාපෘති කමිටුවේ සාමාජික මහතුන් ලෙස පත් කිරීම

ආචාර්ය ඉංජී.එල්.බී.කමල් ලක්සිරි මහතා, ව්‍යාපෘති අධ්‍යක්ෂ, බ්‍රොඩ් ලන්ඩ් ජලවිදුලි ව්‍යාපෘතිය.

ඉංජී.ඒ.කේ.එන්.ඩී.අතුකෝරාල මහතා, ව්‍යාපෘති අධ්‍යක්ෂ, පුත්තලම ගල්අඟුරු විදුලිබල ව්‍යාපෘතිය.

5.3.17 ඉහත සඳහන් සංදේශයට **2008** ඔක්තෝබර් මස **08** දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී යෝජිත පරිදි අදාල කමිටු දෙකේ සංයුතිය සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහ එකතු කිරීම් සිදුකිරීම සඳහා අනුමැතිය (ඇමුණුම XVII) ලබාදී තිබුණි.

5.3.18 වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය හා ඉරාන ඉස්ලාමීය ජනරජයේ ෆරාබ් (FARAB) සමාගම අතර **2008** අප්‍රේල් **28** දින කොන්ත්‍රාත් ගිවිසුමක් (ඇමුණුම XVIII) ඉරාන ජනාධිපතිවරයාගේ ශ්‍රී ලංකා සංචාරයට අනුගාමීව අත්සන් කර තිබුණි. එම ගිවිසුම අනුව ශක්‍යතා අධ්‍යයන වාර්තාව නැවත පිළියෙල කිරීමත්, විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සකස් කිරීමත්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියළුම ද්‍රව්‍ය, උපකරණ, යන්ත්‍ර සම්පාදනය කිරීමත්, ව්‍යාපෘතියේ ඉදිකිරීම් ස්ථාපිත කිරීම හා උපකරණ වල ක්‍රියාත්මක තත්ත්වය පරීක්ෂා කිරීම හා එය ක්‍රියාවට නැංවීමත් ඉරානයේ ෆරාබ් (FARAB) සමාගම විසින් සිදුකළ යුතු විය.

5.3.18.1 මෙම ගිවිසුම අනුව අදාළ ව්‍යාපෘතිය ආරම්භක දින සිට මාස **60** ක් තුළ නිම කළ යුතු බවත්, ඒ සඳහා එකඟ වූ පිරිවැය එක්සත් ජනපද ඩොලර් **548,150,000** ක් බවත් සඳහන් විය. තවද කොන්ත්‍රාත්තුව අත්සන් කළ වහාම සේවායෝජකයා විසින් කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය යෝජනාව පිළිබඳ එකඟතාවට පැමිණීමත්, සම්පූර්ණ කොන්ත්‍රාත් මුදල ඇතුළුව එම ගෙවීමේ ක්‍රමය තීරණය කිරීම පිණිසත් අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා එය ශ්‍රී ලංකා ජන රජය විසින් පත්කරනු ලබන එකඟතාවට එළඹීමේ කමිටුව වෙත යොමු කළ යුතු බවත්,

සේවායෝජකයා විසින් ශ්‍රී ලංකා ජනරජයේ අමාත්‍ය මණ්ඩලය මගින් තීරණය කරනු ලබන එම කොන්ත්‍රාත්ගත මුදල හා ගෙවීම් ක්‍රමය ගිවිසුම අත්සන් කොට මාස තුනක් ඇතුළත කොන්ත්‍රාත්කරු වෙත දැනුම්දිය යුතු බවත්, ශ්‍රී ලංකා ජනරජයේ අමාත්‍ය මණ්ඩලය මගින් එසේ තීරණය කරනු ලබන කොන්ත්‍රාත්ගත මුදල හා ගෙවීම් ක්‍රමය කොන්ත්‍රාත්කරු විසින් පිළිගත් පසු, ඔහු විසින් එය කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය යෝජනාව ලෙස ප්‍රකාශ කළයුතු බවත් සඳහන් විය. (මෙම ගිවිසුමට සිදුකර ඇති සංශෝධන පිළිබඳ තොරතුරු 5.3.34 ඡේදයේ දක්වා ඇත.)

5.3.18.2 කොන්ත්‍රාත් මුදල හා ගෙවීමේ ක්‍රමවේදය තීරණය කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ එකඟතාවට එළඹීමේ කමිටු වාර්තාව (ඇමුණුම XIX) අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් වෙත 2008 නොවැම්බර් 27 දින ඉදිරිපත් කර තිබුණි.

5.3.18.3 ඉහත අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ එකඟතාවට එළඹීමේ කමිටු වාර්තාව සඳහා එහි එක් කමිටු සාමාජිකයෙකු වූ වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් අත්සන් කර නොතිබූ අතර ඔහු විසින් ඒ සඳහා එකඟ නොවීමට පහත සඳහන් හේතු වෙනම ඉදිරිපත් කර තිබුණි (ඇමුණුම XX).

5.3.18.3.1 කුමන විධි භාවිතා කළද, මෙම කාර්යය සඳහා එක්සත් ජනපද ඩොලර් 483 ක මුදල ඉතා ඉහළ අගයක් බව හා වර්තමානයට පුරෝකතනය කළ පූර්ව ශක්‍යතා අධ්‍යයනය (2002 කැනඩියන් ලැවලින්) සහ ඉහළ කොත්මලේ ජලවිදුලි ව්‍යාපෘතිය වැනි මේ හා සමාන කාර්යයන් වල අගයන් හා සැසඳීමේදී මෙම වටිනාකම සාධාරණීකරණය කළ නොහැකි බව.

5.3.18.3.2 වක්‍රාකාර විධි මගින් පුරෝකථනය කිරීමේදී ආසන්නතම අගයක් එක්සත් ජනපද ඩොලර් මිලියන 300 නොඉක්මවන බව

5.3.18.3.3 ඉරාන ජනාධිපතිතුමාගේ සංචාරය වූ කාලයේදී ෆරාබි සමාගම සමඟ ගිවිසුම්ගත වීමට පදනම් වූ තත්වයන් මෙම අවස්ථාවේදී අදාළ කරගත යුතුබව

5.3.18.3.4 අවබෝධතා ගිවිසුම ප්‍රකාරව ශක්‍යතා අධ්‍යයනය සිදුකිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා රජය ෆරාබි සමාගමට ඉල්ලීම් යැවූවද, ශ්‍රී ලංකා රජය සමඟ කිසිදු සාකච්ඡාවක් නොමැතිව ඔවුන් EPC කොන්ත්‍රාත්තුව බලගැන්වූ බව

5.3.18.3.5 ශ්‍රී ලංකා රජය සතුව එක්සත් ජනපද ඩොලර් මිලියන 150 ක ලැවලින් ඇස්තමේන්තුව තිබියදී, ඉරාන රජය විසින් ව්‍යාපෘති මුදලින් සියයට 85 ක් ආවරණය වන ඇමරිකන් ඩොලර් මිලියන 450 ක් ඉදිරිපත් කර ඇති බව

5.3.18.3.6 ඉරාන ජනාධිපතිගේ පැමිණීමට දින කිහිපයකට පෙර ෆරාබි සමාගම විසින් එක්සත් ජනපද ඩොලර් මිලියන 548 ක් මිලක් සහිත ගිවිසුමක් අත්සන් කිරීමට භාරදී ඇති අතර ශක්‍යතා අධ්‍යයනය සමඟ මිල පිළිබඳ එකඟතාවයට පැමිණීම යන්න දක්වමින් කිසිදු අපහසුතාවයකින් තොරව දෙරට අතර ගිවිසුම අත්සන් කළ බව

5.3.18.3.7 මිල තීරණය කිරීමට පෙර පරාමිතින් විධිමත්ව නිර්වචනය නොකිරීමෙන්, කොන්ත්‍රාත්කරු හට විශාල අයකිරීම් ඉදිරිපත් කළ හැකි බව හා කොන්ත්‍රාත් මිල ඉහළ යා හැකි බව

5.3.18.3.8 විශාල භූගත වැඩ ප්‍රමාණයක් සිදුකිරීමට නියමිත මෙම ව්‍යාපෘතිය සඳහා ජාත්‍යන්තර පිළිගත් පරිචයන් අනුව EPC කොන්ත්‍රාත්තුවක් සුදුසු නොවන හෙයින් පළමුව මෙම කාර්යය සඳහා ව්‍යාපෘති කමිටුව එකඟ නොවූ බව

5.3.18.3.9 ජලාශ ධාරිතාවය, ජල ඝනත්වය, මූලස්ථායී උමගේ භූවිද්‍යා සැකැස්ම, සමස්ථ බලශක්ති ධාරිතාවය හා ආර්ථික ශක්‍යතාවය යනාදී සියළු අස්ථිරතාවයන් පූර්ණ ශක්‍යතා අධ්‍යයනයක් කිරීමෙන් පසුව පමණක් සමනය කරගත හැකිවීම සමඟ මෙවැනි ඉහළ අගයක් සහිත කොන්ත්‍රාත් මිලක් සඳහා ශ්‍රී ලංකා රජය එකඟ වීම උචිත නොවන බව

5.3.18.4 2008 අප්‍රේල් 28 දින අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ෆරාබි සමාගම විසින් ව්‍යාපෘති කාර්යන් වන පිරියත යන්ත්‍ර හා උපකරණ තෙවන පාර්ශව වගකීම හා නැව් මගින් ප්‍රවාහනය යන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ශ්‍රී ලංකා රක්ෂණ සමාගම වෙතින් රක්ෂණාවරණයක් (ඇමුණුම XXI) ලබාගෙන තිබුණි.

5.3.19 ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් හා ඉරාන අපනයන සංවර්ධන බැංකුව අතර මෙයට අදාල මූල්‍යනය ගිවිසුම (ඇමුණුම XXII) ඉරාන ජනාධිපතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරයට සමගාමීව 2008 අප්‍රේල් මස 28 දින අත්සන් කර තිබුණි.

5.3.20 මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාවරයා විසින් 2008 මැයි 30 දිනැති අංක අමප/0993/0306/052 දරන උමා ඔය ජල විදුලි හා වාරිමාර්ග ව්‍යාපෘතිය යන මැයෙන් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් (ඇමුණුම XXIII) 2008 අප්‍රේල් 28 දින ශ්‍රී ලංකා රජය හා ඉරාන අපනයන සංවර්ධන බැංකුව සමඟ අත්සන් කරන ලද එම මූල්‍ය ගිවිසුමේ ප්‍රධාන නියමයන් පහත පරිදි බව දක්වා තිබුණි.

5.3.20.1 පොලී අනුපාත - වාර්ෂික ඇමරිකන් ඩොලර් ලන්ඩන් අන්තර් බැංකු අර්පන අනුපාතය

5.3.20.2 ආපසු ගෙවිය යුතු කාලසීමාව - වසර 05 ක සහන කාලයක් සහිතව වසර 15 කින්.

5.3.20.3 අපනයන ණය ආවරණ ගාස්තුව - මුළු ණය මුදල් ප්‍රමාණයෙන් සියයට 7.5 ක්

5.3.20.4 වගකීම් ගාස්තු - ණය මුදල උපයෝජනය නොකළ කොටසින් වසරකට සියයට 0.125ක්

5.3.20.5 පරිපාලන ගාස්තු - මුළු ණය මුදලෙන් සියයට 0.125 ක්

5.3.20.6 අත්තිකාරම් මුදල - මුළු කොන්ත්‍රාත් මුදලෙන් සියයට 15 (ණය ගිවිසුම අත්සන් කළ පසු සියයට 10 හා එය ගෙවා වසරක් ඇතුළත ඉතිරි සියයට 5)

5.3.20.7 ණය ගෙවීමේ ඇපකරය - ඉරාන අපනයන සංවර්ධන බැංකුවේ අවශ්‍යතාවය අනුව රජය විසින් නිකුත් කරනු ලබන ණය ගෙවීමේ ඇපකරයක්.

5.3.21 පෙර පැවති අවබෝධතා ගිවිසුම මත පදනම්ව ඉහත සඳහන් මූල්‍ය ගිවිසුම අත්සන් කළ බවද සඳහන් කරමින් මෙම සංදේශය මගින් පහත කරුණු සඳහා ආවරණ අනුමැතිය අපේක්ෂා කර තිබුණි.

5.3.21.1 අදාල ණය ගිවිසුමට එකඟතාවය දක්වා ඇති හෙයින් සංදේශයේ 5 හි i සිට vi දක්වා ඇති ප්‍රධාන නියමයන් මත එක්සත් ජනපද ඩොලර් මිලියන 450 ක් නොඉක්මවන ණය මුදල් ලබා ගැනීම සඳහා අත්සන් කළ ගිවිසුම සඳහා හා

5.3.21.2 නීතිපතිගේ එකඟතාවය ලබාගැනීමෙන් පසු සංදේශයේ 5 හි VII ප්‍රකාරව ණය ගෙවීමේ ඇපකරයක් රජය මගින් නිකුත් කිරීම සඳහා

5.3.22 ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල සංදේශයට 2008 ජුනි 04 වන දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ආවරණ අනුමැතිය (ඇමුණුම XXIV) ලබාදී තිබුණි.

5.3.23 වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2008 ජුනි 05 දිනැති අංක අමප/08/1035/356/002 – III දරන "උමා ඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය" ඉරාන රජයේ ෆරාබි (FARAB) සමාගම සමඟ ඇතිකර ගත් කොන්ත්‍රාත් ගිවිසුම යන මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශයේ (ඇමුණුම XXV) පහත සඳහන් කරුණු දක්වමින් අමාත්‍ය මණ්ඩලයේ අවධානය/ එකඟතාවය ඉල්ලා තිබුණි.

5.3.24 ශ්‍රී ලංකා ජනරජයේ වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යංශය හා ඉස්ලාමීය ඉරාන ජනරජයේ ෆරාබි සමාගම (FARAB) අතර 2008 අප්‍රේල් 28 දින අත්සන් කරන ලද ඉහත ඡේදයේ සඳහන් කොන්ත්‍රාත් ගිවිසුමේ 3 (d) වගන්තිය (ඇමුණුම XVIII) ප්‍රකාරව පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කළ විට කොන්ත්‍රාත්කරුගේ යෝජනා පිළිගැනීම හා ගිවිසුම් ගත මුදල හා ගෙවීමේ ක්‍රමය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු බව සංදේශයේ සඳහන් කර තිබුණි.

5.3.25 තවද එම සංදේශයෙහි ව්‍යාපෘතියේ වත්මන් තත්වය යටතේ පහත කරුණු සඳහන් කර තිබුණි.

5.3.25.1 2008 මැයි 23 දින ව්‍යාපෘති කමිටුව ඉදිරිපත් කරන ලද අතුරු වාර්තාවේ පහත කරුණු සඳහන්ව තිබුණි.

"මෙම ව්‍යාපෘතියේ ස්වභාවය අනුව ඊට සරිලන මට්ටමේ පූර්ණ ශක්‍යතා අධ්‍යයනයක් නොමැත්තේනම් ඊට අදාලවන්නා වූ වැඩ ප්‍රමාණය අවිනිශ්චිතය. එම නිසා සම්පූර්ණ කොන්ත්‍රාත් මුදල කොපමණ විය යුතුදැයි යන්න තීරණය කළ නොහැකිය. ව්‍යාපෘතියේ වැඩ ප්‍රමාණය එම ශක්‍යතා අධ්‍යයනය පරිදි නිගමනය විය යුත්තකි."

5.3.25.2 අනතුරුව 2008 ජුනි මස 02 දින පැවති අමාත්‍ය මණ්ඩලය පත්කරනු ලැබූ එකඟතාවයට එළඹීමේ කමිටු රැස්වීමේදී උමා ඔය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව දක්වා තවමත් විකාශනය වී නොමැති බවත්, එමනිසා නියාමකයන් හා ව්‍යාපෘතියේ ප්‍රධාන අංග ලක්ෂණ පිළිබඳව අවසාන තීරණයකට එළඹී නොමැති බවටත් තීරණය වී තිබුණි. තවද තාක්ෂණික ගැටළු හා හිමිකම් ඉල්ලීම් පිළිබඳ පැන නැගිය හැකි අවස්ථා කරන කොටගෙන ශ්‍රී ලංකා රජයේ අපේක්ෂාවන්ට අවාසියක් නොවන පරිදි මෙවැනි ව්‍යාපෘතියක් පරිපාලනය කිරීම නොකළහැක්කක් වනු ඇති බව එම කමිටුවේ පිළිගැනීම වී තිබුණි.

5.3.25.3 තවද මේ අනුව 2008 මාර්තු 14 දිනැති අංක IW/PL/04/12 (iv) දරන ලිපිය මගින් වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් ෆරාබ් (FARAB) සමාගම වෙත ශක්‍යතා අධ්‍යයනයක් සඳහා යෝජනා කැඳවීම කර තිබුණි. කෙසේ වුවත් සමාගම විසින් ඒ සඳහා තම යෝජනා ඉදිරිපත් කිරීමේදී ඊට ප්‍රතිචාර දක්වා නොතිබූ බව ඉහත සංදේශයේ සඳහන් කර තිබුණි.

5.3.26 මේ අනුව අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලැබූ එකඟතාවට එළඹීමේ කමිටුව විසින් පහත සඳහන් විකල්ප ක්‍රියාමාර්ග දෙකින් එකක් උපයෝගී කරගෙන කඩිනමින් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම ආරම්භක කිරීමට කටයුතු සම්පාදනය කිරීම සුදුසු බවට යෝජනා කර තිබුණි.

5.3.26.1 වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය විසින් 2008 මාර්තු 14 දිනැති අංක 1w/PL/04/12 (iv) දරන ලිපියෙන් ෆරාබ් (FARAB) සමාගමට ඉදිරිපත් කරන ලද යෝජනා කැඳවීම පරිදි එම ශක්‍යතා අධ්‍යයනය කරගෙන යන ලෙස එම සමාගමෙන් ඉල්ලා සිටීම.

5.3.26.2 ශ්‍රී ලංකා ජනරජයේ ආයතන මගින් දේශීය මුදල් යොදවමින් අවශ්‍ය අවස්ථාවලදී විදේශීය උදේශකවරුන්ගේ සහයද සහිතව එසේ ෆරාබ් (FARAB) සමාගම වෙත ඉදිරිපත් කරන ලද යෝජනා කැඳවීමේ ලිපියේ අන්තර්ගතය පරිදි ශක්‍යතා අධ්‍යයනයන්හී යෙදීමට විධිවිධාන සම්පාදනය කිරීම.

5.3.27 **2008 ජූනි 11 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඉහත සඳහන් 2008 ජූනි 05 දිනැති සංදේශය සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාවරයාගේ නිරීක්ෂණ ලබාගැනීම පිණිස කල් තබා තිබුණි.**

5.3.28 **ඉහත සඳහන් 2008 ජූනි 05 දිනැති සංදේශය සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාවරයාගේ නිරීක්ෂණ යටතේ සංදේශයේ සඳහන් යෝජනා 02 කට අමතරව (ඇමුණුම XXVI) පහත පරිදි 2008 ජූලි 08 දින ඉදිරිපත් කර තිබුණි.**

5.3.28.1 **මුළු පිරිවැය ඇ.එ.ජ. ඩොලර් මිලියන 548 ක උපරිමයකට යටත්වන සේ ව්‍යාපෘති කාර්යයන්, කොන්දේසි සහ අවදානම් තත්ත්වයන් පිළිබඳව ව්‍යාපෘති කොන්ත්‍රාත්කරු වන ඉරාන ජනරජයේ ෆරාබ් (FARAB) සමාගම සමඟ වහාම සාකච්ඡා කොට එකඟතාවයකට පැමිණීම සුදුසු බව යෝජනා කරන අතර ව්‍යාපෘතියේ මූලික සම්බන්ධීකරණ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා විදුලිබල අමාත්‍යාංශයේ ලේකම්, මහමාර්ග අමාත්‍යාංශයේ ලේකම්, පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් හා වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් ඇතුළත් කමිටුවක් භාණ්ඩාගාර ලේකම්වරයාගේ සභාපතීත්වය යටතේ පත්කිරීමටත්, ව්‍යාපෘති කළමනාකරණය හා උපදේශක කටයුතු සඳහා ශ්‍රී ලංකා ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා කාර්යාංශය යොදා ගැනීමටත් යෝජනා කර තිබුණි.**

5.3.29 **ඉහත සඳහන් මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමාගේ නිරීක්ෂණවල දක්වා ඇති ආකාරයට අමාත්‍යාංශය විසින් ක්‍රියාකළ යුතු යැයි 2008 ජූනි මස 17 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය (ඇමුණුම XXVII) කර තිබුණි.**

5.3.30 **වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2008 ජූලි 24 දිනැති අංක අමප/08/1428/356/011 දරන "උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය හා ඉරාන ෆරාබ් සමාගම අතර ඇති කරගත් කොන්ත්‍රාත් ගිවිසුම හා මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය මගින් කිරීමට නියමිත විමර්ශන හා අධ්‍යයන " යන මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් (ඇමුණුම XXVIII) කොන්ත්‍රාත්කාර ෆරාබ් (FARAB) සමාගම විසින්ම මෙම ව්‍යාපෘතියේ ඉංජිනේරු උපදේශකවරුන් ලෙස "මහාබ් ගෝඩ්ස් " (Mahab Godss) උපදේශක**

ඉංජිනේරු සමාගම පත්කරගෙන ඇති අතර එම උපදේශක සමාගම විසින් ඉංජිනේරු වැඩ කොටස් සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය (ඇමුණුම XXIX) තම ශ්‍රී ලංකා හවුල්කරු වශයෙන් යොදා ගැනීමට ප්‍රතිපත්තිමය වශයෙන් එකඟ වී තිබුණු බව දන්වා තිබුණි. (මේ සඳහා ඉරාන ජනරජයේදී ගිවිසුම අත්සන් කිරීමට නියමිතව ඇත).

5.3.30.1 එසේම කොන්ත්‍රාත් අගය නිගමනය කර අනුමත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල වෙත සිය නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද එකඟතාවයට එළඹීමේ කමිටුවට එම නිර්දේශ ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන තාක්ෂණමය තොරතුරු ලබාදීමට කොන්ත්‍රාත්කරුට තවත් කාලයක් ගතවීම හේතුවෙන් ඉරාන ආයෝජන බැංකුවෙන් මුදල් ලබා ගැනීමට මාස 2-3 ක කාලයක් ගත වන බව ද සංදේශයේ සඳහන් කර තිබුණි.

5.3.30.2 තවද ශක්‍යතා අධ්‍යයනය සම්පූර්ණ කර පාරිසරික අනුමැතිය ඉක්මනින් ලබාගැනීම සඳහා, ජල විද්‍යාත්මක මෙන්ම භූගර්භ විද්‍යා තොරතුරු හා විදුම් කටයුතු සම්පූර්ණ කිරීම පූර්ව අවශ්‍යතාවක් බවත්, මෙහි යම් ප්‍රමාදයක් වෙතොත් එය ව්‍යාපෘතිය නිම කිරීමට ගතවන කාලය දීර්ඝ වීමට හේතුවන බවත් සඳහන් කරමින් මේ සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයට අවශ්‍ය මූල්‍යාධාර වශයෙන් රු. මිලියන 200 ක ණය මුදලක්/ අත්තිකාරමක් ලබාදීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කර තිබුණි.

5.3.31 ඉහත සංදේශය සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ (ඇමුණුම XXX) වූයේ ණය මුදල් සැපයීම සඳහා ප්‍රතිපාදන වාර්ෂික ඇස්තමේන්තුව මගින් සලසා නොමැති හෙයින්, සංදේශයේ වූ යෝජනාවට එකඟ විය නොහැකි බවත්, එසේ වුවද ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය රජයේ වාණිජ බැංකුවක් වෙතින් මෙම ව්‍යාපෘතියට අවශ්‍ය අරමුදල් සපයා ගැනිමට කටයුතු කරන්නේනම් ඒ සඳහා අවශ්‍ය ණය ඇපකරය නිකුත් කිරීමට මහා භාණ්ඩාගාරයට කටයුතු කළ හැකි බවය.

5.3.32 මෙම සංදේශය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශය වූයේ (ඇමුණුම XXXI) සම්පූර්ණ ව්‍යාපෘතියේ විෂය පථය දැනගැනීම සහ ව්‍යාපෘතිය ඉක්මනින් ආරම්භ කිරිම සඳහා පිරිවැය අගය කිරීමට පුළුල් ශක්‍යතා අධ්‍යයනයක් සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍ය බැවින් හා එමගින් පිරිවැය ඉහලයාම් මගහැරෙන බැවින් එම යෝජනාව නිර්දේශ කරන බවයි.

5.3.33 2008 අගෝස්තු 27 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එම සංදේශය සලකාබලන ලද අදාල අරමුදල් සම්පාදනය පිළිබඳ කාරණය ජනාධිපතිතුමාගෙන් විමසන ලෙස වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යවරයාගෙන් ඉල්ලා තිබුණි (ඇමුණුම XXXII).

5.3.34 වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය හා ඉරාන ජනරජයේ ෆරාබ් (FARAB) සමාගම අතර 2008 අප්‍රේල් 28 දින අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුම සඳහා පළමු අතිරේකය (Addendum 1) (ඇමුණුම XXXIII) 2009 පෙබරවාරි 22 වන දින අත්සන් කර තිබුණි. එහිදී සංශෝධනයට ලක්ව තිබූ වැදගත් කරුණු පහත පරිදි විය.

5.3.34.1 විදේශ මුදල් වර්ගය එක්සත් ජනපද ඩොලර් විය යුතු බව

5.3.34.2 ගිවිසුම බලපවත්වන නීතිය ස්විස්ටර්ලන්ත නීතිය නොව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජ නීතිය බව

5.3.34.3 දේපල හානි හා පුද්ගල අනතුරු සඳහා රක්ෂණය සිදුවීමක් සඳහා සීමාවන් පුද්ගලයින් සඳහා එක්සත් ජනපද ඩොලර් 50,000 කට හා භෞතික දේපළ සඳහා එක්සත් ජනපද ඩොලර් 500,000 කට නොඅඩු විය යුතු බව

5.3.34.4 බේරුම්කරණ කටයුතු පාලනය කළ යුත්තේ ICC නොව UNCITRAL බව

5.3.34.5 බේරුම්කරණ ස්ථානය ස්විස්ටර්ලන්තයේ ජිනීවා නොව සිංගප්පූරුව වන බව

5.3.34.6 කොන්ත්‍රාත් මුදල එක්සත් ජනපද ඩොලර් 548,150,000 නොව එක්සත් ජනපද ඩොලර් 529,059,198 ක් වන බව

5.3.35 2008 අප්‍රේල් 28 දින ඉරාන අපනයන සංවර්ධන බැංකුව සමඟ අත්සන් කරන ලද අංක 870/L/LKA/01 දරන මූල්‍ය ගිවිසුම සඳහා 2009 මාර්තු 24 දින නීතිපතිවරයා විසින් (ඇමුණුම XXXIV) සහතික කර තිබුණි.

5.3.36 මෙම ව්‍යාපෘතියේ සමාරම්භක උත්සවය සඳහා වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් 2008 සැප්තැම්බර් 30 දින වන විට රු. 33,242,012 ක වියදමක් දරා තිබුණි. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2008 ජූනි 25 දිනැති අංක:

BD/356/65335/NP දරන ලිපිය මඟින් මෙම උත්සවය සඳහා ඉතා අධික වියදමක් දරා ඇති බවත්, මින් ඉදිරියට මෙවැනි උත්සව පැවැත්වීමේදී මනා වියදම් පාලනයක් කළයුතු බවට අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා තිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව මෙම උත්සවය සඳහා දරන ලද වියදම් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

වියදම් පිළිබඳ විස්තර	මුදල (රුපියල්)
උමා ඔය සමාරම්භක උත්සවයට ස්මාරක කුළුණු දෙකක් සැකසීම, සිහිවටන ඵලකය සැකසීම, නාම පුවරුවක් සැකසීම හා කොඩි කණු දෙකක් සකස් කිරීම	**4,310,500**
සමාරම්භක උත්සවයේ ප්‍රචාරක දැන්වීම් පුවරු 18 ක් (20x10 ප්‍රමාණයේ) සකස් කර සවිකිරීම	**3,933,000**
සමාරම්භක උත්සවයට පැමිණෙන සම්භාවනීය අමුත්තන්ට සංග්‍රහ කිරීම, වායුසමීකරණ කාමර සැකසීම හා ඔවුන්ට ආහාර පාන සැපයීම	**2,762,813**
සමාරම්භක උළෙල පිළිබඳ දැනුවත් කිරීමට පුවත්පත් හතක දැන්වීම් පලකිරීම හා නිවේදකයින් හතර දෙනෙකුට නිවේදන කටයුතු සඳහා මාධ්‍ය උපදේශන කටයුතු	**2,590,622**
සමාරම්භක උළෙලට ඩිජිටල් බැනර් 50 ක්, කොඩි 400 ක්, ආරාධනා පත් හා ලියුම් කවර 2,250 ක්, පෝස්ටර් 53,000 ක්, පොත් 5,000 ක් ලබාගැනීම, ධජ පතාක 250 ක් ඊට අවශ්‍ය කණු හා පොත් ඡායා පිටපත් කිරීම ඇතුළු වියදම්	**2,347,044**
සමාරම්භක උත්සවය සඳහා තොරණ තුනක් සාදා සවිකිරීමේ වියදම	**2,139,000**
සමාරම්භක උළෙලට වේදිකාව සැකසීම, පුටු 3,430 ක් හා පුටු කවර 400 ක් සැපයීම, 30x20 ප්‍රමාණයේ වේදිකාවක් සැපයීම හා වේදිකාවල අලංකරණ කටයුතු කිරීම	**1,818,800**
සමාරම්භක උළෙලේ ශබ්ද විකාශන යන්ත්‍ර ලබාගැනීම	**1,289,420**

සමාරම්භක උත්සවය සඳහා කලා නිර්මාණ වෙනුවෙන් සංස්කෘතික ප්‍රසංගය, තේමා ගීතය සැකැසීම, පටිගත කිරීම, ගායක ගායිකාවන්ට ගෙවීම, පොතෙහි ආර්ට් වර්ක් එක ඇතුළු අනෙකුත් කලා නිර්මාණ වෙනුවෙන් දැරූ වියදම්	**1,113,222**
සමාරම්භක උත්සවය සඳහා පාසැල් ළමුන් ප්‍රවාහනය කිරීම, ඉන්ධන හා වාහන කුලී ගෙවීම	**1,025,490**
සමාරම්භක උත්සවයේ වැඩසටහන් කළමනාකරණය වෙනුවෙන් බන්දුල නානායක්කාරවසම් මහතාට ගෙවීම	**874,000**
එකතුව	**33,242,012**

5.3.37 වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය විසින් 2008 ජූලි 09 දින පරිසර අනුමැතිය ලබා ගැනීම සඳහා අයදුම්පතක් (ඇමුණුම XXXV) මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කර තිබුණි. ඒ සඳහා 2008 ඔක්තෝම්බර් 03 දින විෂයය නිර්ණේය (Terms of Reference) අධිකාරිය විසින් ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව අවසාන පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව 2010 නොවැම්බර් 30 දින වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කර තිබුණි. පරිසර අධිකාරිය විසින් පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයන් සැලකිල්ලට ගෙන විවිධ කොන්දේසි පනවමින් අධිකාරිය විසින් ව්‍යාපෘතිය සඳහා වර්ෂ 03 කට 2011 අප්‍රේල් 12 දිනැති අංක 08/EIA/Water/01/2008 දරන ලිපියෙන් (ඇමුණුම XXXVI) පාරිසරික අනුමැතිය ලබා දී තිබුණි. මෙම පාරිසරික අනුමැති කාලසීමාව නැවතත් 2014 සැප්තැම්බර් 02 දින (ඇමුණුම XXXVII) හා 2017 ජූලි 21 දින (ඇමුණුම XXXVIII) අවස්ථා දෙකකදී දීර්ඝ කර තිබුණි. ඒ අනුව 2011 අප්‍රේල් 12 දින වර්ෂ තුනකට ලබාදුන් අනුමැතිය 2020 අප්‍රේල් 12 දින දක්වා එනම් වර්ෂ 09 ක් දක්වා දීර්ඝ කර තිබුණි.

5.3.38 ඉහත සඳහන් පාරිසරික අනුමැතිය සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය මහවැලි උපදේශක සේවා කාර්යාංශය වෙත කොන්ත්‍රාත්තුව ලබා දී තිබූ අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට එම වාර්තාව සකස් කිරීමට භාරදී තිබුණි. එම කාර්යය සඳහා මහවැලි උපදේශක සේවා කාර්යාංශය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය යෝජනාව (ඇමුණුම XXXIX) පහත දැක්වේ.

විස්තරය	මුදල රු.
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ගාස්තුව	**12,317,958**
තාක්ෂණික සහයක කණ්ඩායම්, තාක්ෂණික වාර්තාව ඇගයීමට හා ප්‍රවාහන නවාතැන් හා සංයුක්ත දීමනා යනාදිය	**11,892,150**
උපකරණ සැපයීම	**800,000**
අසම්භාව්‍ය වියදම (15%)	**3,751,516**
උප එකතුව	**28,761,624**
පොදු කාර්යය (20%)	**5,752,325**
ලාභය (15%)	**4,314,244**
එකතු කළ අගය මත බද්ද (12%)	**4,160,162**
රඳවා ගැනීමේ බදු (1%)	**388,282**
මුළු එකතුව	**43,376,638**

5.3.39 වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යවරයා විසින් **2008** දෙසැම්බර් **08** දිනැති අංක අමප**/08/2257/356/002**-V දරන "උමාඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය" යන මැයෙන් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් (ඇමුණුම XL) පහත නිරීක්ෂණ දක්වා තිබුණි.

5.3.39.1 ඉරාන අපනයන සංවර්ධන බැංකුවෙන් සම්මත කරන ලද වගකීම් බැඳීම අනුව, සහනදායී පොළී අනුපාතයක් සහිතව මෙම ව්‍යාපෘතිය සඳහා ලැබී ඇත්තේ එක්සත් ජනපද ඩොලර් **450,000,000** උපරිමයකට යටත්ව, කොන්ත්‍රාත් අගයෙන් **85%** ප්‍රමාණයක් පමණක් වන අතර එමනිසා ශ්‍රී ලංකා ජනරජයට වාසි සහගත ලෙස සම්පූර්ණ පරිදි ආධාර ප්‍රමාණය මෙම ව්‍යාපෘතිය තුළින් ලබාගැනීමට නම් එක්සත් ජනපද ඩොලර් **530,000,000** ක ප්‍රමාණයකට සමාන වන සේ කොන්ත්‍රාත් අගය නිගමනය කළයුතු බව

5.3.39.2 ෆරාබ් සමාගම සමඟ **2008** අප්‍රේල් **28** දින අත්සන් කර ඇති කොන්ත්‍රාත් ගිවිසුම පරිදි, ඇගයීමට ලක්කොට එකඟතාවයට පැමිණ නිර්දේශ කොට ඇති කොන්ත්‍රාත් ගත මුදල එක්සත් ජනපද ඩොලර් **514,059,198** ක් වන අතර නිර්දේශ කොටඇති ගෙවීමේ ක්‍රමය, ගිවිසුමෙහි සඳහන් ගෙවීමේ කාණ්ඩ මෙම අගයට සමානුපාතික ලෙස යළි සකස් කිරීමෙන් ගණනය කරන බව

5.3.39.3 මෙම මුදල් ප්‍රමාණය තුළින් ඉඩකඩ සැලසෙන්නේ ගිවිසුමෙහි සඳහන් නිශ්චිත වැඩ කොටස් ආවරණය කිරීම සඳහා පමණක් බව

5.3.39.4 මෙය ශ්‍රී ලංකා ජනරජයට කිසිදු මූල්‍යමය අවධානමක් නොමැති නිශ්චිත වූ මූල්‍ය අගයක් සහිත ඉංජිනේරු ප්‍රසම්පාදන-ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත් ගිවිසුමක් බැවින් ව්‍යාපෘතියේ සම්පූර්ණ ඉදිකිරීම් කාලසීමාව සඳහාම කොන්ත්‍රාත් ගිවිසුම් ගත මුදල වලංගු වන බව

5.3.39.5 ව්‍යාපෘතියට අවශ්‍යයන්ම ඇතුළත් විය යුතු පහත අත්‍යාවශ්‍ය වැඩ කොටස් ෆරාබ් සමාගම විසින් ඉදිරිපත් කර ඇති මූල්‍යමය යෝජනාව තුළින් ආවරණය නොකරන බව

a. පහළ ප්‍රදේශවල සංවර්ධන (වාරිමාර්ග) කටයුතු
b. ඉහළ ධාරා ප්‍රදේශ සංරක්ෂණය
c. ව්‍යාපෘතිය නිසා අවතැන්වන්නන් නැවත පදිංචි කර වීම
d. පාරිසරික අධ්‍යයන
e. නගර සංවර්ධනය

5.3.39.6 ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් ඉහත සඳහන් වැඩ කොටස් සමගාමීව ආරම්භ කිරීමට අපොහොසත් වුවහොත් ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු දිගටම කරගෙන යාම හෝ බලාපොරොත්තු වන ප්‍රතිලාභ ලැබීම සිදු නොවන නිසා සාර්ථක අන්දමින් එම ඉතිරි වැඩ කොටස ආරම්භ කිරීම සඳහා අරමුදල් ලබාගත යුතුව තිබේ. රජයට මේ සඳහා අරමුදල් ලබා ගැනීමට ඇති පහසුකම් ගැන සලකා බලන විට, ව්‍යාපෘතිය සඳහා ලබාගත හැකි සම්පූර්ණ විදේශාධාර ප්‍රමාණය වන එක්සත් ජනපද ඩොලර් **450,000,000** තුළින්ම එය ලබා ගැනීමට නම්, කොන්ත්‍රාත් ගිවිසුමේ සේවායෝජකයාගේ අවශ්‍යතා වලට එම ඉතිරි වැඩ කොටස ඇතුළත් කර කොන්ත්‍රාත් අගය තවත් එක්සත් ජනපද ඩොලර් **15,000,000** ක අතිරේක මුදලකින් පරිපූර්ණ කොට එක්සත් ජනපද ඩොලර් **529,059,198** දක්වා වර්ධනය කළ යුතු බව

5.3.39.7 කිරිඳිඹය පහළ ගංගාධාර ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා තවත් අමතර ප්‍රතිපාදන අවශ්‍ය වුවහොත් එය ශ්‍රී ලංකා ජනරජයේ අරමුදල් වලින් දැරිය යුතු බව

5.3.39.8 කොන්ත්‍රාත්කරු විසින් ඉහත සඳහන් අතිරේක මුදල් ප්‍රමාණය ඉතිරි වැඩ කොටස් ආවරණය කිරීමට පමණක් වෙන් කොට තබාගත යුතු බව

5.3.39.9 එක්සත් ජනපද ඩොලර් මිලියන **514,059,198** ක් වූ කොන්ත්‍රාත් මුදල් ප්‍රමාණය තුළින් ගිවිසගෙන ඇති පරිදි ව්‍යාපෘතිය සඳහා වන එහි අඩංගු වූ වැඩ කොටස් සම්පූර්ණ කිරීමට ඇති බැඳීම් වලට අගතියක් නොවන පරිදි ඉහත සඳහන් වැඩ පිළිවෙල සඳහා පවත්නා කොන්ත්‍රාත් ගිවිසුමෙහි පරිශිෂ්ඨයක් ඇතුළත් කළ යුතු බව

5.3.40 ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන පහත සඳහන් ක්‍රියාමාර්ග සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කර තිබුණි.

5.3.40.1 අමාත්‍ය මණ්ඩලයෙන් පත් කරනු ලැබූ එකඟතාවයට එළඹීමේ කමිටු නිර්දේශය පරිදි, මෙම නිශ්චිත අගයක් සහිත කොන්ත්‍රාත් මුදල එක්සත් ජනපද ඩොලර් **514,059,198** සේ පිළිගැනීම හා ගෙවීමේ ක්‍රමය සඳහා ගිවිසුමෙහි සඳහන් ගෙවීම් කාණ්ඩ එම අගයට සමානුපාතික වන සේ සකස් කිරීම.

5.3.40.2 2008 අප්‍රේල් **28** දින ඇති කරගන්නා ලද මූල්‍යමය ගිවිසුම පරිදි ඉරාන අයෝජන බැංකුවෙන් සහනදායක පදනම මත සම්මත කරන ලද වගකීම බැඳීම් වලින් ආවරණය වන මුළු මුදල් ප්‍රමාණය වන එක්සත් ජනපද ඩොලර් **450,000,000** ප්‍රයෝජනයට ගනු පිණිස එක්සත් ජනපද ඩොලර් **15,000,000** ක අවස්ථානුරූප මුදල් ප්‍රමාණයක්ද අඩංගු කොට සම්පූර්ණ කොන්ත්‍රාත් අගය එක්සත් ජනපද ඩොලර් **529,059,158** සේ පිළිගෙන ශ්‍රී ලංකා ජනරජය විසින් පහත සඳහන් කොන්දේසි වලට අනුකූලව එම අවස්ථානුරූප මුදල් ප්‍රමාණය ප්‍රයෝජනයට ගැනීම.

5.3.40.3 සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යනයකින් පසු ආවරණය කළ යුතු වැඩ ප්‍රමාණයේ වටිනාකමෙහි වර්ධනයක් පෙන්නුම් කරන්නේ නම් එය ආවරණය කිරීම.

5.3.40.4 ඉහත නිරීක්ෂණවල විශේෂිත වශයෙන් සඳහන් කොට ඇති අමතර වැඩ කොටස් එම ඡේදයෙහි සඳහන් නියාමකයන්ට අනුකූලව කරගෙන යෑම.

5.3.40.5 සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනයකට පසු ආවරණය කළ යුතු වැඩ ප්‍රමාණයේ වටිනාකමේ අඩුවීමක් ඇත්නම්, එසේ ඉතිරිවන මුදල ඉහත සඳහන් ii. (ආ) උපඡේදයේ සඳහන් අමතර වැඩ කොටස් සඳහා යොදාගැනීම.

5.3.40.6 අමාත්‍ය මණ්ඩලය මගින් පත්කරනු ලැබූ එකඟතාවට එළඹීමේ කමිටුව හා ව්‍යාපෘති කමිටුව විසින් කොන්ත්‍රාත්කරු වන ෆරාබි සමාගම සමඟ එකඟතාවට එළඹීමේදී ඇතිකර ගන්නා ලද සම්මුතීන් ඇතුළුව, ඉහත සඳහන් කරුණුද පදනම් කොට ගනිමින් වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය හා එම ෆරාබි සමාගම අතර ඇතිකර ගන්නා ලද ගිවිසුමට පරිශිෂ්ඨයක් එක්කිරීම.

5.3.41 ඉහත සඳහන් සංදේශයට **2008** දෙසැම්බර් **18** දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් කරුණු වලට අනුමැතිය (ඇමුණුම XLI) ලබා දී තිබුණි.

5.3.41.1 අමාත්‍ය මණ්ඩලය මගින් පත්කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව විසින් නිර්දේශ කරන ලද පරිදි නිශ්චිත කොන්ත්‍රාත් මුදල එක්සත් ජනපද ඩොලර් **514,059,198** වශයෙන් පිළිගැනීම හා යෝජිත ගෙවීම් කිරීමේ ක්‍රමවේදය වෙනුවන්,

5.3.41.2 යෝජිත පරිදි, මුළු කොන්ත්‍රාත් මුදල එ.ජ.ඩොලර් **529,059,198** ක් වන පරිදි, එක්සත් ජනපද ඩොලර් **15,000,000** ක අවස්ථානුරූපී මුදලක් ඇතුළත් කිරීම

5.3.41.3 සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමෙන් අනතුරුව, විෂය පථය අඩු කිරීම හේතුවෙන් යම් ඉතිරියක් වෙතොත්, ඒවා සංදේශයේ **4.2** ඡේදයේ (ආ) යටතේ විස්තර කර ඇති වැඩ සඳහා උපයෝගි කර ගැනීම, සහ

5.3.41.4 යෝජිත පරිදි, වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය සහ ඉරානයේ ෆරාබි එනර්ජි ඇන්ඩ් වෝටර් ප්‍රොජෙක්ට්ස් සමාගම විසින් කොන්ත්‍රාත් ගිවිසුමට පරිශිෂ්ඨයක් අත්සන් තැබීම.

5.3.42 2009 පෙබරවාරි 22 දින අත්සන් කරන ලද පළමු සංශෝධනය සඳහා නීතිපතිතුමා විසින් 2009 පෙබරවාරි 17 දින (ඇමුණුම XLII) නිරීක්ෂණ ලබාදී තිබුණි.

5.3.43 වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබූ 2009 ජනවාරි 29 දිනැති අංක අමප/09/0185/356/005 දරන "උමාඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය - ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය සඳහා කාර්ය මණ්ඩලය පත් කිරීම" යන මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් (ඇමුණුම XLIII) නිශ්චිත තැනැත්තන් ව්‍යාපෘති අධ්‍යක්ෂ හා නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස බඳවාගැනීමට අනුමැතිය ඉල්ලා තිබූ අතර මේ සඳහා විවෘත ඉල්ලුම්පත් කැඳවීම වැනි ක්‍රියාමාර්ගයන් අනුගමනය කිරීමට පිවිසුනහොත් කාලය ගතවීම හා වෙනත් සංකීර්ණතා ඇතිවිය හැකි බවද සංදේශයේ සඳහන් කර තිබුණි.

5.3.44 අනතුරුව එම සංදේශය සඳහා 2009 පෙබරවාරි 18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී (ඇමුණුම XLIV) තිබුණි.

5.3.45 2008 අප්‍රේල් 28 දින අත්සන් කළ අංක 870/L/LKA/01 දරන මූල්‍ය ගිවිසුම 2009 මාර්තු 09 දින සංශෝධනය කර තිබුණි. (ඇමුණුම XLV)

5.3.46 වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබූ 2010 ජූලි 29 දිනැති අංක අමප/10/1744/413/017 දරන "උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය- මුළු පිරිවැය ඇස්තමේන්තුව" යන මැයෙන් වූ සංදේශයෙන් (ඇමුණුම XLVI) මගින් ව්‍යාපෘතිය සඳහා වූ පහත සඳහන් මුළු පිරිවැය ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබුණි.

මූලස්ථායී වැඩ	

EPC කොන්ත්‍රාත් මුදල	එ.ජ.ඩො.529,059,198
EDBI හරහා විදේශ ණය	එ.ජ.ඩො.450,000,000
ශ්‍රී ලංකා රජය මගින් ඉතිරිය	එ.ජ.ඩො.79,059,198
සෙසු පිරිවැය	

ඉඩම් අත්පත්කර ගැනීම්, නැවත පදිංචි කිරීම් හා ඊට සම්බන්ධ ඇස්තමේන්තු පිරිවැය	රු.800,000,000

පරිසර බලපෑම් අවම කිරීමට යෝජිත නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා	රු.400,000,000
ගාස්තු හා බදු	රු.1,700,000,000
දේශීය බැංකු ගාස්තු	රු.180,000,000
ව්‍යාපෘති කළමනාකරණය	රු.3,041,750,000

	රු.6,121,750,000

යටිගං පෙදෙස සංවර්ධනය

කිරිඳි ඔය නිම්නයේ කෘෂිකාර්මික ඉඩම් සංවර්ධන	රු.6,450,000,000
ඉඩම් අත්පත් කර ගැනීම්, නැවත පදිංචි කිරීම් හා යටිතල පහසුකම් සැපයීම	රු.1,612,500,000
සැළසුම් කිරීම, ඉදිකිරීම් සුපරීක්ෂාව, ව්‍යාපෘති කළමනාකරණය හා බදු හා ගාස්තු ඇළත් අනෙකුත් වියදම්	රු.1,290,000,000

	රු.9,352,500,000
	රු.15,474,250,000

ඒ අනුව ව්‍යාපෘතිය සාර්ථකව ඉදිකර අවසන් කිරීම සඳහා ශ්‍රී ලංකා රුපියල් **15,474,250,000** කින් හා එක්සත් ජනපද ඩොලර් **529,059,198** කින් සමන්විත මුළු පිරිවැය ඇස්තමේන්තුව සඳහා ද , ශ්‍රී ලංකාණ්ඩුව මගින් රුපියල් **15,474,250,000** කින් හා එක්සත් ජනපද ඩොලර් **79,059,198** කින් සමන්විත මුදලක් වැය දැරීම සඳහා ද අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කර තිබුණි.

5.3.47 තවද ඊට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා රජයෙන් වැයකරන රුපියල් **15,474,250,000** ක මුදල යොදාගනිමින් සිදුකිරීමට අපේක්ෂිත කාර්යයන් පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ඇගයීම සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බවට නිරීක්ෂණය (ඇමුණුම XLVII) කර තිබුණි.

5.3.48 2010 ජූලි 29 දිනැති සංදේශය සඳහා ඉහත මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සලකා බලා 2010 අගෝස්තු 11 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය (ඇමුණුම XLVIII) ලබාදී තිබුණි.

5.3.49 ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ දේශීය අරමුදල් උපයෝගී කර ගනිමින් ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන් පිළිබඳ සවිස්තරාත්මක වාර්තාව (ඇමුණුම XLIX) ඉදිරිපත් කර තිබුණි.

5.3.50 වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කර තිබූ 2010 ඔක්තෝබර් 18 දිනැති අංක අමප/10/2536/413/017-1 දරන (ඇමුණුම L) "උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය" - සෙසු පිරිවැය හා යටිගං පෙදෙස සංවර්ධනය ඇස්තමේන්තුව නැමැති සංදේශයෙන් පහත කරුණු සඳහා අනුමැතිය අපේක්ෂා කර තිබුණි.

5.3.50.1 දේශීය අරමුදල් යොදාගනිමින් ඉටුකිරීමට අපේක්ෂිත සෙසු පිරිවැය යටතේ වූ වැඩ කොටස් හා යටිගං පෙදෙස සංවර්ධන කටයුතු සඳහා රු.15,474,250,000 ක ඇස්තමේන්තුව සඳහා හා

5.3.50.2 එකී ඇස්තමේන්තුව අනුව මධ්‍යකාලීන වියදම් රාමුව තුළ 2011 – 2013 යටතේ පහත සඳහන් අයුරින් වියදම් දැරීම සඳහා

වර්ෂය	2011	2012	2013
	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන
ප්‍රතිපාදනය	2,664	3,988	5,327

5.3.50.3 තවද එම සංදේශයෙන් පහත කරුණු ද දක්වා තිබුණි.

5.3.50.3.1 සෙසු පිරිවැය යටතේ වූ වැඩ කොටස් හා යටිගං පෙදෙස සංවර්ධන කටයුතු සඳහා රු.15,474,250,000 ක වටිනාකමකින් යුතු වැඩ සඳහා ඉදිරිපත් කරන ලද සවිස්තරාත්මක වාර්තාව සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙන් ලද ප්‍රතිචාරයට අනුව ව්‍යාපෘතියේ ඉදිරි සැළසුම් කටයුතු ආරම්භ කර ඇති බව

5.3.50.3.2 ප්‍රධාන සැපයුම් ඇළ මාර්ග වලට ග්‍රාමීය වැව් සම්බන්ධ කරන නව වාරිමාර්ග පද්ධතියක් ඇතුළත් බව

5.3.51 ඉහත සඳහන් සංදේශයට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් (ඇමුණුම LI) සංදේශයේ සඳහන් යෝජනා සඳහා එකඟ වන අතර කෙසේවුවත් මුළු පිරිවැය ඇස්තමේන්තුව ඇතුළත, දේශීය අරමුදල් යොදා ගනිමින්, ව්‍යාපෘතිය ඉටු කිරීමට අපේක්ෂිත සෙසු පිරිවැය යටතේ වූ වැඩකොටස් හා යටිගං පෙදෙස සංවර්ධන කටයුතු සඳහා, අදාළ ප්‍රගතිය සැලකිල්ලට ගනිමින් මධ්‍යකාලීන වියදම් රාමුව යටතේ ප්‍රතිපාදන ලබා දීමට එකඟ වන බවත් දන්වා තිබුණි.

5.3.52 **5.3.50** ඡේදයේ සඳහන් **2010** ඔක්තෝම්බර් **18** දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණවල දක්වා ඇති ආකාරයට කටයුතු කිරීමට යටත්ව **2010** ඔක්තෝබර් **27** දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය (ඇමුණුම LII) ලබාදී තිබුණි.

5.3.53 වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබූ **2012** පෙබරවාරි **16** දිනැති අංක අමප/**12/0247/508/004** දරන "ව්‍යාපෘති අධ්‍යක්ෂකට සහාය වීම සඳහා උපදේශකයින් පත් කිරීම" "උමා ඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය" යන මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් (ඇමුණුම LIII) උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ වැඩ බිම් නියෝජිත ඉංජිනේරු වශයෙන් කටයුතු කිරීම සඳහා අන්තර්ජාතික තරඟකාරී ලංසු කැඳවීම් ක්‍රමවේදය අනුගමනය කරමින් අන්තර්ජාතික හෝ දේශීය උපදේශන සේවා ආයතනයකින් පහත දැක්වෙන පරිදි සේවා ලබාගැනීමට, අනුමැතිය ඉල්ලා තිබුණි.

5.3.53.1 ප්‍රධාන තනතුරු එනම් කණ්ඩායම් නායක, නේවාසික ඉංජිනේරු (සිවිල්), නේවාසික ඉංජිනේරු (විදුලි යාන්ත්‍රික), නේවාසික ඉංජිනේරු (ජල - යාන්ත්‍රික) වැනි තනතුරු සඳහා උපදේශන සේවා ලබා ගැනීම.

5.3.53.2 උපදේශන සේවා ආයතනයට සහය වීම සඳහා විදුලි යාන්ත්‍රික, ජල යාන්ත්‍රික වැනි ක්ෂේත්‍රවල තාක්ෂණික කාර්ය මණ්ඩලය ලංකා විදුලිබල මණ්ඩලය ලබා ගැනීම.

5.3.53.3 සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය තාක්ෂණික කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය, අමාත්‍යාංශය තුළ ඇති ආයතනවල සිටින සුදුසුකම්ලත් පුහුණු කාර්ය මණ්ඩලයෙන් ලබාගත නොහැකිනම් දේශීයව ලබා ගැනීම.

5.3.53.4 උපදේශ කාර්යමණ්ඩලය සඳහා අවශ්‍ය අවශේෂ කාර්ය මණ්ඩලය හා වෙනත් අවශ්‍යතා සඳහා ඇවැසි කාර්ය මණ්ඩලය, අමාත්‍යාංශයේ වෙනත් ආයතනවල සුදුසුකම්ලත් පළපුරුදු කාර්ය මණ්ඩලයෙන් සපුරාගත නොහැකිනම් දේශීයව ලබා ගැනීම.

5.3.54 මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් ව්‍යාපෘතිය සඳහා දැනට අනුමත වැය ඇස්තමේන්තුවේ ව්‍යාපෘති කළමනාකරණය උපශීර්ෂය යටතේ වෙන්කර ඇති ප්‍රතිපාදන සීමාව තුළ බඳවා ගැනීමට එකඟ වූ බව (ඇමුණුම LIV) නිරීක්ෂණය කර තිබුණි.

5.3.55 ඉහත සංදේශය 2012 මාර්තු 14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සලකා බලන ලදුව පහත පරිදි අනුමැතිය (ඇමුණුම LV) ලබා දී තිබුණි.

5.3.55.1 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාර, සංදේශයේ (I), (II), (III) හා (IV) යෝජනාවල සඳහන් කාර්ය මණ්ඩලය බඳවාගැනීමේ හැකියාව පරීක්ෂා කර බලන ලෙස වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත උපදෙස් දීම හෝ

5.3.56 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාර තෝරාගනු ලබන උපදේශක ආයතනයක් මගින් සංදේශයේ (I), (II), (III) හා (IV) යෝජනාවල සඳහන් කාර්ය මණ්ඩලයේ අවශ්‍ය සේවය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩලය වෙත යෝජනා කර තිබුණි. බඳවාගන්නා ලද කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර (ඇමුණුම LVI) හි දැක්වේ.

5.3.57 වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබූ 2012 මැයි 30 දිනැති අංක අමප/12/0747/508/018 දරන "උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියට අදාල ඉදි කිරීම් සඳහා දේපල අත්පත් කර ගැනීම හේතුවෙන් බලපෑමට පත්වන පවුල් සඳහා සහන සැලසීම" යන මැයෙන් වූ සංදේශයෙන් (ඇමුණුම LVII) පහත කරුණු සවිස්තරාත්මකව ඉදිරිපත් කරමින් සංදේශයේ 04 වන ඡේදයේ සඳහන් පහත යෝජනා වලට අනුමැතිය ඉල්ලා තිබුණි. එම යෝජනා පහත පරිදි විය.

5.3.58 මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නිසා බලපෑමට ලක්වන ජනතාවට සිදුවන ආර්ථික හා සමාජයීය දුෂ්කරතා මගහැරවීමට අදාලව කටයුතු කළ යුතුව ඇති බවත්, ඒ අනුව, බලපෑමට ලක්වන ජනතාවගේ පදිංචිය සඳහා ඉඩම් ලබාදීම හා ඉවත් කරනු ලබන නිවාස හා ගොඩනැගිලිවලට ප්‍රතිස්ථානගත පිරිවැයත්, ඉඩම්වල වගාවන් සඳහා සංවර්ධිත වටිනාකමත් ප්‍රමාදයකින් තොරව ලබාදීමට යෝජනා කරනු ලැබ ඇති බව
මේ අනුව, ඉඩම් අත්කර ගැනීමේදී හා නැවත පදිංචි කිරීමේ කටයුතු ඉටුකිරීමේදී පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටු කළ යුතුව ඇති බව.

5.3.58.1 අත්කර ගන්නා ඉඩම් සඳහා වර්තමාන වෙළඳපළ වටිනාකම පාදක කරගත් වන්දි මුදලක් කඩිනමින් ගෙවීමට කටයුතු කිරීම.

5.3.58.2 ඉවත් කරනු ලබන නිවාස හා ඒ ආශ්‍රිත ගොඩනැගිලි සඳහා ප්‍රතිස්ථානගත පිරිවැය කඩිනමින් ලබාදීම.

5.3.58.3 ඉඩම්වල වගාවන් සඳහා සංවර්ධිත වටිනාකම කඩිනමින් ලබාදීම.

5.3.58.4 නැවත පදිංචි කිරීම සඳහා සුදුසු ඉඩම් කොටස් හඳුනාගෙන, එම ඉඩම් රජයට පවරා ගැනීම හා ඊට අදාල වන්දි ගෙවීම් කඩිනම් කිරීම.

5.3.59 මෙම ඉඩම් අත්කර ගැනීමේ කටයුතු කිරීමේදී අදාල තක්සේරු නිර්ණය කිරීම කඩිනම් කිරීමට කොට්ඨාශ මට්ටමේ කමිටුවක්ද, එම කමිටුව විසින් තීරණය කරනු ලබන තක්සේරුගත පිරිවැයට හෝ සංවර්ධිත වටිනාකමට අදාල වන්දි මුදල පිළිබඳ යමෙකු සෑහීමකට පත් නොවන්නේ නම්, ඔහුට/ ඇයට තම අභියාචනයක් ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි දිස්ත්‍රික්ක මට්ටමේ අභියාචනා කමිටුවක් වශයෙන් මට්ටම් දෙකින් යුතු පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත කමිටු දෙකක් මගින් ක්‍රියාකරමින්, යෝජිත ඉඩම් අත්කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට යෝජනා කළ බව

5.3.59.1 තක්සේරු කිරීමේ කමිටුව

- අදාල බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් - කමිටු සභාපති
- පළාත් තක්සේරු හෝ නියෝජිතයෙක්
- දිස්ත්‍රික් මැනුම් අධිකාරී හෝ නියෝජිතයෙක්
- උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘති මගින් නම්කරන නියෝජිතයෙක්
- ගොවිජන සේවා ප්‍රාදේශීය සංවර්ධන නිලධාරී

5.3.59.2 අභියාචනා කමිටුව

- අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් - කමිටු සභාපති
- ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරී
- ප්‍රධාන තක්සේරුකරුගේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයෙක්
- ගොවිජන සේවා සහකාර කොමසාරිස්
- උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය මගින් නම්කරනු ලබන ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවරයෙක්

ඉහත සඳහන් කමිටුවල සාමාජිකයින් සඳහා එක් ඉඩම් කැබැල්ලක් වෙනුවෙන් එක් සාමාජිකයෙකුට රු. 250 බැගින්ද, එම කමිටුවට අදාල රාජකාරීන්හී නිරතවන විෂය ලිපිකරුට එක් ඉඩම් කැබැල්ලක් වෙනුවෙන් රු.100 ක් බැගින්ද දීමනාවක් ගෙවීමට යෝජනා කළ බව

5.3.60 ඒ අනුව, උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් හේතුවෙන් බලපෑමට ලක්වන පවුල් සඳහා පහත සඳහන් සහන ලබාදීමට යෝජනා කළ බව

5.3.60.1 මූලස්ථායී ඉදිකිරීම් (Head Works) නිසා නිවාස අහිමිවන පවුල් වලින් රජයට අත්කර ගන්නා ඉඩම් ප්‍රමාණය මෙන්ම ඉහළ නිම්නයේ පවතින ඉඩම් හිඟයද සැලකිල්ලට ගෙන ඌව පරණගම - මොරගොල්ල වත්ත, වැලිමඩ - ඩයිබරා වතුයායෙන් කොටසක් සහ මිරහවත්ත වතුයාය යන ස්ථානවලින් උපලේඛනයේ විස්තර කර ඇති පරිදි නිවසක් තනාගැනීමට පර්චස් 10 සිට පර්චස් 40 ක් දක්වා ඉඩම් කොටසක් නිවාස ඉදිකිරීම් සඳහා පමණක් ලබාදීම,

5.3.60.2 පහළ නිම්නයේ ඉදිකිරීම් (Down Stream Development) නිසා බලපෑමට ලක්වන පුද්ගලයින්ගේ අභිමතය පරිදි වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ නයිගල් ආර, තෙලුල්ල, අළුත්වෙල හා සියඹලාගුණේ යන ස්ථානවලින් උපලේඛනයේ විස්තර කර ඇති පරිදි නිවසක් තනාගැනීමට පර්චස් 10 සිට පර්චස් 40 ක් දක්වා ඉඩම් කොටසක් නිවාස ඉදිකිරිම සඳහා පමණක් ලබාදීම.

5.3.60.3 ඉහළ නිම්නයේ සහ පහළ නිම්නයේ ගොවිබිම අහිමි පවුල් සඳහා අඳ ගොවියන්ද ඇතුළුව උපරිමය ගොඩ සහ මඩ ඉඩම් අක්කර 02 ක් පහළ නිම්නයෙන් ලබාදීම,

5.3.60.4 මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම පවත්වන ලද සමාජ/ආර්ථික සමීක්ෂණය මගින් අනාවරණය වී ඇති අනුපවුල් සහ දීර්ඝ කාලීන කුළී නිවැසියන් සඳහා පර්චස් 10 බැගින් ඉඩම් කොටස් ලබාදීමටද, ව්‍යාපාරික ස්ථාන අහිමිවන්නන් සඳහා ඌව පළාත් සභාව තුළ ක්‍රියාත්මක වන අවම ඉඩම් ඒකකයට යටත්ව වාණිජමය ඉඩම් ලබාදීම,

5.3.60.5 1995 ජුනි 15 දිනට පෙර රජයේ ඉඩමක් අනවසරයෙන් අල්ලා ගෙන සංවර්ධනය කරමින් පදිංචිව සිටින බව විධිමත් පරිදි තහවුරු කරන්නේ නම්, එම ඉඩම්ද බලපත්‍ර ඇති ඉඩම් සේ සලකා පුද්ගලික ඉඩම් රජයට අත්කර ගැනීමේදී ගෙවනු ලබන ප්‍රතිලාභයන් පනතට හා චක්‍රලේඛ උපදෙස්වලට අදාලව ගෙවීමටත්, එසේම අනවසර නියමානුකූල කරනු නොලැබූ රජයේ ඉඩම් හා රක්ෂිත වල දීර්ඝ කාලයක් පදිංචි අනවසර පදිංචි කරුවන්ට රජයේ ප්‍රධාන තක්සේරු විසින් තීරණය කරනු ලබන වන්දි මුදලක් ගෙවීම.

5.3.61 ඉහත යෝජනාවන් ක්‍රියාත්මක කිරීමට අදාළව පහත සඳහන් යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා තිබුණි.

5.3.61.1 සංදේශයේ සඳහන් ඉහත අංක i, ii හා iii යටතේ දක්වා ඇති යෝජනා ක්‍රියාත්මක කිරීම.

5.3.61.2 එම යෝජනා ක්‍රියාත්මක කිරීමේදී උපලේඛන අංක 01 හි (ඇමුණුම LVIII) සඳහන් කරඇති අංක 01 සිට 13 දක්වා වන නිර්දේශ අනුව කටයුතු කිරීම.

5.3.62 ඉහත සංදේශය සඳහා මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ (ඇමුණුම LIX) පහත පරිදි වේ.

5.3.62.1 මෙම අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් යෝජනා කොට ඇති තක්සේරු කමිටුව සඳහා පළාත් ඉඩම් කොමසාරිස්ගේ නියෝජිතයෙක් ඇතුළත් කිරීමද අභියාචනා කමිටුවේ සභාපති ලෙස දිස්ත්‍රික් ලේකම් වෙනුවට වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු ද, නව සාමාජිකයෙකු ලෙස ඉඩම් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයෙක් ඇතුළත් කිරීම යෝග්‍ය බව නිරීක්ෂණය කර තිබූ අතර එක් සාමාජිකයෙකු බැගින් මෙම කමිටු දෙක සඳහා වැඩිවීම තුළින් ඇතිවන පිරිවැය කළමනාකරණය කිරීමට එක් ඉඩම් කැබැල්ලක් වෙනුවෙන් එක් සාමාජිකයෙකුට ගෙවන රු.250 ක මුදල රු.200 ක් ලෙස සංශෝධනය කළ යුතු බව.

5.3.62.2 ඉහළ නිම්නයේ නිවාස හා ගොවිබිම් අහිමිවන පුද්ගලයින් සඳහා ඉහළ නිම්නයෙන් නිවසක් තනා ගැනීමට ඉඩමක් හා පහළ නිම්නයෙන් වගාබිම් ලබාදීම තුළින් ප්‍රායෝගික ගැටළු ඇති නොවන්නේද යන්න යළි සොයා බැලීමට යෝජනා කර තිබූ බව.

5.3.62.3 උපලේඛන අංක 01 හි අංක 12 යටතේ සඳහන් පුද්ගලයන් සඳහා ලබාදෙන රු.3,000 ක මාසික දීමනාව අංක 09 යටතේ සෑම පුද්ගලයෙකුටම ලබාදෙන රු.2000 ක දීමනාවට අමතරවද යන්න පැහැදිළිව සඳහන් කළ යුතු බව.

5.3.62.4 වන්දි මුදල්වලට අමතරව අංක 02 හා අංක 03 හි සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පිරිවැය මෙම ව්‍යාපෘතිය නිසා 2012 වසර වෙනුවෙන් අමාත්‍යාංශයට වෙන් කර ඇති ප්‍රතිපාදන තුළ කළමනාකරණය කළ යුතු බව.

5.3.62.5 ඉහත සඳහන් සංදේශයට 2012 ජුනි 27 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය (ඇමුණුම LX) ලබාදී තිබුණි.

5.3.63 2013 වර්ෂයේදී ඉරාන රජයට සම්බාධක පැනවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සඳහා ඉරාන රජයෙන් අරමුදල් සම්පාදනය කරගැනීමේ බාධාවක් ඇතිවී තිබුණි.

5.3.64 වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2013 මැයි 10 දිනැති අංක අමප/13/0627/508/004 දරන "උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය - ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය සඳහා කාර්ය මණ්ඩල බඳවා ගැනීම" යන මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් (ඇමුණුම LXI) අමාත්‍ය මණ්ඩල අනුමැනිය අපේක්ෂා කර තිබුණි.

5.3.64.1 නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත්) හා නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉංජිනේරු) වශයෙන් සේවා කොන්ත්‍රාත් කාලය 2013 පෙබරවාරි 01 දින සිට 2016 නොවැම්බර් 15 දින දක්වා දීර්ඝ කිරීමටත්

5.3.64.2 මෙම නිලධාරීන් දෙදෙනාට මාසිකව රුපියල් 180,000 බැගින් පාරිශ්‍රමිකයක් හා වාර්ෂිකව සියයට 10 වැටුප් වර්ධකය සමඟ කළමනාකරණ සේවා චක්‍රලේඛ 33/2007 හි සඳහන් අනෙකුත් අදාල දීමනා ගෙවීමටත්

5.3.64.3 කළමනාකරණ සේවා චක්‍රලේඛ 33/2007 හි විෂයය අංක 5.2 හා 5.3 සඳහන්වන ප්‍රතිලාභ උක්ත නිලධාරීන් දෙදෙනා වෙත ලබාදීමටත්

5.3.65 මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් අපේක්ෂිත කාලය තුළ ව්‍යාපෘතිය අවසන් කිරීම, ව්‍යාපෘතියේ විශාලත්වය, නිලධාරියාගේ සුදුසුකම්, පළපුරුද්ද හා නිපුනත්වය සහ ඔවුන් විසින් ව්‍යාපෘතියට වෙන්කරන ලද දායකත්වය සලකා බලා එකඟවන බව (ඇමුණුම LXII) දක්වා තිබුණි.

5.3.66 ඉහත සඳහන් සංදේශයට 2013 ජූනි 20 පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී (ඇමුණුම LXIII) පහත සඳහන් තීරණයට එළඹී තිබුණි.

5.3.66.1 වාරිමාර්ග හා ජලසම්පත් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් වාර්ෂිකව සමාලෝචනය කිරීමට යටත්ව පෙර කොන්දේසි මතම 2013 පෙබරවාරි 01 දින සිට 2016 නොවැම්බර් 15 දින දක්වා දීර්ඝ කිරීම

5.3.66.2 ඉහත සඳහන් කොන්දේසි මත සේවය කිරීමට එකඟ නොවන්නේනම්, කළමනාකරණ සේවා චක්‍රලේඛ 33/2007 (ඇමුණුම LXIV) හි විධිවිධාන පරිදි සුදුසු නිලධාරීන් බඳවා ගැනීමට නොපමාව කටයුතු කිරීම.

5.3.67 වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය සහ 2013 මැයි 16 දිනැති 13/0654/508/005 (ඇමුණුම LXV) දරන "වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා උපදේශන සේවා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය හා මහවැලි උපදේශන සේවා කාර්යාංශය වෙතින් ඍජුවම ලබා ගැනීම" යන මැයෙන් ඉදිරිපත් කළ සංදේශයෙන් පහත කරුණු දක්වා තිබුණි.

5.3.67.1 අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පරිදි මෙම අමාත්‍යාංශය මගින් දස අවුරුදු සංවර්ධන සැලැස්මක් යටතේ නව ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘති 39 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට ඇති අතර ඒවා දැනට විවිධ අවස්ථාවල පවතින බව.

5.3.67.2 ඉන් ව්‍යාපෘති 15 ක් පමණ ශක්‍යතා අධ්‍යයන අවස්ථාවේ පසුවන අතර ඉක්මනින් ඒවායේ ප්‍රතිලාභ ලබාගනු වස් ඉදිරි අවුරුදු 02 ක් ඇතුළත වැඩ ආරම්භ කිරීමට අදහස් කොට ඇති බව.

5.3.67.3 ශක්‍යතා අධ්‍යයන, පාරිසරික ඇගයීම්, විමර්ෂණ කටයුතු, සවිස්තරාත්මක සැලසුම් හා කොන්ත්‍රාත් ලියකියවිලි කඩිනම් කළ යුතු බව.

5.3.67.4 මෙම සේවා රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ නිපුණතාවයෙන් යුතු ආයතන හරහා ලබාගත යුතු වුවත් වාරිමාර්ග හා ජල සම්පත් සංවර්ධන ක්‍රියාලියෙහි ඇති විශේෂත්වය නිසා මෙය පෞද්ගලික අංශය කෙරෙන් ලබා ගැනීමට ඇති හැකියාව ඉතා සීමිත බව.

5.3.67.5 මෙම අමාත්‍යාංශය යටතේ ඇති ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය හා මහවැලි උපදේශක කාර්යාංශය සතු හැකියාවන් වර්ධනය කිරීම මෙන්ම ඉන් උපරිම සේවාවක් ලබාගැනීම් වස් රු.මිලියන 50 ට අඩු මෙවැනි උපදේශක සේවාවන් එම ආයතනය හරහා ලබා ගැනීමට ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය (IRR/CAB/16/2011 හා 2011 ජුනි 23 වැනි දා) පරිදි අමාත්‍ය මණ්ඩලය විසින් එම සේවාව 2011 අග දක්වා ලබාගැනීම අනුමත කරන ලද බව.

5.3.67.6 මෙම අනුමැතිය පරිදි එම ආයතන වෙත පිරිනමන ලද කොන්ත්‍රාත් මගින් ශක්‍යතා අධ්‍යයන, පාරිසරික ඇගයීම් හා වැඩ කොටස් සාර්ථක අයුරින් පසුගිය වකවානුවේදී නිම කොට ඇති බව.

5.3.67.7 මෙම ආයතන මගින් විවිධ උපදේශක සේවාවන් සඳහා ඉදිරිපත් කරන ලද මිල ගණන් සාපේක්ෂව ගත් කළ සාධාරණ වූ අතර මෙම සේවා ඉතා කෙටි කලක් තුළ ලබාදීමට ද සමත්වී ඇති බව.

5.3.67.8 පෞද්ගලික අංශය කෙරෙන් එම සේවා ලබාගැනීමේදී උපදේශකවරුන් වැනි කාර්යය මණ්ඩල තෝරාගැනීමට මාස 05 ක් 06 වැනි දීර්ඝ කාලයක් ගතවන අතර ඉහත කී ක්‍රියාමාර්ගය තුළින් එම කාලය අඩුකර ගත හැකි වී ඇති බව.

5.3.67.9 මෙම කොන්ත්‍රාත් තුළින් එම ආයතන සතු හැකියාවන් තවදුරටත් වර්ධනය වීමේ වාසියද ලබාගත හැකි වන අතර එවැනි සේවාවන් පුද්ගලික අංශ මගින් ඉටුකර ගැනීමේදී ලබාගන්නා පලපුරුද්ද ආයතනය තුළ රැඳීමේ අවස්ථාවක් නැතිවනු ඇති බව.

5.3.67.10 ඉහත කරුණු සලකා බලා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට හා මහවැලි උපදේශක කාර්යාංශයට ජලසම්පත් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ලබාදෙන ලද සහනදායී පදනම තවත් අවුරුදු දෙකකට ලබාදීම සුදුසු බව තරයේ නිර්දේශ කර ඇති බව.

5.3.68 ඉහත සඳහන් කරුණු මුදුන්පත් කර ගැනීමත්, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේත් මහවැලි උපදේශක කාර්යාංශයේත් හැකියාවන් තුළින් ජල සම්පත් සංවර්ධනයෙහිලා උපරිම ඵල නෙලාගැනිමත් අරමුණු කොට ගනිමින් සාමාන්‍ය ප්‍රසම්පාදන පටිපාටියෙන් බැහැරව, විධිමත්ව ස්ථාපනය කරනු ලබන තාක්ෂණික ඇගයීම් කමිටුවක් මගින් නිර්දේශිත මිල ගණන් පරිදි, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු අනුමැතියට යටත්ව, රු.මිලියන 50 ට අඩු සුළු පරිමාණයේ උපදේශක සේවා එම ආයතන තුළින් ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කර තිබුණි.

5.3.69 ඉහත සංදේශය සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ (ඇමුණුම LXVI) පහත පරිදි වේ.

5.3.69.1 රජයේ ඉදිකිරීම් ආයතන වල ප්‍රගතිය පරීක්ෂා කිරීම හා ඉදිරියේදී ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමට අමාත්‍යමණ්ඩලය විසින් පත්කළ කමිටුවේ වාර්තාව අනුව, අදාල ආයතනවල ශක්‍යතාවය සැලකිල්ලට ගෙන ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව යන රාජ්‍ය අංශයේ ඉදිකිරීම් ආයතනවලට ව්‍යාපෘති උපදේශන කටයුතු පැවරීම තුළින් ව්‍යාපෘති ප්‍රාරම්භක කාලසීමාව අඩුකර ගැනීමට හැකිවන බව.

5.3.69.2 උපදේශන සේවා සැපයීම ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ මූලික කාර්යයක් විය යුතු බව. යෝජිත උපදේශක සේවාවන්ගෙන් ප්‍රමාණවත් කොටසක් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය පිළිබඳව එකඟවන බව.

5.3.69.3 එසේ වුවද පූර්වෝක්ත කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් මහවැලි උපදේශක කාර්යාංශයට පවතින හැකියාව පිළිබඳව තහවුරුවක් නොමැති බැවින් එම ආයතනයට කරනු ලබන පැවරුම් නිසි අධ්‍යයනයකින් පසුව සිදු කළයුතු බව.

5.3.69.4 විෂයගත ව්‍යාපෘති සම්බන්ධයෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට හා රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාවට පල පුරුද්දක් ඇත්නම් එම ආයතනද උක්ත ක්‍රියාවලිය සඳහා සහභාගී කරවා ගැනීම සුදුසු වන බව.

5.3.70 ඉහත සංදේශය සඳහා 2013 ජූනි 06 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ වල දක්වා ඇති ආකාරයට අමාත්‍යාංශය විසින් ක්‍රියා කිරීමට යටත්ව, නියමිත ක්‍රමවේදය අනුගමනය කරමින් පත්කරන ලද තාක්ෂණ ඇගයීම් කමිටුවක නිර්දේශ මත අදාල ගාස්තු ප්‍රමාණ හා මෙවැනි කොන්ත්‍රාත්තු භාර ගැනීමට ඔවුන් සතු හැකියාව අගයමින් අමාත්‍යාංශයීය ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගනිමින්, අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව, වසර 02 ක කාලයක් සඳහා රු.මිලියන 50 ට අඩු සුළු පරිමාණ උපදේශන සේවා සැපයීම් පහත සඳහන් ආයතන වෙත පිරිනැමීම සඳහා අනුමැතිය (ඇමුණුම LXVII) ලබා දී තිබුණි.

5.3.70.1 ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත.

5.3.70.2 මෙවැනි කාර්යයන් භාරගෙන ඉටුකිරීමට මහවැලි උපදේශන කාර්යාංශය සතු හැකියාව පිළිබඳව, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් වරයා විසින් තහවුරු කරගැනීමෙන් පසුව එකී කාර්යාංශය වෙත.

5.3.70.3 අදාල ව්‍යාපෘති ක්ෂේත්‍රයන් හී පලපුරුද්ද තිබේනම්, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව වෙත.

5.3.71 වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2013 ජූලි 29 දිනැති අංක අමප/13/1067/508/014/ටීබීආර් දරන "උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ගිවිසුම් අංක RFP/UOMDP-HW/01 දරන EPC/Turnkey කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීමේදී එහි සේව්‍යයාට සහය වීම සඳහා උපදේශක සේවා සැපයීම - කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා අනුමැතිය ලබාගැනීම" යන මැයෙන් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් (ඇමුණුම LXVIII) පහත කරුණු සඳහන් කර තිබුණි.

5.3.71.1 ඉහත **4.3.40** හි සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණයේ (ආ) පරිදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාර තෝරාගනු ලබන උපදේශක ආයතනය මගින් (I), (II), (III) හා (IV) යෝජනාවල සඳහන් කාර්ය මණ්ඩල අවශ්‍ය සේවය ලබාගැනීමට අන්තර්ජාතික තරඟකාරී ලංසු කැඳවීමට (ඇමුණුම LXIX) කටයුතු කර තිබූ බව

5.3.71.2 ඒ සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ **2012** අගෝස්තු **06** දාතමින් වූ අංක PFD/PFD/104-19-07 දරන ලිපිය අනුව අමාත්‍ය මණ්ඩලය විසින් සාමාජිකයින් **07** දෙනෙකුගෙන් යුත් උපදේශක ප්‍රසම්පාදන කමිටුව පත්කර තිබූ බව

5.3.71.3 තාක්ෂණ පර්යේෂණ හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ සභාපතිත්වයෙන් යුත් කමිටුව උපදේශන සේවා තෝරාගැනීම සඳහා "අවම පිරිවැය තෝරා ගැනිම (LCS)" ප්‍රසම්පාදන ක්‍රමය තෝරාගෙන තිබූ බව

5.3.71.4 උපදේශක ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් වූ ලංසු ඇගයීමට ලක්කරන ලද අතර (ඇමුණුම LXX) අවම මිල යෝජනාව ඉදිරිපත් කර තිබූ සී/ස GIBB (Mauritius) සමාගම (WAPCOS සමාගම හා ඉංජිනේරු උපදේශක (පෞද්) සමාගම හා ඒකාබද්ධ) සමඟ සාකච්ඡා කර එකඟතාවයන්ට පැමිණ තිබූ බව

5.3.72 ඒ අනුව මෙම සංදේශයෙන් උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ EPC/Turnkey කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘතියේ සේවායෝජකට සහය වීමේ උපදේශක සේවාව සඳහා වූ කොන්ත්‍රාත්තුව ඇගයීමට ලක්වූ අවම මූල්‍ය යෝජනාව ඉදිරිපත් කරන ලද සී/ස GIBB (Mauritius) සමාගම හා සාකච්ඡාවලදී එකඟ වූ කොන්දේසි වලට යටත්ව එක්සත් ජනපද ඩොලර් **1,978,300** හා ශ්‍රී ලංකා රු.**404,502,000** ක් වූ මිලකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කර තිබුණි.

5.3.73 ඉහත සංදේශය සඳහා මුදල් අමාත්‍යවරයා විසින් (ඇමුණුම LXXI) පහත සඳහන් නිරීක්ෂණයන් කර තිබුණි.

5.3.73.1 මේ වන විට සියයට **28** ක පමණ භෞතික ප්‍රගතියක් වාර්තා කෙරෙන උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය EPC (Engineering Procurement and Consultancy) / Turnkey පදනමින් ක්‍රියාත්මක වන කොන්ත්‍රාත්තුවකි. ඒ අනුව ව්‍යාපෘතියට අදාල සැලසුම් හා සුපරීක්ෂණය පිළිබඳ උපදේශක සේවාව ප්‍රධාන කොන්ත්‍රාත්තුව තුළින් සපයනු ලබන බව

5.3.73.2 මේ ආකාරයට සැලසුම් හා සුපරීක්ෂණය පිළිබඳ උපදේශන සේවාව ප්‍රධාන කොන්ත්‍රාත්තුව තුළින් ආවරණය වන අතරතුර සේවායෝජකගේ අවශ්‍යතාවලට අනුකූලව හා නියමිත ප්‍රමිතියෙන් යුතුව ඉදිකිරීම් කටයුතු ඉටු කෙරෙන බව සනාථ කර බිල්පත් ගෙවීම වැනි කටයුතු වලදී ව්‍යාපෘති අධ්‍යක්ෂකට සහයවීම යෝජිත උපදේශන සේවාව තුළින් අපේක්ෂා කරන බවත් ඒ වෙනුවෙන් ඒකාබද්ධ අරමුදලින් එක්සත් ජනපද ඩොලර් **1,978,300** ක් හා ශ්‍රී ලංකා රුපියල් **404,502,000** ක් වැය කිරීමට සිදුවන බව

5.3.73.3 තවද යෝජිත උපදේශක සේවාව තුළ ප්‍රධාන තනතුරු **04** ක් විදේශ විශේෂඥයින් මගින් ආවරණය කෙරෙන අතර ඉතිරි සියළුම උපදේශක සහයන් දේශීය විද්වතුන්ගෙන් ලබා ගන්නා බව

5.3.73.4 **2012** ඔක්තෝබර් **23** දින පැවති පොදු ව්‍යවසායන් පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභා රැස්වීමේදී (COPE) උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ උපදේශන සේවාව රේඛීය අමාත්‍යාංශය යටතේ වූ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයෙන් (CECB) ලබාගැනීමේ හැකියාව සාකච්ඡාවට භාජනය වී ඇත. මෙම කාර්යය භාර ගැනීම සඳහා CECB) ආයතනයේ සභාපතිවරයාට උපදෙස් ලබාදීමද මෙහිදී සිදුව ඇත. CECB ආයතනය සකස් කර ඇති වාර්තාවට අනුව බොහෝ බහුකාර්ය සංර්වධන යෝජනා ක්‍රමවල විදේශීය උපදේශකයන්ගේ දේශීය සහයක (Local Engineering Counterpart) ලෙස කටයුතු කිරීමෙන් විෂයගත ක්ෂේත්‍රය පිළිබඳව CECB ආයතනය ලබාදී ඇති පළපුරුද්ද ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස්වලට අදාළ උපදේශනය සැපයීමට තරම් ප්‍රමාණවත් බව

5.3.73.5 ඒ අනුව, ව්‍යාපෘතියේ කටයුතු සියයට **28** කින් පමණ දැනටමත් අවසන්ව ඇති නිසා සියයට **72** ක් පමණක් වූ ඉතිරි වැඩ කොටස් නිම කිරීමට අදාල උපදේශක සේවාවේ විෂය පථය නැවත සමාලෝචනය කර ඊට අදාල මිල ගණන් මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයෙන් (CECB) ලබා ගැනීමට කටයුතු කර, ඒ අනුව තීරණයක් ගැනීම සුදුසු බව

5.3.74 ඒ අනුව 2013 අගෝස්තු 22 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඉහත සඳහන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සලකා බලා ඒ අනුව ක්‍රියා කළ යුතු බවට තීරණය (ඇමුණුම LXXII) කර තිබුණි.

5.3.75 ඒ අනුව සේව්‍යාට සහයවීමේ උපදේශක සේවාව සැපයීම සඳහා මධ්‍යම ඉංජිනේරු කාර්යන් පිළිබඳ උපදේශන කාර්යාංශය තෝරාගෙන තිබුණි.

5.3.76 වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යවරයා විසින් 2013 අගෝස්තු 30 දිනැති අංක අමප/13/1285/508/022 දරන (ඇමුණුම LXXIII) "උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය - ව්‍යාපෘති ගණකාධිකාරීවරයෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට" යන මැයෙන් ඉදිරිපත් කළ සංදේශයේ ව්‍යාපෘති ගණකාධිකාරී තනතුරේ රාජකාරී අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී ඩබ්.එම්. කරුණාතිලක මහතා විසින් තම නිත්‍ය තනතුරේ රාජකාරී වලට අමතරව 2010 ජූනි 07 දින සිට මේ දක්වා ඉටුකරමින් සිටින බවත් සඳහන් කර තිබුණි.

5.3.76.1 එම සංදේශයෙන් ඩබ්.එම්. කරුණාතිලක මහතා උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති ගණකාධිකාරී තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා 2013 සැප්තැම්බර් 06 දින සිට වසරක කාලයක් සඳහා පත් කිරීමටත්, ඔහු විශ්‍රාම ගන්නා දිනය වනවිට ලැබූ වැටුප හා දීමනාවට සමාන මාසික පාරිශ්‍රමිකයක් ගෙවීමටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා තිබුණි.

5.3.77 ඉහත සඳහන් සංදේශයට 2013 ඔක්තෝබර් 03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය (ඇමුණුම LXXIV) ලබාදී තිබුණි.

5.3.78 මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති ගේ 2013 සැප්තැම්බර් 27 දිනැති අංක 08/EIA/WATER/01/2006 දරන Proposed Uma Oya Multipurpose Development Project – Developments within Kirindi Oya Basin Supplemental EIA Report යන ලිපියෙන් 2013 සැප්තැම්බර් 27 දින සිට වර්ෂ තුනක කාලයකට Supplemental EIA Report හි පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය (ඇමුණුම LXXV) ලබාදී තිබුණි.

5.3.79 මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ (පාරිසරික බලපෑම් ඇගයීම්) ගේ 2014 ජුනි 19 දිනැති අංක 08/EIA/P&E/11/11/12 දරන 132KV Transmission line from Randeniya to Badulla gird substation Uma Oya multipurpose development Project යන ලිපියෙන් 2014 ජුනි 19 දින සිට වර්ෂ තුනක කාලයකට මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාව පරිදි ජල විදුලි බල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය (ඇමුණුම LXXVI) ලබාදී තිබුණි.

5.3.80 ව්‍යාපෘතිය කරගෙන යන අතරතුරදී එනම් 2014 දෙසැම්බර් 24 වන දින ප්‍රධාන උමගේ පළමු ජල කාන්දුව සිදු වී තිබූ අතර 2015 පෙබරවාරි 16 දින ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු තාවකාලිකව අත්හිටුවා තිබුණි (ඇමුණුම LXXVII). අනතුරුව මෙම ව්‍යාපෘතිය නිසා ජල මූලාශ්‍රවලට සිදුවූ බලපෑම මත අගතියට පත් පාර්ශව අධිකරණ ක්‍රියාමාර්ග වලටද යොමුවී තිබූ අතර (ඇමුණුම CII) හි දැක්වෙන ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය 2016 ඔක්තෝබර් 15 දින ලබාදී තිබුණි.

5.3.81 මුල්ම ජල කාන්දුව වාර්තාවීමෙන් පසු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා විසින් 2015 මාර්තු 23 දිනැති අංක අමප/15/0311/604/002 දරන (ඇමුණුම LXXVIII) " උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ මූලස්ථායී වැඩවල ඉදිරි කටයුතු" මැයෙන් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් පහත යෝජනා ඉදිරිපත් කර තිබුණි.

5.3.81.1 උමඟ තුළ වූ ජල කාන්දු තත්ත්වය හේතුකොටගෙන හානියට පත්වී ඇති 600 පමණ වූ නිවාස සඳහා ඇස්තමේන්තුගත පිරිවැය වන රු.මිලියන 300 ක් වූ මුදල කොන්ත්‍රාත් සමාගමෙන් ලබාගැනීමට යටත්ව, ශ්‍රී ලංකා රජය මගින් එම මුදල ගෙවීමට හා ඒ සඳහා වන අග්‍රිම මුදල් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත ලබාදීම සඳහා ද

5.3.81.2 බලපෑමට ලක්වූ පවුල් සඳහා අඛණ්ඩව පානීය නළ ජලය ලබාදීම සඳහා ජාතික ජලාපවාහන මණ්ඩය මගින් ඉදිරිපත් කරන ලද රු.මිලියන 188 ක් වූ මුළු ඇස්තමේන්තු පිරිවැය අනුමත කිරීම සඳහා සහ ඒ සඳහා ශ්‍රී ලංකා රජය මගින් ප්‍රතිපාදන ලබාදීමට හා එලෙස පානීය නළ ජලය ලබාදීම සඳහා කඩිනමින් ඉටුකළ හැකි ග්‍රාමීය ජල සම්පාදන යොජනා ක්‍රම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය වන රු.මිලියන 55 ක මුදල වහාම මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත ලබාදීම සඳහා ද,

5.3.81.3 පානීය ජල පහසුකම් ලබාදීම කඩිනම් කරවීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අධීක්ෂණය යටතේ මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය වෙත එම ඉදිකිරීම් වැඩ කටයුතු පැවරීම සඳහා ද

5.3.81.4 මූලස්ථායී වැඩ කොන්ත්‍රාත්කාර සමාගම වන ෆරාබ් සමාගම (FARAB) වෙත **2014** දෙසැම්බර් **31** දින දක්වා කරන ලද වැඩ වලට කළ යුතු වූ සහතික කළ ගෙවීම්වලින් ගෙවීමට ඉතිරිව ඇති එක්සත් ජනපද ඩොලර් **22,200,976.65** ක් වන මුදලින් සියයට **50** ක් වන මුදලක් **2015** අයවැයෙන් දේශීය අරමුදල් යටතේ ඉක්මනට ලබාදීමට ද

5.3.81.5 පහත සඳහන් (අ) සිට (ඇ) දක්වා සඳහන් කර ඇති කරුණු සම්බන්ධයෙන් දක්වා ඇති පරිදි කටයුතු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් පත්කිරීමට ද

5.3.81.5.1 කොන්ත්‍රාත්කාර සමාගම වෙත නිකුත් කර ඇති තාවකාලික වැඩ අත්හිටුවීමේ නියෝගය ඉවත්කර ගැනීම ප්‍රමාද වීම හේතු කොටගෙන සේවා යෝජකයා වන ශ්‍රී ලංකා රජය වෙත පැන නැගිය හැකි අවාසිදායක තත්ත්වයන් මගහැරවීම පිණිස හැකි ඉක්මනින් එම අත්හිටුවීමේ නියෝගය ඉවත්කිරීම සම්බන්ධව තීරණයක් ලබාදීම.

5.3.81.5.2 මධ්‍යම පරිසර අධිකාරිය සහ විද්වත් මණ්ඩලය විසින් ලබාදී ඇති නිර්දේශ සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘතියේ වැඩ ඉදිරියට ගෙන යාම සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම.

5.3.81.5.3 ව්‍යාපෘතිය සම්බන්ධව පැන නැගී ඇති මූල්‍යමය ගැටළු අධ්‍යයනය කර ඒ සඳහා අවශ්‍ය පිළියම් නිර්දේශ කිරීම.

5.3.82 ඉහත සඳහන් කරුණුවලින් (I), (II), (III) හා (IV) සඳහා අනුමැතිය ලබාදී තිබූ (ඇමුණුම LXXIX) අතර සංදේශයේ V හි (අ) සිට (ඇ) දක්වා කරුණු සම්බන්ධයෙන් දක්වා ඇති පරිදි කටයුතු කිරීම සඳහා පහත සංයුතියෙන් යුත් අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත් කර තිබුණි.

මුදල් අමාත්‍යතුමා (සභාපති)
විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා
වාරිමාර්ග අමාත්‍යතුමා
අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමා
නිවාස හා සමෘද්ධි රාජ්‍ය අමාත්‍යතුමා සහ
ඌව පළාත් ප්‍රධාන අමාත්‍යතුමා

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්/ කැඳවුම්කරු වශයෙන් ක්‍රියාකරන බවටත්, කමිටුවේ කාර්යයන් සඳහා අවශ්‍යයැයි සැලකෙන අන්කවර හෝ නිලධාරියෙකුගේ සහය කමිටුව විසින් ලබාගත හැකි බවට තීරණය කර තිබුණි.

5.3.83 මුදල් අමාත්‍යවරයාගේ සභාපතීත්වයෙන් යුතුව වාරිමාර්ග අමාත්‍යවරයා හා නිවාස හා සමෘද්ධි රාජ්‍ය අමාත්‍යවරයාගේ සහභාගීත්වයෙන් 2015 අප්‍රේල් 28 දින පැවති රැස්වීමේදී විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කරන ලද යෝජනා සහ අනෙකුත් සාමාජිකයින් ඉදිරිපත් කරන ලද කරුණු සලකා බැලීමෙන් අනතුරුව අදාල රාජ්‍ය ආයතන නියෝජනය කළ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව පහත නිර්දේශ සඳහන් කරමින් අමාත්‍ය මණ්ඩල සටහනක් (ඇමුණුම LXXX) ඉදිරිපත් කර තිබුණි.

5.3.83.1 විද්වත් මණ්ඩලයෙන් සහ මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබාදුන් වාර්තාවල සඳහන් නිර්දේශවලට අනුගතව ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කොන්ත්‍රාත්කරුට උපදෙස් නිකුත් කිරීමට

5.3.83.2 අනාගතයේ කොන්ත්‍රාත්කරු සිදුකරන සියළුම ඉදිරිකිරීම් කටයුතු විද්වත් මණ්ඩලයේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශවලට අනුකූල වන පරිදි සිදුවේද යන්න පිළිබඳව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් තහවුරු කර ගැනීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම

5.3.83.3 ඉරාන අපනයන සංවර්ධන බැංකුවේ (EDBI) මූල්‍ය පහසුකම් යළි සක්‍රීය වනතෙක් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීමට අවශ්‍ය අරමුදල් ශ්‍රී ලංකා රජය විසින් ලබාදීම.

5.3.83.4 ඉහත සංදේශයේ සඳහන් වන මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ පහත දැක්වේ. (ඇමුණුම LXXVIII)

5.3.83.4.1 කෙටිකාලීන නිර්දේශ

5.3.83.4.1.1 ජල කාන්දුව වලකාලීම - දැනට ප්‍රධාන උමං මාර්ගය ආශ්‍රිතව ඇතිවී ඇති ජල කාන්දුව හැකි ඉක්මනින් නැවැත්වීම.

5.3.83.4.1.2 ජල සම්පාදනය - ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නිසා ජල මූලාශ්‍ර/ප්‍රභව අහිමිවීම නිසා බලපෑමට ලක්වී ඇති ගම්මානවල ජීවත්වන ජනතාවට අවශ්‍ය ජල පහසුකම් කඩිනමින් ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

5.3.83.4.1.3 වන්දි ලබාදීම - ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නිසා ගම්මාන හා නිවැසියන්ට සිදුවී ඇති හානිය වෙනුවෙන් අවශ්‍ය වන්දි ලබාදීම.

5.3.83.4.1.4 ප්‍රජා සහභාගීත්වය සහිත පසු විපරම් කමිටුවක් ඇති කිරීම - පවත්නා තත්ත්වය විමර්ශනය කිරීම සහ විසඳුම් ලබාදීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා/වරිය සහ ව්‍යාපෘතියේ නියෝජිතයෙකු ඇතුළු අනෙකුත් නිලධාරීන්, ප්‍රජා නියෝජිතයන් හා අනෙකුත් අදාල පාර්ශවයන්ගෙන් සමන්විත පසුවිපරම් කමිටුවක් ඇති කිරීම.

5.3.83.5 දිගුකාලීන නිර්දේශ

5.3.83.5.1 භූ ස්ථායිතාවය පිළිබඳ විමර්ශනය - පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහ මධ්‍යම ඉංජිනේරු කාර්යාංශය ඇතුළු භූ විද්‍යාඥයන්ගෙන් සමන්විත කමිටුවක් හරහා පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිරීක්ෂණ හා නිර්දේශ ලබා ගැනීම.

5.3.83.5.2 ජල මාර්ග වියලීගොස් ඇති ප්‍රදේශයේ සහ භූමියේ පැල්ම ඇති ස්ථානවල නාය යාමේ අවදානමක් තිබේද යන්න.

5.3.83.5.3 පුහුල්පොල ජලාශය හා ඩයරබා ජලාශය යාකරමින් සාදනු ලබන උමං මාර්ගයේ ඉදි කිරීමේ කටයුතු නිසා නාය යාම හෝ භූමිය ගිලා බැසීමේ ප්‍රවනතාවයක් ඇත්දැයි විමර්ශණය කිරීම.

5.3.83.5.4 ජලාශවලට ප්‍රවිෂ්ඨ වීම සඳහා ඉදිකරනු ලබන මාර්ග හා බදුල්ල වැලිමඩ විකල්ප මාර්ගයේ ඉදිකිරීම් ආශ්‍රිතව නාය යාමේ අවදානමක් සහිත භූමියේ අස්ථාවර ස්ථාන තිබේද යන්න.

5.3.83.5.5 භූගත ජලය - උමං මාර්ගයේ ඉදිකිරීම් නිසා භූගත ජල මට්ටමේ වෙනස්වීමක් සිදුවේද යන්න පිළිබඳව පූර්ව හඳුනාගැනීමක් සිදු කිරීම සහ එය වලක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

5.3.83.5.6 අපද්‍රව්‍ය බැහැර කිරීම - ඉදිකිරීම් කටයුතු නිසා ජනනය වන ද්‍රව්‍ය බැහැරලීමට සුදුසු ස්ථාන හඳුනාගෙන එකී ස්ථානවල බැහැරකරලීමට අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම.

5.3.83.5.7 පාංශු ඛාදනය - පාංශු ඛාදනය සිදුවිය හැකි ස්ථානවලින් එකී තත්ත්වය වැලැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

5.3.83.5.8 සවිස්තරාත්මක පරිසර කළමනාකරණ සැලැස්ම - පරිසර බලපෑම අවම කර ගැනීම සඳහා ව්‍යාපෘති යෝජක විසින් ගනුලබන ක්‍රියාමාර්ග ඇතුළත් සවිස්තරාත්මක පරිසර කළමනාකරණ සැලැස්ම ව්‍යාපෘති යෝජක විසින් වහාම පිළියෙල කිරීම. මෙම සැලැස්මේ කෙටුම්පතක් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් දැනටමත් පිළියෙල කර ඇති අතර එම සැලැස්මට පහතින් දක්වා ඇති කරුණුද අන්තර්ගත විය යුතුය.

පරිසර කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කාල වකවානුව
එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීමේ ක්‍රමවේදය
එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ආයතනික ව්‍යුහයක් සකස් කිරීම
මේ සඳහා ප්‍රජාසහභාගීත්වය ලබා ගැනිම

5.3.84 ඉහත සංදේශයේ සඳහන් වන විද්වත් මණ්ඩලයේ නිර්දේශ පහත දැක්වේ. (ඇමුණුම LXXVII)

5.3.84.4 ප්‍රධාන උමගේ ජල කාන්දුව නවතා දැමීමට සහ දුර්වල කොටස් ශක්තිමත් කිරීමට වහාම ක්‍රියාත්මක වීම.

5.3.84.5 උමග කැණීමේදී එයින් ඉදිරියට හමුවන පාෂාණවල තත්ත්වයන් සවිස්තරාත්මකව සමීක්ෂණය කොට හඳුනාගැනීම සහ කැණීමට පෙර ඒවා තුළින් ජල කාන්දුවීමට ඇති ඉඩකඩ වසා දැමීම සඳහා අවශ්‍ය ප්‍රතිකර්ම සිදුකිරීම.

5.3.84.6 කැණීමෙන් අනතුරුව ජල කාන්දුව සම්පූර්ණයෙන් නවතා දැමීමට හෝ පිළිගත හැකි ප්‍රමාණයක් දක්වා අඩු කිරීමට අදාල පිළියම් කිරීම.

5.3.84.7 ප්‍රධාන උමගේ ගමන් මාර්ගය දිගේ අතිරේක ඉංජිනේරු භූවිද්‍යාත්මක සිතියම්ගත කිරීම් හා භූ භෞතික විද්‍යාත්මක සමීක්ෂණ කිරීම හා අවශ්‍යයැයි හැඟෙන ස්ථානවල අතිරේක මිහිවිදමන් කැණීම හා අදාළ භූ තාක්ෂණික සමීක්ෂණ කිරීම.

5.3.84.8 භූගත ජල මට්ටම් මාපක සවිකිරීම හා මතුපිට හා භූගත ජල මට්ටම අඛන්ඩව නිරීක්ෂණය කිරීම.

5.3.84.9 නිවාස හා ගොඩනැගිලිවල ඇතිවී තිබෙන ඉරිතැලීම් සමීක්ෂණය කිරීම.

5.3.84.10 ප්‍රශ්නාර්තයක් වී තිබෙන පාංශු හුණුගල් තිබිය හැකි ප්‍රදේශයන් හඳුනා ගැනීම.

5.3.84.11 උමග තුළ විරූපනය විම් විමර්ෂණය සඳහා අවශ්‍ය උපකරණ සවිකිරීම.

5.3.84.12 ග්‍රාමීය මට්ටමේ සම්බන්ධීකරණ කමිටු ස්ථාපනය කිරීම.

5.3.84.13 පාලන කමිටුවක් පත් කිරීම.

5.3.84.14 බලපෑමට ලක්වූ ගම් වැසියන්හට පානීය ජලය ලබාදීම සුරක්ෂිත කිරීම.

5.3.84.15 දැනට උද්ගත වී ඇති තත්ත්වය හා ඒවා මැඩ පැවැත්වීමට ගෙන ඇති පිළියම් සම්බන්ධයෙන් ගම්වාසීන් හා බලපෑමට ලක්වූ ප්‍රජාව දැනුවත් කිරීම.

5.3.84.16 ඇතිවී තිබෙන හානීන් තක්සේරු කිරීම හා ඒවාට වන්දි ලබාදීම සහ පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය සහය ලබාදීම.

5.3.84.17 සමාජීය, පාරිසරික හා තාක්ෂණික තත්ත්වයන් පිළිබඳව නිරතුරුවම සමාලෝචනය කිරීම.

5.3.85 නැවත උමගේ වැඩ ආරම්භ කිරීම සඳහා **2015** මැයි මාසයේදී කොන්ත්‍රාත්කරු වූ ෆරාබ් සමාගම වෙත අවසරය ලබාදී තිබුණි.

5.3.86 2015 පෙබරවාරි 16 දින වැඩ තාවකාලිකව නතර කරන විට ඉරාන රජය හා ශ්‍රී ලංකා රජය රු. 29,609,708,710 ක් වැයකර තිබුණි. විස්තර පහත දැක්වේ.

විස්තරය	මුදල
	රු.
අත්තිකාරම් ගෙවීම් 15%	8,930,884,801
කොන්ත්‍රාත්කරුට ගෙවීම්	20,678,823,909
එකතුව	29,609,708,710

5.3.87 මධ්‍යම ඉංජිනේරු කාර්යන් පිළිබඳ උපදේශන කාර්යාංශය වෙත 2015 වර්ෂයේදී උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් කළමනාකරණ හා අධීක්ෂණ කටයුතු සඳහා උපදේශන සේවා සැපයීමට (Consultancy Services for Construction Management and Supervision) 2015 පෙබරවාරි 01 දින සිට 2015 ජූනි 30 දින දක්වා කෙටිකාලීන කොන්ත්‍රාත්තුවක් (ඇමුණුම LXXXI) පිරිනමා තිබුණි.

5.3.88 2015 ජූනි 01 දින මධ්‍යම ඉංජිනේරු කාර්යන් පිළිබඳ උපදේශන කාර්යාංශය හා ෆරාබි සමාගම අතර Consltant for pre-condition and post-condition survey and monitoring of buildings, domestic water wells, deep wells, lakes, springs and water streams within a corridor of 600m width at ground level along the alignment the Headrace tunnel and reservoir link tunnel of Uma Oya Multipurpose Development Project for 24 month සඳහා ගිවිසුමකට (ඇමුණුම LXXXII) එළඹී තිබුණි.

5.3.89 ඉහත සඳහන් කරුණ සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශ ලේකම්ගේ 2015 ජූනි 08 දිනැති අංක MMDE/TS/CAPC & SCAPC/2015/008 දරන ඉල්ලීමට අනුව උපදේශනය සඳහා වූ අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවක් රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2015 ජූනි 18 දිනැති අංක PFD/PMD/104 - 10-12 දරන ලිපියෙන් පත්කර තිබුණි. උපදේශන කටයුතු සඳහා වූ අමාත්‍ය මණ්ඩල

ප්‍රසම්පාදන කමිටුව 2016 පෙබරවාරි 26 දින පැවති රැස්වීමේදී මධ්‍යම ඉංජිනේරු කාර්යන් පිළිබඳ උපදේශන කාර්යාංශය විසින් ඉදිරිපත් කරන ලද සංශෝධිත තාක්ෂණික හා මූල්‍ය යෝජනාව තක්සේරු කර 2015 ඔක්තෝබර් 01 සිට මාස 30 ක කාල පරිච්ඡේදයක් සඳහා රු.232,664,000 බදු හැර මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීමට තීරණය (ඇමුණුම LXXXIII) කර තිබුණි.

5.3.90 ඉහත කොන්ත්‍රාත්තුව සඳහා මධ්‍යම ඉංජිනේරු කාර්යන් පිළිබඳ උපදේශන කාර්යාංශය සමඟ 2016 ජූනි 01 දින ගිවිසුම (ඇමුණුම LXXXIV) අත්සන් කර තිබුණි.

5.3.91 මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා විසින් 2016 මාර්තු 29 දිනැති අංක අමප/16/0645/704/017/ටීබීආර් දරන "උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ සේවා යෝජකගේ නියෝජිත වෙත තාක්ෂණික සහය ලබාගැනීම සඳහා වූ උපදේශක සේවා කොන්ත්‍රාත්තුව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය වෙත ප්‍රදානය කිරීම - කොන්ත්‍රාත් අංක RSP/UOMDP – HW/01" යන මැයෙන් ඉදිරිපත් කරන ලද සංදේශයෙන් (ඇමුණුම LXXXV) පහත නිරීක්ෂණ දක්වා තිබුණි.

5.3.91.1 මෙම ව්‍යාපෘතියේ මූලාරම්භයේ සිටම මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශන කාර්යාංශයේ (CECB) උපදේශන සේවා ලබාගෙන තිබෙන බව.

5.3.91.2 උපදේශන කාර්යයන් සඳහා වූ අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශන කාර්යාංශය (CECB) විසින් ඉදිරිපත් කරන ලද සංශෝධිත තාක්ෂණික හා මූල්‍ය යෝජනාව ඇගයීමට ලක්කර තිබෙන බව.

5.3.91.3 උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ සේවායෝජකගේ නියෝජිත වෙත තාක්ෂණික සහය ලබාගැනීම සඳහා වූ උපදේශක සේවා කොන්ත්‍රාත්තුව රු.232,664,000 + NBT+VAT ක වටිනාකම 2015 ඔක්තෝබර් 01 දින සිට මාස 30 ක කාල පරිච්ඡේදයක් සඳහා මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශන කාර්යාංශය (CECB) වෙත පිරිනැමීමට උපදේශන කටයුතු සඳහා වූ අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කර තිබෙන බව.

5.3.91.4 නව කොන්ත්‍රාත්තුව උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ මූලස්ථායී වැඩ ඉදිකිරීම සඳහා වූ ඇස්තමේන්තුවේ කොන්ත්‍රාත්කරු විසින් සේවායෝජකයාට හා ඉංජිනේරුවන්ට සපයනු ලබන පහසුකම් යටතේ ඇති ප්‍රතිපාදනය තුළ ක්‍රියාත්මක කළ හැකි බව.

5.3.91.5 ඒ අනුව මෙම අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ සේවායෝජකගේ නියෝජිත වෙත තාක්ෂණික සහය ලබාගැනීම සඳහා වූ උපදේශක සේවා කොන්ත්‍රාත්තුවේ මූලස්ථායි වැඩ කොන්ත්‍රාත්තුව 2015 ඔක්තෝබර් 01 දින සිට මාස 30 ක කාල පරිච්ඡේදයක් සඳහා රු232,664,000 + NBT+VAT ක වටිනාකමට මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශන කාර්යාංශය වෙත පිරිනැමීමට අනුමැතිය ඉල්ලා තිබුණි.

5.3.92 මුදල් අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලය පත්කළ උපදේශන ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ අනුව සංදේශයේ යෝජනාවට එකඟ වී තිබුණි. (ඇමුණුම LXXXVI)

5.3.93 2016 අප්‍රේල් 19 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඉහත යෝජනාව සඳහා අනුමැතිය (ඇමුණුම LXXXVII) ලබාදී තිබුණි.

5.3.94 මහවැලි සංවර්ධන හා පරිසර ඇමතිතුමා ඉදිරිපත් කළ 2016 ජුනි 09 දිනැති අංක අමප/16/1123/704/027 දරන (ඇමුණුම LXXXVIII) "උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ මූලස්ථායී වැඩ කොන්ත්‍රාත්තුව ලබා දී ඇති ඉරාන ජතික ෆරාබි (FARAB) සමාගම වෙත එක්සත් ජනපද ඩොලර් මිලියන 50 ක අතිරේක අත්තිකාරම් මුදලක් ගෙවීමටත්, අයකරගෙන ඇති ප්‍රමාද ගාස්තු මුදල වන ඇමරිකාන් ඩොලර් මිලියන 6.6 ක මුදල යළි ගෙවීමටත් කොන්ත්‍රාත්තුව නිම කිරීමේ කාලය 2018 ජුනි 30 දක්වා දීර්ඝ කිරීමටත් අනුමැතිය ඉල්ලීම". යන මැයෙන් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් කොන්ත්‍රාත්කාර සමාගමට එහි මූල්‍ය ගලනය (cash flow) යථාවත් කර ගැනීම සඳහා කැබිනට් මණ්ඩලය පත්කර ඇති ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර තිබුණි.

5.3.94.1 පහත සඳහන් කොන්දේසිවලට යටත්ව, ඇමරිකානු ඩොලර් මිලියන 50 ක අමතර අත්තිකාරම් මුදලක් නිදහස් කිරීම.

5.3.94.1.1 අදාල මුදල සඳහා සේවායෝජකට පිළිගත හැකි කොන්දේසි විරහිත (Unconditional) ඉදිරිපත් කරන සැනින් නිදහස් කරනු ලබන (Paid on demand) බැංකු ඇපකරයක් ඉදිරිපත් කිරීම.

5.3.94.1.2 එම බැංකු ඇපකරය විදේශීය බැංකුවකින් ඉදිරිපත් කරන්නේනම්, දේශීය වානිජ බැංකුවක් මගින් එම බැංකු ඇපකරය සහතික කර තිබීම.

5.3.94.1.3 FARAB Energy & Water Project සමාගමට ගෙවිය යුතු සම්පූර්ණ අත්තිකාරම් මුදල ව්‍යාපෘතිය ඉක්මන් කිරීම සඳහා වන ව්‍යාපෘති කටයුතු සඳහ පමණක් ගෙවිය යුතු බවත් වෙනත් කිසිදු කටයුත්තක් සඳහා යොදා නොගන්නා බවටත් සේවායෝජක සහතික වීම.

5.3.94.1.4 මෙම අත්තිකාරම් මුදල් ගෙවීම අනුමත වුවහොත් සේවායෝජක හා කොන්ත්‍රාත්කරු මෙම සම්පූර්ණ අත්තිකාරම් මුදල අයකර ගැනීමේ ක්‍රමවේදය සහ සේවායෝජකගේ කොන්ත්‍රාත් අයිතිවාසිකම් රැකෙන, සුදුසුයැයි හැගෙන කොන්දේසි ඇතුළත්, කොන්ත්‍රාත් ගිවිසුම් පරිශිෂ්ඨයන්ට (Addendum) ඇතුළත් වීම.

5.3.94.2 සේවායෝජකයාගේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරන්නේ නම් අයිතිවාසිකම් සහතික වන පරිදි සහ අයකරගෙන ඇති ප්‍රමාද ගාස්තු මුදල වන ඇමරිකානු ඩොලර් මිලියන 6.6 ක මුදලක් FARAB Energy & Water Project සමාගම වෙත යළි ගෙවීමටත්

5.3.94.3 උමා ඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමයේ ව්‍යාපෘති කාලය 2019 ජූනි 30 වන දින දක්වා දීර්ඝ කිරීම. ඒ අනුව ඉදිකිරීම් කාලය 2018 ජූනි 30 දක්වා දීර්ඝ කිරීම.

5.3.95 තවද ඒ අනුව 2016 අයවැය ඇස්තමේන්තුව මගින් සලසා ඇති ප්‍රතිපාදන ඉහත (අ) යටතේ වූ අත්තිකාරම් මුදලක් (ආ) වූ ප්‍රමාද ගාස්තු නැවත ගෙවීමත්, කළමනාකරණය කර ගැනීමට යටත්ව සහ මෙම කාල සීමාව දීර්ඝ කිරීම නිසා ඉහත කොන්ත්‍රාත් සමාගමට අතිරේක මුදල් නොගෙවන පරිදි ඉහත තාක්ෂණික කමිටුවල හා අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව මගින් නිර්දේශ කර ඇති ඉහත (අ), (ආ), (ඇ) යන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කර තිබුණි.

5.3.96 මේ සඳහා මුදල් අමාත්‍යවරයා විසින් පහත සඳහන් නිරීක්ෂණයන් (ඇමුණුම LXXXIX) සිදුකර තිබුණි.

5.3.96.1 ආරම්භයේදී ඉරාන මූල්‍ය සහාය යටතේ ක්‍රියාත්මක වුවද සම්බාධක හේතුවෙන් ඉරාන අපනයන සංවර්ධන බැංකුව (EDBI) ණය මගින් වියදම් දැරීම අත්හිටුවීමට සිදුවී ඇති බව

5.3.96.2 EDBI මගින් එක්සත් ජනපද ඩොලර් මිලියන 50 පමණක් ලබාදී ඇති අතර සම්බාධක ඉවත් කළ පසු EDBI මගින් නැවත මුදල් ලබාගැනීමේ අදහසින් දේශීය වෙළඳපලෙන් ලබාගත් ණය ප්‍රයෝජනයට ගනිමින් ඉරාන කොන්ත්‍රාත් සමාගම ඉදිකිරීම් කටයුතු ඉදිරියට කරගෙන යාමට ශ්‍රී ලංකා රජය තීරණය කර ඇත. ණය මුදල සම්බන්ධයෙන් ඉරාන රජය සුභවාදී ප්‍රතිචාරයක් දක්වා නොතිබුණු අතර මේ වනවිට මහා භාණ්ඩාගාරය එක්සත් ජනපද ඩොලර් මිලියන 170 ක් ව්‍යාපෘතිය සඳහා වැය කර තිබූ බව

5.3.96.3 EDBI ණය මුදලේ වලංගු කාලය ඉක්ම ගොස් ඇති බව

5.3.96.4 තරඟකාරී මිල කැඳවීම්වලට යටත්ව EPC කොන්ත්‍රාත්තුව පිරිනැමීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයට මූල්‍යමය වශයෙන් අහිතකර බලපෑම්වලට මුහුණ දීමට සිදුවී ඇති බව එම නිසා කොන්ත්‍රාත්කරුගේ මුදල් ප්‍රවාහ ගැටළුවට පිළියමක් ලෙස රජයේ ඒකාබද්ධ අරමුදලට තවදුරටත් බරක් වීමට එකඟ විය නොහැකි බව දන්වා ඇති බව

5.3.96.5 2016 අප්‍රේල් 30 දක්වා ව්‍යාපෘතියේ කාර්යයන් සියයට 55 ක් වෙනුවෙන් ගෙවිය යුතු මුදල ගෙවා ඇති බවත් අත්තිකාරම් මුදලින් එක්සත් ජනපද ඩොලර් 34,198,371 අයකරගත යුතුව ඇති බව

5.3.96.6 2016 අයවැයෙන් ප්‍රමාණවත් මුදල් වෙන්කර ඇති බවත් සම්පූර්ණ කරන ලද වැඩ කොටස් අනුව ගෙවීම්කර යුතුය. කොන්ත්‍රාත්කරුගේ මූල්‍යමය දුෂ්කරතාවලට පිළියමක් ලෙස කිසිදු අත්තිකාරමක් ගෙවීමට හැකියාවක් නොමැති බව

5.3.96.7 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්ට එකම හේතුව ඉරාන රජය මත සම්බාධක පැනවීම නොවන බව, සම්බාධක පැනවීම හේතුවෙන් ප්‍රමාදයන් සිදුවුයේනම් එය එය

නිශ්චය කර ගැනීමට නිසි ඇගයීමක් සිදු කිරීමට යටත්ව ප්‍රමාද ගාස්තුවලින් ආපසු ගෙවීමට එකඟ වන බව හා සම්පූර්ණ ප්‍රමාද ගාස්තුවම නැවත ගෙවීමට එකඟ විය නොහැකි බව

5.3.96.8 ව්‍යාපෘතියේ කාලසීමාව **2019** ජුනි **30** දක්වා සහ කොන්ත්‍රාත් කාල සීමාව **2018** ජුනි **30** දක්වා දීර්ඝ කිරීමට එකඟ වන බව

5.3.97 ඉහත සඳහන් මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සැලකිල්ලට ගෙන ඒ අනුව ක්‍රියා කරන ලෙස මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්ට නියම කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය (ඇමුණුම XC) කර තිබුණි.

5.3.98 මහවැලි සංවර්ධන හා පරිසර ඇමතිතුමා ඉදිරිපත් කළ **2016** අගෝස්තු **10** දිනැති අංක අමප/**16/1679/704/043/**ටීබීආර් දරන "උමා ඔය බහුකාර්ය ව්‍යාපෘතියේ ප්‍රධාන උමගෙහි ඇති වූ ජල කාන්දුව හේතුවෙන් බලපෑමට ලක්වූ වෙහෙරගලතැන්න, මකුල් ඇල්ල හා කුරුඳුගොල්ල යන ප්‍රදේශවල ජනතාවට පානීය ජලය සැපයීම සඳහා ජල සම්පාදන ව්‍යාපෘති **03** ක් ක්‍රියාත්මක කිරීම" යන මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් (ඇමුණුම XCI) පහත යෝජනා ඉදිරිපත් කර තිබූ අතර එයට **2016** වර්ෂය තුළ ව්‍යාපෘතිය වෙන්වූ ප්‍රතිපාදන තුළ කළමනාකරණය කර ගැනීමට යටත්ව අමාත්‍ය මණ්ඩල අනුමැකිය අපේක්ෂා කර තිබුණි.

5.3.98.1 ඉහත සඳහන් ජල යෝජනා ක්‍රම තුන වන මකුල්ඇල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය, වෙහෙරගලතැන්න ජල සම්පාදන යෝජනා ක්‍රමය, කුරුඳුගොල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයෙ ක්‍රියාත්මක කිරීම සඳහා එකතු කළ අගය මත බද්ද (VAT) නොමැතිව ඇස්තමේන්තු කරන ලද රු.**317,237,067.66** මුදලකට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සමඟ ගිවිසුම්ගත වීමට

5.3.98.2 ඉහත සඳහන් ජලසම්පාදන යෝජනා ක්‍රම තුනේ සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් කටයුතු සහ ජල නල එලීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ඉංජිනේරුමය කාර්යන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමඟ ගිවිසුම්ගත වීමට; මේ සඳහා

ඉංජිනේරුමය කාර්යන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙතින් ලංසු කැඳවා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඉදිරිපත් කළ සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් කටයුතු සහ ජල නල එලීම සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල තුළ සාකච්ඡා කර සම්මුතියට පැමිණීමට

5.3.99 ඉහත සංදේශය සඳහා මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණය (ඇමුණුම XCII) වූයේ යෝජිත ක්‍රමවේදය අනුව මෙම ජලසම්පාදන යෝජනා ක්‍රම ඇස්තමේන්තුගත පිරිවැය වන රුපියල් මිලියන 317.24 තුළ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් එකඟ වන බවය.

5.3.100 2016 අගෝස්තු 30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඉහත සංදේශයට මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සමඟ සලකා බලා අනතුරුව අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (ඇමුණුම XCIII) විසින් නිර්දේශකර ඇති පරිදි සංදේශයේ ඉහත සඳහන් (අ) හා (ආ) යෝජනා සඳහා අනුමැතිය (ඇමුණුම XCIV) ලබාදී තිබුණි.

5.3.101 මහවැලි සංවර්ධන හා පරිසර ඇමතිතුමා 2016 සැප්තැම්බර් 30 දිනැති අංක අමප/16/2077/704/027- I දරන (ඇමුණුම XCV) උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ මූලික වැඩ ඉදිකිරීම් කටුයුතුවල නියුතු කොන්ත්‍රාත්කරු වන FARAB සමාගමෙන් ප්‍රමාද ගාස්තු වශයෙන් අයකළ ඇමරිකාණු ඩොලර් මිලියන 6.6 ක මුදලින් කොටසක් ගෙවීම යන මැයෙන් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් සමාගමෙන් අයකරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 6.6 මුදලින් සියයට 80 ක් පමණක් යළි එම සමාගම වෙත 2016 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන කළමනාකරණය කරගැනීමට යටත්ව ගෙවීම සඳහා අනුමැතිය ඉල්ලා තිබුණි.

5.3.102 5.3.94 ඡේදයේ සඳහන් සංදේශයට අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයක් සිදුවූයේ නම් ඒ බව නිශ්චය කර ගැනීම සඳහා ඇගයීමක් සිදු කළ යුතු බවට මුදල් අමාත්‍යවරයා නිර්දේශ කර තිබූ අතර ඒ සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර (ඇමුණුම XCVI) තිබූ අතර එම කමිටුව විසින් ලබාදුන් ඇගයීම් වාර්තාව (ඇමුණුම XCVII) ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවට

යොමුකර නිර්දේශ (ඇමුණුම XCVIII) ලබාගෙන තිබූ බවත් සංදේශයේ සඳහන් කර තිබුණි.

5.3.103 මුදල් ඇමතිතුමා විසින් පහත සඳහන් නිරීක්ෂණයන් (ඇමුණුම XCIX) සිදුකර තිබුණි.

5.3.103.1 ව්‍යාපෘතිය ඇරඹීමට පෙර භූමිය නිදහස් කර නොගැනීම, අවශ්‍ය අනුමැතීන් ලබා නොගැනීම හා සමාජ විරෝධතා පිළිබඳ නිසි සැලකිල්ලක් නොදැක්වීම යන කරුණු ව්‍යාපෘතිය කිරීමේදී සිදුවූ ප්‍රමාදයන්ට ප්‍රධාන වශයෙන් හේතුවී ඇති බව ඉහත ඡේදයේ සඳහන් කමිටුව සිය නිර්දේශයන් හි සඳහන් කොට ඇති බව

5.3.103.2 මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් පූර්ව සූදානම් ක්‍රියාවලිය ප්‍රමාණවත් නොවීම හා මූලික පියවරයන් හිදී නිවැරදි අධ්‍යයනයක් සිදු නොකිරීම හේතුවෙන් සිදුවන ව්‍යාපෘති කාලය හා වියදම වශයෙන් විශාල මුදලක් අපතේ යාම සිදු වන බව

5.3.103.3 එබැවින් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සියළු අනුමැතීන්ද ඇතුළත්ව පූර්ව සූදානම් ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ඇති බවට රේඛීය අමාත්‍යාංශය තහවුරු කරගත යුතු බව

5.3.104 ඉහත සඳහන් සංදේශයට 2016 ඔක්තෝබර් 18 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සලකා බලා පහත සඳහන් පරිදි අනුමැතිය හා නියමයන් (ඇමුණුම C) ලබාදී තිබුණි.

5.3.104.1 ඉහත සඳහන් සංදේශයේ වූ යෝජනාවට අනුමැතිය.

5.3.104.2 මුදල් ඇමතිතුමා අවධාරණය කරනු ලැබ ඇති කරුණු සැලකිල්ලට ගෙන ඉදිරියේදී ඒ අනුව ක්‍රියාකරන ලෙස මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්ට නියම කිරීම.

5.3.105 2016 දෙසැම්බර් මස දෙවන ජල කාන්දුව ඇති වී තිබුණි.

5.3.106 **2017** ජනවාරි **09** දිනැති අංක අමප/**17/0071/704/002** දරන (ඇමුණුම CI) උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන උමගේ ඇතිවූ ජල කාන්දුව නිසා බලපෑමට ලක්වූ නිවාස හිමියන්ට සිදුවූ ආපදා තත්ත්වය යටතේ සහන සැලසීම යන මැයෙන් ඉදිරිපත් කළ සංදේශයෙන් පහත නිරීක්ෂණයන් සිදුකර තිබුණි.

5.3.106.1 **2014** දෙසැම්බර් මස සිට මේ දක්වා අවස්ථා කිහිපයකදීම ප්‍රධාන උමග තුළ සිදු වූ ජල කාන්දුව හේතුවෙන් බණ්ඩාරවෙල සහ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මකුල්ඇල්ල, වෙහෙරතැන්න, උඩපේරුව, බඹරගම සහ එගොඩගම යන ග්‍රාම නිලධාරී කොට්ඨාශවලද, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හීල්ඔය, සහ පල්ලෙපේරුව යන ග්‍රාම නිලධාරී කොට්ඨාශවලද ළිං සිදීයාම හා නිවාස වල ඉරි තැලීම් වැනි අහිතරක බලපෑම් ඇති වූ අතර ප්‍රධාන උමගේ ඉතිරි කිලෝමීටර් **07** ක් පමණ කැණීමේ දී දුර්වල පාෂාණ ස්ථරවල පිහිටීම මත මෙවැනි ජල කාන්දු ඇතිවිය හැකි බව භූ විද්‍යාඥයින් නිරීක්ෂණය කර ඇති බව.

5.3.106.2 මෙතෙක් පීඩාවට ලක් වූ ජනතාවට පහත සඳහන් සහන සේවා ලබාදී ඇති බව.

5.3.106.2.1 පානීය ජලය බෙදා දීම

ළිං සිදීයාම හේතුවෙන් බලපෑමට ලක්වූ පවුල් **1,159** කට බවුසර් **23** ක් මගින් අඛණ්ඩව ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හා වෙනත් ජල මූලාශ්‍ර වෙතින් ලබා ගන්නා ජලය දිනකට ලීටර් **230,000** සිට **260,000** අතර ප්‍රමාණයක් බෙදා දෙනු ලැබේ. තවද, එලෙස බෙදා දෙනු ලබන ජලය රැස් කර ගැනීම සඳහා එම නිවාසවලට පී.වී.සී. ජල ටැංකි ලබාදෙන ලද අතර,ඒ අනුව, ලීටර් **500** ජල ටැංකි **1,351** ක් ද, ලීටර් **2,000** ජල ටැංකි **93** ක් ද, ලීටර් **1,000** ජල ටැංකි **33** ක් ද, ලබා දී ඇති අතර පී.වී.සී.ජල නල මීටර් **11, 356** ක් මේ වන විට ලබාදී ඇති බව.

5.3.106.2.2 ස්ථිර පානීය ජල යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම

ජල ඌණතාවයට ස්ථිර පිළියමක් ලෙස රු. මිලියන 352 ක වියදමින් මකුල් ඇල්ල, වෙහෙරගල තැන්න හා කුරුඳුගොල්ල, යන ජල සම්පාදන යෝජනා ක්‍රම වේ වන විට ඉදිකරමින් පවතී. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ජල යෝජනා ක්‍රම මගින් පහත සඳහන් පරිදි පවුල් 2,400 කට ප්‍රතිලාභ සැලසීමට කටයුතු කර ඇති බව.

	ජල යෝජනා ක්‍රමය	පවුල් සංඛ්‍යාව	අවසන් කිරීමට නියමිත දිනය
i	මකුල්ඇල්ල	1,500	2017.02.28
ii	වෙහෙරගලතැන්න	500	2017.02.28
ii	කුරුඳුගොල්ල	400	ඉදිකිරීම අවසන් වී ඇත.
	මුළු ගණන	2,400	

5.3.106.2.3 හානි වූ නිවාස සඳහා වන්දි ගෙවීම

ජල කාන්දුව හේතුවෙන් බලපෑමකට ලක් වූ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලෙක්ම් කොට්ඨාශයේ නිවාස 1,344 සඳහා 165,543,182 ක් මේ වන විට වන්දි වශයෙන් ගෙවා ඇති අතර, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හානිවූ නිවාස 727 කින් නිවාස 645 ක් සඳහා තක්සේරු වාර්තා මේ වන විට ලැබී ඇති අතර, මේ වන විට රු.30,156,985 ක් වන්දි වශයෙන් ගෙවා ඇති බව.

5.3.106.2.4 ගෙවල් කුලී දීමනා ගෙවීම

බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දැඩි ලෙස හානියට පත් පවුල් 18 ක් සඳහා රු.2,284,000 ක් හා ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දැඩි ලෙස නිවාස හානියට පත් පවුල් 05 ක් සඳහා රු.438,000 ක් ගෙවල් කුලී ලෙස ගෙවා ඇති බව.

5.3.106.3 තවද මෙම සංදේශයෙන් 2016 දෙසැම්බර් 31 වන දින සිට උද්ගතවී ඇති තත්ත්වය පිළිබඳ පහත කරුණු සඳහන් කර තිබුණි.

5.3.106.3.1 උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ උමං මාර්ගය ඉදිකිරීමේ කටයුතු හේතුකොටගෙන බණ්ඩාරවෙල හා ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අදාලව ආපදාවලට ලක්වී ඇති ග්‍රාමසේවා වසම් සංඛ්‍යාව 08 ක් දක්වා වර්ධනය වී ඇති ඇතර, එම ග්‍රාම සේවා වසම් බණ්ඩාරවෙල කොට්ඨාශයේ උඩපේරුව, මකුල් ඇල්ල, වෙහෙරගලතැන්න එගොඩ ගම ආදී ග්‍රාම නිලධාරී වසම්වල සිට කිනිගම, තන්තිරිය බිඳනු වැව දක්වා ව්‍යාප්ත වී ඇති අතර, ළිං සිදී යාම් 618 ක් වාර්තා වී ඇති බව.

5.3.106.3.2 මේ නිසා ඇති වී ඇති හදිසි ආපදා තත්ත්වය යටතේ බණ්ඩාරවෙල සහ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ජනතාවගේ ජීවිතවලට හා පෞද්ගලික දේපලවලට හානි සිදුවී ඇති අතර, ඔවුන්ගේ දෛනික ජීවනෝපාය මාර්ග කෙරෙහිද විශාල බලපෑමක් සිදුවී ඇති බව.

5.3.106.3.3 මේ වන විට උත්ගතවී ඇති ආපදා තත්ත්වය සමනය කර එම ජනතාවගේ දෛනික ජීවනෝපාය කටයුතු යථා තත්ත්වයට පත් කිරීම සඳහා 2017 ජනවාරි 03 දින බදුල්ල දිස්ත්‍රික්කයේ දේශපාලන මහජන නියෝජිතයින්ගෙන් හා පීඩාවට පත් ජනතාවගේ සහ එම ජනතාව විසින් පිහිටුවා ගෙන ඇති සංවිධානවල නියෝජිතයින්ගෙන් සමන්විත කමිටුවක් මගින් පැවැත්වූ සාකච්ඡාවලින් අනතුරුව පහත සඳහන් යෝජනා කඩිනමින් ක්‍රියාවට නංවන ලෙස ඉල්ලීම් කර ඇති බව.

5.3.107 ඒ අනුව 5.3.106 ඡේදයේ සඳහන් සංදේශයෙන් පහත යෝජනා ඉදිරිපත් කර තිබුණි.

5.3.107.1 හානිවූ නිවාස සඳහා ගෙවල් කුලී ලබාදී ඇතත් කුලියට ගත් ඇතැම් නිවාසද ඉරි තැලීම්වලට ලක්වීම මත පදිංචිකරුවන් අවදානමකට ලක්ව ඇත. පදිංචිය සඳහා ඉතාමත් අවධානම් තත්ත්වයේ පවතින නිවාසලාභීන්ට බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හා ඒ අවට පිහිටි රජයේ නිල නිවාස හා සංචාරක නිවාස හඳුනාගෙන ආපදාවට ලක්වූ පවුල් එම නිල නිවාසවල තාවකාලිකව ස්ථානගත කිරීම;

5.3.107.2 පානීය ජල උල්පත් සිඳීයාම නිසා එම ප්‍රදේශයේ ජනතාවගේ ජල අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා අතිරේක බවුසර් යොදා ගැනිමත්, පානීය ජල අවශ්‍යතා සපුරාලීම සඳහා ලීටර් 200 ජල ටැංකි සෑම නිවසකටම උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රතිපාදන

මගින් ලබාදීම සහ එක් නිවසකට අවම වශයෙන් පානීය ජලය ලීටර් **200** ක් ඇතුළුව ගෘහස්ථ අවශ්‍යතා සඳහා ජලය ලීටර් **500** ක් ලබා දීම;

5.3.107.3 පානීය නොවන අනෙකුත් ගෘහස්ත ජල පරිභෝජනය සඳහා උමඟෙන් පිටවන ජලය හැකිතාක් පිරිසිදු කර භාවිතයට ගැනීමට හැකි වන අයුරින් සුදුසු ක්‍රමවේදයක් උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය මගින් සකස් කිරීම;

5.3.107.4 හදිසි ආපදා අවස්ථාවකදී ජනතාවට සහන සැලසීම සඳහා සහ ජලය බෙදාහැරීමේ කාර්යයන් වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා සිවිල් ආරක්ෂක බලකායේ සහ යුද හමුදා නිලධාරීන්ගේ සේවය ලබා ගැනීමේ සහ එම සේවා අනු ඛණ්ඩයක් නිත්‍ය ලෙස ව්‍යාපෘතියට අනුයුක්ත කිරීම;

5.3.107.5 එවැනි හදිසි අවස්ථාවක් මතුවුවහොත් ආපදාවට ලක්වන පුද්ගලයින් ලියාපදිංචි කිරීම සඳහා බිඳුනු වැව යොවුන් සේනාංකය හා විද්‍යා පීඨය යන ස්ථාන හා මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නිවාඩු නිකේතන භාවිතයට ගැනීමට හැකිවන ලෙස සූදානම්ව තබා ගැනීම;

5.3.107.6 ආපදාවට පත්වූ පවුල් සඳහා ජල සම්බන්ධතා ලබාදීමට අවම වශයෙන් එක් පවුලක් විසින් ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය වෙත ගෙවිය යුතු රු. **17,000** ක මුදල නිදහස් කරමින් විපතට පත්වූ පවුල් සඳහා ජල සම්බන්ධතාවය නොමිලේ ලබාදීම සඳහා ජාතික ජල සම්පත් හා ජලා පවාහන මණ්ඩලය වෙත නියෝග කිරීම.

5.3.107.7 දිගුකාලීන විසඳුමක් ලෙස පූර්ණ වශයෙන් හානිවූ නිවාස සඳහා නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා බණ්ඩාරවෙල කොට්ඨාශයේ ක්‍රේග් වත්ත ඉඩමෙන් අක්ක **50** ක ඉඩම් ප්‍රමාණයක් අදාල වැවිලි සමාගම මගින් ඉඩම් අත්කරගැනීමේ පනතට අනුව අත්කර ගැනීම සහ කඩිනමින් ප්‍රාදේශීය ලේකම් වෙත නිදහස් කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත බලය පැවරීම;

5.3.107.8 ශ්‍රේෂ්ඨාධිකරණය විසින් **2016** ඔක්තෝබර් **15** වන දින ලබා දෙන ලද නඩු තීන්දුවට (ඇමුණුම CII) අනුව වගා හානී සඳහා ගෙවිය යුතු වන්දි මුදල් ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂක විසින් **2017** ජනවාරි **18** දිනට ලබාදීමට නියමිත නිත්‍ය වාර්තාව පදනම්

කරගනිමින් අදාල මුදල් භාණ්ඩාගාරය මගින් මාස 03 ක් ඇතුළත ප්‍රාදේශීය ලේකම් වෙත ලබා දීම.

5.3.107.9 මෙම ව්‍යාපෘතිය හේතුවෙන් ආපදාවට ලක්වී ඇති ජනතාව ලබාගෙන ඇති විවිධ ණය අදාල මූල්‍ය ආයතන මගින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව වගා ණය කපා හැරීමටත් අනෙකුත් ණය ගෙවීම සඳහා වසර දෙකක සහන කාලයක් ලබාදීමට අදාල මූල්‍ය ආයතන හා භාණ්ඩාගාරය මගින් විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම;

5.3.107.10 දැඩි අවදානමකට හා පූර්ණ හානියට පත්වූ නිවාස හා ඉඩම් නැවත තක්සේරුකර වන්දි ගෙවා රජයට පවරා ගැනීම;

5.3.107.11 මේ වන විට තක්සේරු කර ඇති හානියට ලක්වූ නිවාසවලට සිදුවී ඇති හානි තවදුරටත් වර්ධනය වී ඇති අවස්ථාවකදී, එම නිවාස හිමිකරුවන්ගෙන් ඒ පිළිබඳ අභියාචනා භාරගෙන තක්සේරු දෙපාර්තමේන්තුව මගින් නැවතත් තක්සේරුකර එම තක්සේරුවල වෙනසක් පවතින්නේ නම් එම වෙනස අදාල නිවාස හිමිකරුවන්ට ගෙවීම;

5.3.107.12 රක්ෂිත හා අනවසර රජයේ ඉඩම්වල පිහිටි හානියට ලක්වූ නිවාස සඳහා වන්දි ගෙවීමේදී ඉඩමේ හිමිකම නොසලකා ආපදාවට ලක්වුවන්ට වන්දි ලබාදීමේ ක්‍රමවේදයම අදාල කර ගැනීම;

5.3.107.13 2013 ජූලි 24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 152 (1) ට අනුව විපතට පත්වූ පවුල් සඳහා සහනාධාර ලබාදීම;

5.3.107.14 බදුල්ල දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියට අදාලව "ජනතා සහන සැලසීමේ සම්බන්ධීකරණ කාර්යාලයක්" බදුල්ල දිසාපති කාර්යාලයීය පරිශ්‍රයේ ස්ථාපිත කිරීම හා ඉහත සඳහන් සියලුම කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණය කිරීම සඳහා නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරක් ඇතිකොට ඒ සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික ඌව පළාත් සභාවේ හිටපු ප්‍රධාන ලේකම් පී.බී අමරසේකර මහතා වසර දෙකක කාලයකට පත්කිරීමටත්, කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2016 ට (ඇමුණුම CIII) අනුව නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරට අදාල PS2 වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවරේ තැබීමටත්, කළමනාකරණ සේවා

චක්‍රලේඛ **01/2016** ට අනුව ව්‍යාපෘති කාර්ය මණ්ඩලයක් පත් කිරීමටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාදීම.

5.3.108 ඒ අනුව **5.3.106** ඡේදයේ සඳහන් සංදේශය මගින් පහත නිර්දේශ කර තිබුණි.

5.3.108.1 සංදේශයේ අංක **05** හි යෝජිත I – xiv දක්වා වූ සටහන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා කඩිනමින් රු.මි.**500** ක මුදලක් උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියෙන් **2017** වර්ෂයට වෙන්කර ඇති ප්‍රතිපාදන යොදා ගනිමින් අදාල සහන කටයුතු ක්‍රියාත්මක කිරීම.

5.3.108.2 සංදේශයේ යෝජිත සහන පිළිබඳව නිත්‍ය තක්සේරු වාර්තා ලැබීමෙන් අනතුරුව, දැරීමට සිදුවන සත්‍ය වියදම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා දීමට භාණ්ඩාගාර ලේකම් වෙත බලය පැවරීම

5.3.108.3 සංදේශයේ අංක **05** හි යෝජිත vii අනුව අදාල ඉඩම් කඩිනමින් පවරාගෙන අවශ්‍ය සැලසුම් සකස්කර නිවාස ව්‍යාපෘතියක් කඩිනමින් ඉදිකිරීම සඳහා අදාල බලධාරීන් වෙත නියෝග කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා දීමට භාණ්ඩාගාරය විසින් ක්‍රියා කිරීම

5.3.108.4 සංදේශයේ අංක **05** හි සඳහන් යෝජනා කඩිනමින් ක්‍රියාත්මක කොට පීඩාවට පත් ජනතාවට සහන සැලසීම ප්‍රමුඛ කාර්යයක් ලෙස ඉටු කිරීම සඳහා අදාල සියළු රාජ්‍ය ආයතනවල සහය ලබාදීම සුදුසු බව

5.3.109 ඉහත **5.3.108** හි සඳහන් නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කර තිබුණි.

5.3.110 උමා ඔය ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු හේතු කොටගෙන ඇතිවී ඇති හදිසි ආපදා තත්වය යටතේ ඇතිවී ඇති බවත්, පීඩාවට පත් ජනතාවට කඩිනමින් සහන සැලසීම ප්‍රමුඛ ජාතික කර්තව්‍යයක් සේ සලකා මුදල් අමාත්‍යවරයා එකඟතාවය (ඇමුණුම CIV) පළ කර තිබුණි.

5.3.110.1 තවද භාණ්ඩාගාරයේ අරමුල් කළමනාකරණය පහසු කරවීම සඳහා රේඛීය අමාත්‍යාංශය විසින් ඒක් එක් යෝජනාවක් සම්බන්ධයෙන් විධිමත් වියදම් ඇස්තමේන්තු සකස් කර, ඉඩම් සම්බන්ධව නිත්‍ය තක්සේරු වාර්තා ලබාගෙන මුළු පිරිවැය ඇස්තමේන්තුවක්

සලකා බැලීම සඳහා හැකිතාක් ඉක්මනින් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම යෝග්‍ය බවද එහිදි මුදල් අමාත්‍යවරයා විසින් වැඩිදුරටත් සඳහන් කර තිබුණි.

5.3.111 ඉහත සඳහන් සංදේශයට **2017** ජනවාරි **12** දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී පහත පරිදි අනුමැතිය (ඇමුණුම CV) ලබාදී තිබුණි.

5.3.111.1 සංදේශයේ සඳහන් යෝජනා අංක I,II,III හා IV සඳහා අනුමැතිය ලබාදීම.

5.3.111.2 මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සැලකිල්ලට ගෙන විස්තරාත්මක පිරිවැය ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ලේකම්ට ප්‍රකාශ කිරීම.

5.3.112 **2017** ජුනි මස **27** දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී (ඇමුණුම CVI) උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ උමං මාර්ග ඉදි කිරීම හේතුවෙන් ප්‍රදේශවාසීන්ට මුහුණ පෑමට සිදුව ඇති දුෂ්කරතා අමාත්‍ය මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදී. මේ පිළිබඳව අදහස් දක්වමින්, මෙම කරුණ සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා, මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස තමන් විසින් විදේශීය විශේෂඥ කමිටු දෙකකට **(02)** ආරාධනා කරනු ලැබ ඇති බව අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී. මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අදාළ ප්‍රදේශයේ සංචාරය කොට, ප්‍රදේශවාසීන්ගේ, ව්‍යාපෘතියේ අදාළ නිලධාරීන්ගේ හා අනෙකුත් අදාළ පාර්ශවයන්ගේ අදහස් ලබාගෙන, සලකා බැලීම පිණිස, සති දෙකක් **(02)** තුළ අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිසි පහත සඳහන් අමාත්‍යවරුන්ගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවක් පත් කිරීමට තීරණය කරන ලදී.

මහින්ද අමරවීර මැතිතුමා, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍ය - (සභාපති)

පාඨලී චම්පික රණවක මැතිතුමා, මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය, සහ

විජිත් විජයමුණි සොයිසා මැතිතුමා, වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍ය.

5.3.112.1 ප්‍රදේශයේ ජනතාව සමඟ සාකච්ඡා පැවැත්වීම පිණිස ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව වෙත අවශ්‍ය පහසුකම් සම්පාදනය කරන ලෙස, විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍ය ගරු හරින් ප්‍රනාන්දු මැතිතුමාගෙන් ඉල්ලා සිටීමට ද තීරණය කරන ලදී.

5.3.112.2 තවද, මෙම තීරණය සම්මත කරනු ලැබූ සේ සැලකීමටත්, ඒ අනුව අවශ්‍ය කටයුතු සඳහා අදාළ බලධාරීන් වෙත මෙම තීරණය දන්වා යැවීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ට බලය පැවරීමටත් තීරණය කරන ලදී.

5.3.113 **2017** අගෝස්තු **18** දින උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන උමගේ ඇති වූ ජල කාන්දුව නිසා බලපෑමට ලක්වූ නිවාස හිමියන්ට හදිසි ආපදා තත්ත්වය යටතේ සහන සැලසීම යන මැයෙන් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය හා මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍ය වරයා, මහනගර සභා හා බස්නාහිර සංවර්ධන අමාත්‍යවරයා සහ වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යවරයා සාමාජිකත්වය දරන අනුකමිටුව ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සටහනින් (ඇමුණුම CVII) අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත්කරන ලද **2017** ජූලි **17** දිනැති අමාත්‍ය මණ්ඩල අනුකමිටු වාර්තාව හා ඒ සම්බන්ධ **2017** ජූලි **26** දිනැති අංක **17/1553/704/025** දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ජනතාවට සහන සැලසීමේ කටයුතු වල ප්‍රගතිය අනු කමිටුව විසින් නිරන්තරයෙන් සමාලෝචනය කරන බවත් එහිදී පවත්වනු ලබන සාකච්ඡාවලදී තවදුරටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා පහත සඳහන් නිර්දේශන් ඉදිරිපත් කර තිබුණි.

5.3.113.1 මාතැටිල්ල ඔය දෙපස වර්ෂ ගණනාවක සිට රක්ෂිතයේ වගා කරනු ලැබූ ගොවීන් ද ආපදාවට ලක්ව ඇති බැවින් එම ගොවීන් සඳහා ද වන්දි මුදල් ගෙවීමට හැකිවන සේ මෙම වගා ඉඩම් රක්ෂිත සේ නොසලකා උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියට අදාල වන සේ තක්සේරු කිරීම.

අංක 500, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

2010 ඔක්තෝබර් මස 19 වන දිනදීය.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் அமைச்சு
MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව.

செயலகம், கொழும்பு 01.
இலங்கை

The Secretariat, Colombo 0
Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700

ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11 - 2449823

වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.

මගේ අංකය / எனது இல. / My No.: බීඩී/ජජ 152/7/8

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2010.10.

අමාත්‍ය මණ්ඩල සංදේශය

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ තීරක්ෂණ

අමාත්‍යාංශය : වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ

ශීර්ෂය හා දිනය : උමා ඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතිය
සෙසු පිරිවැය හා යටි ගං පෙදෙස සංවර්ධන ඇස්තමේන්තුව

2010.10.18.

යෝජනා/ඉල්ලීම් : පහත සඳහන් යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කෙරේ.

1. දේශීය අරමුදල් යොදා ගනිමින් ඉටුකිරීමට අපේක්ෂිත සෙසු පිරිවැය යටතේ වූ වැඩකොටස් හා යටි ගං පෙදෙස සංවර්ධන කටයුතු සඳහා රුපියල් 15,474,250,000 ක් වූ ඇස්තමේන්තුව

2. එකී ඇස්තමේන්තුවට අනුව මධ්‍යකාලීන වියදම් රාමුව 2011-2013 යටතේ පහත සඳහන් අයුරින් වැය දැරීම

වර්ෂය	2011	2012	2013
ප්‍රතිපාදන රු.මිලියන	2,664	3,988	5,327

තීරක්ෂණ : යෝජනා සඳහා එකඟවෙමි.
කෙසේ වුවද, මුළු පිරිවැය ඇස්තමේන්තුව ඇතුළත, දේශීය අරමුදල් යොදා ගනිමින්, ව්‍යාපෘතියේ ඉටු කිරීමට අපේක්ෂිත සෙසු පිරිවැය යටතේ වූ වැඩකොටස් හා යටි ගං පෙදෙස සංවර්ධන කටයුතු සඳහා, අදාළ ප්‍රගතිය සැලකිල්ලට ගනිමින්, මධ්‍යකාලීන වියදම රාමුව යටතේ ප්‍රතිපාදන ලබා දීමට එකඟවෙමි.

මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය

රහසිගතයි.

පිටපත්: ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
මු. හා ක්‍ර./ලේ.
විගණකාධිපති.

මගේ අංකය: අමප/10/2536/413/017-I
2010 නොවැම්බර් මස 04 දින,
කොළඹ, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේදී ය.

වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්.

උමා ඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතිය -
සෙසු පිරිවැය හා යටි ගං පෙදෙස
සංවර්ධන ඇස්තමේන්තුව

(වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2010.10.18 දිනැති සංදේශය)

2010 ඔක්තෝබර් මස 27 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමග එවා ඇත.

එල්.පී.ජයම්පති,
අතිරේක ලේකම්.

අ.කළේ/එස්.අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

(ආ) න්‍යාය පත්‍රයේ විෂයයන්:

(I) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා:

07. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 10/2536/413/017-I වූ, "උමා ඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතිය - සෙසු පිරිවැය හා යටි ගං පෙදෙස සංවර්ධන ඇස්තමේන්තුව" යන මැයෙන් වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ ඇමතිතුමා ඉදිරිපත් කළ 2010.10.18 දිනැති සංදේශය - (අමප අංක 10/1744/413/017 පිළිබඳව වූ 2010.08.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළ) ඉහත සංදේශය මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමාගේ නිරීක්ෂණ සමග සලකාබලන ලදුව, මෙකී නිරීක්ෂණවල දක්වා ඇති ආකාරයට අමාත්‍යාංශය විසින් කටයුතු කිරීමට යටත්ව, සංදේශයේ සඳහන් (1) සහ (2) යෝජනා සඳහා අනුමැතිය දෙන ලදී.

ක්‍රියා කළයුතු: වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය - මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමාගේ නිරීක්ෂණ යාකොට ඇත.

පිටපත: මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

(B) Agenda Items:

(I) Cabinet Papers

07. Cabinet Paper No.10/2536/413/017-I, a Memorandum dated 18.10.2010 by the Minister of Irrigation and Water Resources Management on "Uma Oya Multipurpose Development Project - Cost Estimate for Downstream Development and other costs related to headworks" - (Cabinet decision dated 11.08.2010 on CP No.10/1744/413/017 refers) the above Memorandum was considered along with the observations of the Minister of Finance and Planning and subject to Ministry taking action as indicated in these observations, approval was granted to the proposals (1) and (2) in the Memorandum.

Action by: My/Irrigation and Water Resources Management – observations of the Minister of Finance and Planning annexed.

Copied to: My/Finance and Planning

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
අමාත්‍ය මණ්ඩල සංදේශය

අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය : අමා.ම.සං/05/2012 අමාත්‍යාංශ යොමු අංකය : IW/PL/04/12 vol viii

ව්‍යාපෘති අධ්‍යක්ෂට සහාය වීම සඳහා උපදේශකයින් පත් කිරීම
උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය

මූලස්ථායී වැඩ සහ යටිගං සංවර්ධන වැඩ යනුවෙන් ප්‍රධාන සංරචක දෙකකින් උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සමන්විත වේ.

වැලිමඩ ප්‍රදේශයේ පුහුල් පොල හා ඩයරබා යන ස්ථාන වල වේලි 2 ක් ඉදිකිරීම ඝන මීටර් මිලියන 145 ක් ජලය වාර්ෂිකව ලංකාවේ ගිණිකොන වියලි ප්‍රදේශයට ජලය හැරවීම සඳහා කි. මී. 23 ක් දිග උමගක් තැනීම මූලස්ථායී වැඩ යටතේ ඉදි කරනු ලැබේ.

ගිණිකොණ වියලි කලාපයේ අළුතින් හෙක්ටයාර් 4500 ක් හා දැනට වගා කරන ඉඩම් හෙක්ටයාර් 1500 දෙකන්නය සඳහා වාරි පහසුකම් සැලසීම යටිගං සංවර්ධන සංරචකය යටතේ ලැබෙන ප්‍රතිලාභ වේ. තවද ව්‍යාපෘතිය මගින් මෙගා වොට් 120 ක ධාරිතාවයකින් යුත් ගෙගා වොට් පැය 231 විදුලි බල උත්පාදනයක් ජාතික විදුලි බල පද්ධතියට එකතු කිරීමටද අපේක්ෂිත ප්‍රතිලාභ වලට අයත්වේ.

උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වැය වන මුළු පිරිවැය ඇමරිකානු ඩොලර් 529,059,108 සහ රු. 15,474,250,000 කි.

වැඩි විස්තර හා ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය ඇමුණුම් i මගින් දක්වා ඇත.

ව්‍යාපෘති කළමනාකරණය

දැනට ව්‍යාපෘතිය විශේෂ ක්ෂේත්‍ර සඳහා පත් කරන ලද උප ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත සීමිත කාර්ය මණ්ඩලයක සහාය ඇතිව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් කළමනාකරණය කරනු ලැබේ.

ව්‍යාපෘතියේ සැලසුම්ගත ඉදිරි ඉලක්ක සපුරා ගැනීමේ අරමුණින් ඇමුණුම් ii ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂට පලපුරුදු වෘත්තිකයින්ගේ සේවය අත්‍යවශ්‍ය කරුණකි.

එහෙයින් දේශීය හා විදේශීය උපදේශක සේවා ආයතනයක සේවාව විශේෂයෙන් ඇමුණුම් ii දක්වා ඇති කාර්යය ඉටුකර ගැනීම සඳහා ලබා ගැනීම අත්‍යවශ්‍ය කරුණකි.

උපදේශක සේවාවේ වියදම අවම කිරීම සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරමි.

(i) ව්‍යාපෘති කණ්ඩායමේ ප්‍රධාන තනතුරු එනම් කණ්ඩායම් නායක, නේවාසික ඉංජිනේරු (සිවිල්)" නේවාසික ඉංජිනේරු (විදුලි - යාන්ත්‍රික) හා නේවාසික ඉංජිනෙරු (ජල - යාන්ත්‍රික) සඳහා පමණක් උපදේශක සේවා ලබා ගැනීම.

(ii) විදුලි - යාන්ත්‍රික හා ජල - යාන්ත්‍රික ක්ෂේත්‍ර වල සේවා සඳහා අවශ්‍ය තාක්ෂණික කාර්ය මණ්ඩල ලංකා විදුලි බල මණ්ඩලයෙන් ලබා ගැනීම. ව්‍යාපෘතිය සඳහා අනුයුක්ත කරනු ලබන එම කාර්ය මණ්ඩල වැටුප් ලංකා විදුලි බල මණ්ඩලය විසින් දරනු ලැබේ.

(iii) සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය තාක්ෂණික කාර්ය මණ්ඩලය සුදුසුකම් ලත් පලපුරුදු අමාත්‍යාංශයේ ආයතන වලින් ලබා ගැනීමට නොහැකි නම් දේශීයව ලබා ගැනීම.

(iv) උපදේශක සේවා ආයතනය සඳහා අවශ්‍ය අනෙකුත් කාර්ය මණ්ඩල හා අනෙකුත් අවශ්‍යතා සඳහා සුදුසුකම් ලත් පලපුරුදු කාර්ය මණ්ඩල අමාත්‍යාංශයේ වෙනත් ආයතන වලින් ලබා ගැනීමට නොහැකි නම් දේශීයව ලබා ගැනීම.

කැබිනට් තීරණ CP/10/2536/413/017 – 1 හා 2010.11.04 මගින් ව්‍යාපෘතිය සඳහා අනුමත ඇමරිකානු ඩොලර් 529,059,198 හා රු. 15,474,250,000 මුළු ඇස්තමේන්තුව තුල ව්‍යාපාර කළමනාකරණය සඳහා වෙන්ව ඇති උප විෂය යටතේ දේශීය හා අන්තර්ජාතික උපදේශක සේවා ලබා ගැනීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේ.

<u>අනුමැතිය</u>

එහෙයින්, උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ වැඩ බිම් නියෝජිත ඉංජිනේරු වශයෙන් කටයුතු කිරීම සඳහා අන්තර්ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රම වේදය අනුගමනය කරමින් අන්තර්ජාතික හෝ දේශීය උපදේශක සේවා ආයතනයකින් පහත දැක්වෙන පරිදි සේවා ලබා ගැනීම සඳහා

(i) ප්‍රධාන තනතුරු එනම් කණ්ඩායම් නායක, නේවාසික ඉංජිනේරු (සිවිල්), නේවාසික ඉංජිනේරු (විදුලි යාන්ත්‍රික), නේවාසික ඉංජිනේරු (ජල - යාන්ත්‍රික) වැනි තනතුරු සඳහා උපදේශක සේවා ලබා ගැනීම.

(ii) උපදේශක සේවා ආයතනයට සහය වීම සඳහා විදුලි - යාන්ත්‍රික, ජල - යාන්ත්‍රික වැනි ක්ෂේත්‍ර වල තාක්ෂණික කාර්ය මණ්ඩලය ලංකා විදුලි බල මණ්ඩලය ලබා ගැනීම.

(iii) සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය තාක්ෂණික කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය, අමාත්‍යාංශය තුල ඇති ආයතන වල සිටින සුදුසුකම්ලත් පුහුණු කාර්ය මණ්ඩලයෙන් ලබා ගත නොහැකි නම් දේශීයව ලබා ගැනීම.

(iv) උපදේශක කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය අවශේෂ කාර්ය මණ්ඩලය හා වෙනත් අවශ්‍යතා සඳහා ඇවැසි කාර්ය මණ්ඩලය, අමාත්‍යාංශයේ වෙනත් ආයතන වල සුදුසුකම් ලත් පලපුරුදු කාර්ය මණ්ඩලයෙන් සපුරා ගත නොහැකි නම් දේශීයව ලබා ගැනීමට

අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කරමි.

නිමල් සිරිපාල ද සිල්වා
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යංශය
අංක : 500, ටී. බී. ජයා මාවත
කොළඹ 10
2012 පෙබරවාරි මස 16 වන දින දීය

(13)

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் அமைச்சு
MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: ටීඑම්එස්/අයිඩබ්ආර්එම්/සීඑම්
ඔබේ අංකය / உமது இல. / Your No.: 12/0247/508/004
දිනය / திகதி / Date: 2012.02.

අමාත්‍ය මණ්ඩල සංදේශය

<u>මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ නිර්දේශය</u>

අමාත්‍යාංශය : වාරිමාර්ග හා රාජ සම්පත් කළමනාකරණ

ශීර්ෂය හා දිනය : ව්‍යාපෘති අධ්‍යක්ෂට සහාය වීම සඳහා උපදේශකයින් පත් කිරීම
උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය
2012.02.16

යෝජනා/ඉල්ලීම් : පහත සඳහන් යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කෙරේ.

(i) ප්‍රධාන තනතුරු එනම් කණ්ඩායම් නායක, තෙවාසික ඉංජිනේරු (සිවිල්), තෙවාසික ඉංජිනේරු (විදුලි යාන්ත්‍රික), තෙවාසික ඉංජිනේරු (ජල - යාන්ත්‍රික) වැනි තනතුරු සඳහා උපදේශක සේවා ලබා ගැනීම

(ii) උපදේශක සේවා ආයතනයට සහාය වීම සඳහා විදුලි - යාන්ත්‍රික, ජල - යාන්ත්‍රික වැනි ක්ෂේත්‍රවල තාක්ෂණික කාර්ය මණ්ඩලය ලංකා විදුලි බල මණ්ඩලය ලබා ගැනීම

(iii) සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය තාක්ෂණික කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය, අමාත්‍යාංශය තුල ඇති ආයතනවල සිටින සුදුසුකම්ලත් පුහුණු කාර්ය මණ්ඩලයෙන් ලබා ගත නොහැකි නම් දේශීයව ලබා ගැනීම

(iv) උපදේශක කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය අවශේෂ කාර්ය මණ්ඩලය හා වෙනත් අවශ්‍යතා සඳහා ඇවැසි කාර්ය මණ්ඩලය, අමාත්‍යාංශයේ වෙනත් ආයතනවල සුදුසුකම් ලත් පලපුරුදු කාර්ය මණ්ඩලයෙන් සපුරා ගත නොහැකි නම් දේශීයව ලබා ගැනීම

නිර්ක්ෂණ : ව්‍යාපෘතිය සඳහා දැනට අනුමත වැය ඇස්තමේන්තුවේ ව්‍යාපෘති කළමනාකරණය උපශීර්ෂය යටතේ වෙන්කර ඇති ප්‍රතිපාදන සීමාව තුළ බඳවා ගැනීමට එකඟවෙමි.

මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය

82

රහසිගතයි.

පිටපත්: ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
මුදල් හා ක්‍රි./ලේ.
රාජ්‍ය පරිපාලන හා
ස්ව.ක./ලේ.
විගණකාධිපති.

මගේ අංකය: අමප/12/0247/508/004
2012 මාර්තු මස 22 දින,
කොළඹ, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේදී ය.

වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්.

ව්‍යාපෘති අධ්‍යක්ෂට සහාය වීම සඳහා උපදේශකයින් පත්කිරීම - උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

(වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2012-02-16 දිනැති සංදේශය)

2012 මාර්තු මස 14 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමග එවා ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු,
අතිරේක ලේකම්.

අ.කළේ/එස්.අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

(ආ) න්‍යාය පත්‍රයේ විෂයයන්:

ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව:

19. **අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 12/0301/558/015 වශයෙන් අංකගත කෙරුණු, අමාත්‍ය මණ්ඩලයේ ලේකම් ඉදිරිපත් කළ 2012-03-01 දිනැති සටහනට යාකොට තිබූ, 2012-02-28 දින පැවැත්වුණු ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ නිර්දේශ අමාත්‍ය මණ්ඩලය විසින් සලකාබලා, පහත සඳහන් තීරණය ගන්නා ලදී:**

(I) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි අමාත්‍ය මණ්ඩලය විසින් ඉටු කළයුතු ආයතන කටයුතු:

19.11 අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 12/0247/508/004 වූ, "**ව්‍යාපෘති අධ්‍යක්ෂට සහාය වීම සඳහා උපදේශකයින් පත්කිරීම - උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය**" යන මැයෙන් වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ ඇමතිතුමා ඉදිරිපත් කළ 2012-02-16 දිනැති සංදේශය - අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ පහත සඳහන් නිර්දේශය සඳහා අනුමැතිය දෙන ලදී:

→2.

"ඉහත සංදේශය මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමාගේ සහ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු ඇමතිතුමාගේ නිරීක්ෂණ සහ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීමේදී වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉදිරිපත් කරන ලද කරුණු සමග සලකාබලන ලදී. මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පහත සඳහන් පරිදි අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ කිරීමට තීරණය කරන ලදී:

(i) 2007-04-05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාර, සංදේශයේ (i), (ii), (iii) සහ (iv) යෝජනාවල සඳහන් කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ හැකියාව පරීක්ෂාකර බලන ලෙස වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත උපදෙස් දීම; හෝ

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාර තෝරා ගනු ලබන උපදේශන ආයතනයක් මගින් සංදේශයේ (i), (ii), (iii) සහ (iv) යෝජනාවල සඳහන් කාර්ය මණ්ඩලයේ අවශ්‍ය සේවය ලබා ගැනීම."

ක්‍රියා කළයුතු: වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය - ඉහත නිරීක්ෂණ යාකොට ඇත.

පිටපත්: මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

(B) Agenda Items:

Cabinet Sub-Committee on Establishment Matters

19. **The recommendations made by the Cabinet Sub-Committee at its meeting held on 2012-02-28, annexed to the Note to the Cabinet dated 2012-03-01 by the Secretary to the Cabinet, numbered as Cabinet Paper No.12/0301/558/015 were considered by the Cabinet and the following decision was taken:**

Establishment Matters to be dealt with by the Cabinet of Ministers in terms of the provisions of the Constitution.

19.11 Cabinet Paper No.12/0247/508/004, a Memorandum dated 2012-02-16 by the Minister of Irrigation and Water Resources Management on "**Uma Oya Multipurpose Development Project - Appointment of Consultant to Assist the Project Director**" - approval was granted to the following recommendation of the Cabinet Sub-Committee:

"the above Memorandum was considered along with the observations of the Ministers of Finance and Planning; and Public Administration and Home Affairs and the representations made by the Secretary, Ministry of Irrigation and Water Resources Management at the Meeting of the Cabinet Sub-Committee. After discussion, it was decided to recommend to the Cabinet:

(i) to instruct the Secretary, Ministry of Irrigation and Water Resources Management to explore the possibility of recruiting the staff referred to in the proposals (i), (ii), (iii) and (iv) in the Memorandum, in terms of MSD Circular No.33 dated 2007-04-05; or

(ii) to obtain the required services of the staff referred to in the proposals (i), (ii), (iii) and (iv) in the Memorandum through a consultancy firm selected in terms of the Procurement Guidelines."

Action by: My/Irrigation and Water Resources Management - above observations annexed.

Copied to: My/Finance and Planning
My/Public Administration and Home Affairs

12	12/0259/503/017	රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන	විශේෂ කාර්ය බලකායට අනුයුක්තව සේවය කරන අනියම් කම්කරුවන් කාර්යාල සහයක III 'අ' පන්තියේ තනතුරු වලට පත් කිරීම	ඉහත 11 හි නිරීක්ෂණය අදාලවේ.
13	12/0247/508/004	වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ	ව්‍යාපෘති අධ්‍යක්ෂට සහායවීම සඳහා උපදේශකයින් පත් කිරීම උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය	භාණ්ඩාගාරයේ නිර්දේශ අනුව ක්‍රියා කිරීමට එකඟ වෙමි.
14	12/0248//518/003	අධිකරණ අමාත්‍යවරයාගේ කාර්යාලය	එස්. ඩී. ජයකොඩි මහතා ඉංජිනේරු උපදේශක තනතුරට නැවත පත් කිරීම	උපදේශක තනතුර අනුමත තනතුරක් නොවන හෙයින් අදාල අමාත්‍යාංශයේ ලේකම්ගේ නිරීක්ෂණය ලබා ගැනීමෙන් පසුව තීරණයක් ගැනීම මැනවි.
15	12/0255/523/013	රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු	රජයේ ප්‍රමුඛතා කාර්යයන් සඳහා බඳවා ගන්නා ලද උපාධිධාරීන්ගේ ආයතනික හා සේවා ගැටළු විසඳීම	-
16	12/0250/525/002	තැපැල් සේවා	ඒකාබද්ධ තැපැල් සේවයේ 'ආ' කාණ්ඩයේ I 'ආ' ශ්‍රේණියේ (තැපැල් සේවා නිලධාරී) තනතුරේ ස්ථිර කිරීම	අනුමත සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන වලට පරිබාහිර ආකාරයෙන් බඳවා ගැනීමට එකඟ නොවෙමි. එසේම මෙම තනතුරු වලට බඳවා ගැනීම් විෂය පථය රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අයත් හෙයින් එම කොමිෂන් සභාව වෙත යොමු කිරීම මැනවි.
17	12/0249/528/003	ළමා සංවර්ධන හා කාන්තා කටයුතු	පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස් තනතුරට පත් කිරීම එම්. යමුනා පෙරේරා මහත්මිය	එකඟ වෙමි.
18	12/0241/532/007	ධීවර හා ජලජ සම්පත් සංවර්ධන	ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගේ උපදේශක ආචාර්ය එස්. සුබසිංහ මහතාගේ සේවා කාලය දීර්ඝ කිරීම	එකඟ වෙමි.
19	10/2843/441/049	ඉඩම් හා ඉඩම් සංවර්ධන	ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කිරීම	ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා එකඟ වෙමි.
20	12/0260/547/006	සංස්කෘතික හා කලා කටයුතු	බටලීය අනුරු නිකේතනයේ කැටයම් කටයුතු සඳහා උපදේශක අධ්‍යක්ෂවරයෙක් පත් කිරීම	මෙම අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව අදාල අමාත්‍යාංශයේ ලේකම්ගේ නිරීක්ෂණය ලබා ගැනීමෙන් පසුව තීරණයක් ගැනීම මැනවි.
21	11/2167/547/024	සංස්කෘතික හා කලා කටයුතු	සිංහල විශ්වකෝෂ කාර්යාලයේ සහ සිංහල ශබ්ද කෝෂ කාර්යාලයේ සේවයේ නියුතු බාහිර කර්තෘවරුන් හා විශ්‍රාමික ශෝධ්‍යපත්‍ර පාඨක සඳහා දෛනික දීමනා ගෙවීම	ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා එකඟ වෙමි.

(අ) උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියට අනුයුක්ත කර තිබෙන ස්ථිර කාර්ය මණ්ඩලය

	නිලධාරියාගේ නම	තනතුර	ස්ථිර සේවා ස්ථානය	ව්‍යාපෘතියේ පත්වීමේ දිනය	මාසික වැටුප් දීමනාව (රු.)	ව්‍යාපෘතියේ සේවා ස්ථානය	බඳවා ගැනීමේ පදනම
1	ඉංජි. පී. එල්. එන්. පුරනෙගෙදර	නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	01/01/2014	92,500.00	නි. ව්‍යා. අ. කාර්යාලය	පූර්ණ කාලීන
2	ඉංජි. ජී. මුගුන්දන්	ජ්‍යෙෂ්ඨ සිවිල් ඉංජිනේරු	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	01/01/2013	90,000.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	පූර්ණ කාලීන
3	ඉංජි. එච්. එම්. පී. එස්. ඩී. හේරත්	නේවාසික ඉංජිනේරු	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	01/01/2014	77,500.00	නේවාසික ඉංජිනේරු කාර්යාලය	පූර්ණ කාලීන
4	ඉංජි. වයි. එම්. එන්. යු. බුද්ධික	නේවාසික ඉංජිනේරු	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	01/01/2014	77,500.00	නේවාසික ඉංජිනේරු කාර්යාලය	පූර්ණ කාලීන
5	ඉංජි. එච්. ඩබ්. එන්. චින්තක	නේවාසික ඉංජිනේරු	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	01/01/2014	66,250.00	නේවාසික ඉංජිනේරු කාර්යාලය	පූර්ණ කාලීන
6	ආර්. ඒ. ඩී. චන්ද්‍රසිරි	ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	04/08/2016	52,500.00	පහළ නිමන සංවර්ධනය	පූර්ණ කාලීන
7	ඩී. එම්. පී. කේ ගුණසේකර	ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	04/08/2016	52,500.00	පහළ නිමන සංවර්ධනය	පූර්ණ කාලීන
8	සී. ජේ. කස්තුරිආරච්චි	ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	01/01/2014	17,800.00	ප්‍ර. නේවාසික ඉංජිනේරු කාර්යාලය	පූර්ණ කාලීන
9	ඩී. බී. යු. විතාන	ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	01/01/2014	17,800.00	ප්‍ර. නේවාසික ඉංජිනේරු කාර්යාලය	පූර්ණ කාලීන
10	කේ. ටී. ඩී. ඩී. පී. වර්ණකුලසූරිය	ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	01/16/2014	17,800.00	ප්‍ර. නේවාසික ඉංජිනේරු කාර්යාලය	පූර්ණ කාලීන
11	එම්. එල්. ආර්. ප්‍රනාන්දු	ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	01/01/2014	17,500.00	ප්‍ර. නේවාසික ඉංජිනේරු කාර්යාලය	පූර්ණ කාලීන
12	ආර්. ඒ. එස්. සම්පත්	තාක්ෂණ නිලධාරී	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	01/01/2014	17,500.00	ප්‍ර. නේවාසික ඉංජිනේරු කාර්යාලය	පූර්ණ කාලීන
13	ඉංජි. ආර්. එම්. පී. යූ. රත්නායක	කණිෂ්ඨ සිවිල් ඉංජිනේරු	මහවැලි සංවර්ධන අධිකාරිය	03/01/2016	52,500.00	මූලස්ථායි වැඩ කාර්යාලය මිරහවත්ත	පූර්ණ කාලීන
14	ඉංජි. අයි. එම්. එල්. වී. ගුණසේකර	කණිෂ්ඨ සිවිල් ඉංජිනේරු	මහවැලි සංවර්ධන අධිකාරිය	03/01/2016	52,500.00	මූලස්ථායි වැඩ කාර්යාලය මිරහවත්ත	පූර්ණ කාලීන
15	ඉංජි. ආර්. පී. එම්. ටී. එස්. බණ්ඩාර	කණිෂ්ඨ සිවිල් ඉංජිනේරු	මහවැලි සංවර්ධන අධිකාරිය	03/01/2016	52,500.00	මූලස්ථායි වැඩ කාර්යාලය මිරහවත්ත	පූර්ණ කාලීන

16	ඒ. ඊ. එම්. ඒ. බණ්ඩාර	කළමනාකරණ සහකාර	මහවැලි සංවර්ධන අධිකාරිය	10/24/2014	36,375.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	පූර්ණ කාලීන
17	එම්. ඊ. එස්. පීරිස්	කළමනාකරණ සහකාර	මහවැලි සංවර්ධන අධිකාරිය	10/24/2014	36,375.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	පූර්ණ කාලීන
18	එම්. ඒ. උදේනි	කළමනාකරණ සහකාර	මහවැලි සංවර්ධන අධිකාරිය	10/24/2014	36,375.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	පූර්ණ කාලීන
19	වයි. එම්. එන්. කපුකොටුව	කළමනාකරණ සහකාර	මහවැලි සංවර්ධන අධිකාරිය	10/24/2014	36,375.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	පූර්ණ කාලීන
20	ආර්. ආර්. කේ. ආර්. ආනන්ද	කළමනාකරණ සහකාර	මහවැලි සංවර්ධන අධිකාරිය	10/24/2014	36,375.00	නේවාසික ඉංජිනේරු කාර්යාලය	පූර්ණ කාලීන
21	ආර්. එම්. එස්. ශාන්ත	කළමනාකරණ සහකාර	මහවැලි සංවර්ධන අධිකාරිය	10/24/2014	36,375.00	නේවාසික ඉංජිනේරු කාර්යාලය - කුඩාඔය	පූර්ණ කාලීන
22	එච්. ඒ. පී. කුමාර	රියදුරු	මහවැලි සංවර්ධන අධිකාරිය	10/24/2014	34,865.00	නේවාසික ඉංජිනේරු කාර්යාලය	පූර්ණ කාලීන
23	එස්. පී. ආර්. මංජුල	රියදුරු	මහවැලි සංවර්ධන අධිකාරිය	10/24/2014	34,865.00	ජනතා සහන සේවා කාර්යාලය	පූර්ණ කාලීන
24	ජී. වීරසිංහ	රියදුරු	මහවැලි සංවර්ධන අධිකාරිය	10/24/2014	34,865.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	පූර්ණ කාලීන
25	ජී. එල්. දාබරේ	රියදුරු	මහවැලි සංවර්ධන අධිකාරිය	10/24/2014	31,539.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	පූර්ණ කාලීන
26	එච්. පී. එස්. බන්දුල	රියදුරු	මහවැලි සංවර්ධන අධිකාරිය	10/24/2014	31,760.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	පූර්ණ කාලීන
27	එන්. එච්. ආර්. ගුණරත්න	රියදුරු	මහවැලි සංවර්ධන අධිකාරිය	10/24/2014	34,865.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	පූර්ණ කාලීන
28	එම්. ඒ. ආර්. කුරේ	කාර්යාල කාර්ය සහයක	මහවැලි සංවර්ධන අධිකාරිය	10/24/2014	30,485.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	පූර්ණ කාලීන

.....

ආචාර්ය. ඉංජි. එන්. එස්. කේ. එන්. ද සිල්වා
ව්‍යාපෘති අධ්‍යක්ෂ
උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

(ආ) උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

කාර්ය මණ්ඩල විස්තරය - 2017-08-17

	නම	තනතුර	පත්වීමේ ස්වභාවය	පත්වීම් දිනය	මාසික වැටුප (රු.)	ව්‍යාපෘතියේ සේවා ස්ථානය
1	*ආචාර්ය. ඉංජි. එන්. එස්. කේ. එන්. ද සිල්වා	ව්‍යාපෘති අධ්‍යක්ෂ	කොන්ත්‍රාත් පදනම	01/20/2009	428,479.90	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
2	ඉංජි. ජී. ඒ. දයාරත්න	නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ	කොන්ත්‍රාත් පදනම	11/01/2008	205,000.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
3	ඉංජි. ආර්. රූපසිංහ	නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ	කොන්ත්‍රාත් පදනම	03/01/2017	205,000.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
4	ඉංජි. පී. යු. වික්‍රමරත්න	ජ්‍යෙෂ්ඨ සිවිල් ඉංජිනේරු	කොන්ත්‍රාත් පදනම	03/01/2017	195,000.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
5	ලාල් කංකානම්ගේ	ගණකාධිකාරී	කොන්ත්‍රාත් පදනම	12/08/2014	162,500.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
6	ඩී. සී. ඒ. එස්. ශාන්ත	ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී	කොන්ත්‍රාත් පදනම	10/03/2016	105,000.00	ලංකා විදුලිබල මණ්ඩලය මිරහවත්ත
7	ඉංජි. කේ. ඒ. එස්.එස්. ක්‍රිෂාන්ත	කණිෂ්ඨ සිවිල් ඉංජිනේරු	කොන්ත්‍රාත් පදනම	09/01/2015	105,000.00	ප්‍ර. නේවාසික ඉංජිනේරු කාර්යාලය
8	ඩබ්. ඒ. එස්. වී. ද කොස්තා	පරිපාලන නිලධාරි	කොන්ත්‍රාත් පදනම	09/28/2016	67,000.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
9	එච්. ඒ. එම්. කරුණාරත්න	කළමනාකරණ සහකාර	කොන්ත්‍රාත් පදනම	05/26/2014	37,634.50	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
10	එම්. එන්. කුමාර	කළමනාකරණ සහකාර	කොන්ත්‍රාත් පදනම	05/26/2014	37,634.50	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
11	අයි. අයි. එම්. ඉද්දගොඩ	කළමනාකරණ සහකාර	කොන්ත්‍රාත් පදනම	05/26/2014	37,634.50	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
12	ඩී. ජී. ආර්. එම්. වන්දිමා	කළමනාකරණ සහකාර	කොන්ත්‍රාත් පදනම	05/26/2014	37,634.50	පහළ නිම්න සංවර්ධනය
13	එස්. ටී. ජී. එස්. තිලකරත්න	කළමනාකරණ සහකාර	කොන්ත්‍රාත් පදනම	17/04/2017	35,202.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
14	ඩබ්. ටී. සී. ඩී. වඩුතන්ත්‍රි	කළමනාකරණ සහකාර	කොන්ත්‍රාත් පදනම	17/04/2017	35,202.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
15	ටී. එම්. කුමාරසිංහ	රියදුරු	කොන්ත්‍රාත් පදනම	17/04/2017	33,990.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

* වැටුප අමාත්‍ය මණ්ඩලය මගින් තීරණය කරන ලදී.

.....

ආචාර්ය. ඉංජි. එන්. එස්. කේ. එන්. ද සිල්වා
ව්‍යාපෘති අධ්‍යක්ෂ
උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

(අ) උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියට අනුයුක්ත කර තිබෙන ස්ථිර කාර්ය මණ්ඩලය - ජනතා සහන සේවා කාර්යාලය

	නිලධාරියාගේ නම	තනතුර	ස්ථිර සේවා ස්ථානය	ව්‍යාපෘතියේ පත්වීමේ දිනය	මාසික වැටුප් දීමනාව (රු.)	ව්‍යාපෘතියේ සේවා ස්ථානය	බඳවා ගැනීමේ පදනම
1	ඩබ්. එම්. පී. විජේකෝන්	සුභසාධන නිලධාරී	ඌව පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යංශය	02/23/2017	68,562.00	ජනතා සහන සේවා කාර්යාලය	පූර්ණ කාලීන
2	ඩබ්. එම්. අයි. බී. විජේකෝන්	සහන සේවා නිලධාරී	ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්ත.	04/24/2017	69,594.00	ජනතා සහන සේවා කාර්යාලය	පූර්ණ කාලීන
3	ආර්. එම්. එස්. ජී. රත්නායක	සහන සේවා නිලධාරී	ඌව පළාත් සභාව	05/17/2017	68,562.00	ජනතා සහන සේවා කාර්යාලය	පූර්ණ කාලීන
4	ටී. ඩබ්. එස්. රොහාන්	පරිපාලන නිලධාරී	ඌව පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව	02/15/2017	22,333.33	ජනතා සහන සේවා කාර්යාලය	අර්ධ කාලීන
5	කේ. ඒ. පී. එම්. විමලසාර	ගිණුම් සහකාර	ඌව පළාත් සභාව	02/20/2017	49,547.00	ජනතා සහන සේවා කාර්යාලය	පූර්ණ කාලීන
6	ඩබ්. ආර්. එම්. ඩී. කුමාර	කළමනාකරණ සහකාර	මහවැලි සං. අධිකාරිය	03/08/2017	35,202.00	ජනතා සහන සේවා කාර්යාලය	පූර්ණ කාලීන
7	ඩබ්. එම්. ඩී. එම්. මධුෂානි	කළමනාකරණ සහකාර	මහවැලි සං. අධිකාරිය	06/16/2017	41,486.00	ජනතා සහන සේවා කාර්යාලය	පූර්ණ කාලීන

.....

ආචාර්ය. ඉංජි. එන්. එස්. කේ. එන්. ද සිල්වා
ව්‍යාපෘති අධ්‍යක්ෂ
උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

(ආ) උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය - ජනතා සහන සේවා කාර්යාලය

කාර්ය මණ්ඩල විස්තරය - 2017-08-17

	නම	තනතුර	පත්වීමේ ස්වභාවය	පත්වීම් දිනය	මාසික වැටුප (රු.)	ව්‍යාපෘතියේ සේවා ස්ථානය
1	පී. බී. අමරසේකර	නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ	කොන්ත්‍රාත් පදනම	01/20/2017	185,000.00	ජනතා සහන සේවා කාර්යාලය
2	ඉංජි. එස්. බී. විජේතුංග	ජ්‍යෙෂ්ඨ සිවිල් ඉංජිනේරු	කොන්ත්‍රාත් පදනම	02/01/2017	180,000.00	ජනතා සහන සේවා කාර්යාලය
3	ඩී. කේ. විජේවර්ධන	ජීවනෝපාය සංවර්ධන නිලධාරී	කොන්ත්‍රාත් පදනම	02/01/2017	67,000.00	ජනතා සහන සේවා කාර්යාලය
4	ඩී. එම්. ටී. දිසානායක	ජීවනෝපාය සංවර්ධන නිලධාරී	කොන්ත්‍රාත් පදනම	02/01/2017	67,000.00	ජනතා සහන සේවා කාර්යාලය
5	යූ. ජී. එල්. එම්. කුමාරි	කළමනාකරණ සහකාර	කොන්ත්‍රාත් පදනම	04/17/2017	35,202.00	ජනතා සහන සේවා කාර්යාලය
6	කේ. එම්. ලොකුබණ්ඩා	රියදුරු	කොන්ත්‍රාත් පදනම	02/13/2017	33,990.00	ජනතා සහන සේවා කාර්යාලය
7	වී. ශිවානන්දම්	රියදුරු	කොන්ත්‍රාත් පදනම	02/13/2017	33,990.00	ජනතා සහන සේවා කාර්යාලය
8	ඩබ්. එම්. සී. එන්. බී. වීරසේකර	රියදුරු	කොන්ත්‍රාත් පදනම	06/01/2017	33,990.00	ජනතා සහන සේවා කාර්යාලය

.....

ආචාර්ය. ඉංජි. එන්. එස්. කේ. එන්. ද සිල්වා

ව්‍යාපෘති අධ්‍යක්ෂ

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘති සේවය අවසන් කරන ලද කාර්ය මණ්ඩල විස්තරය

	නම	තනතුර	පත්වීම් දිනය	අස්වූ දිනය	මූලික වැටුප (රු.)	ව්‍යාපෘතියේ සේවා ස්ථානය	සටහන්
1	ඉංජි. එච්. බී. ජයසේකර	ව්‍යාපෘති අධ්‍යක්ෂ	02/21/2008	02/21/2009	110,000.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	සේවා කාලය අවසන් වීම.
2	ඉංජි. පී. වී. පී. සී. පෙරේරා	නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ - ඉංජිනේරු	02/21/2008		50,000.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	
3	ඉංජි. ඒ. කේ. ඩී. එන්. අතුකෝරළ	නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ - ඉංජිනේරු	02/01/2010	10/31/2015	110,000.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	ඉල්ලා අස්වීම
4	ඒ. ඉද්දමල්ගොඩ	කළමනාකරු - මානව සම්පත් හා පරිපාලන	10/01/2009	05/13/2014	60,000.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	සේවා කාලය අවසන් වීම.
5	ජේ. එම්. ජී. ඉඳුනිල්	සිවිල් ඉංජිනේරු	05/02/2014	31/01/2015	45,000.00	ක්ෂේත්‍ර කාර්යාලය - කරඳගොල්ල	නොදන්වා සේවය අතහැර යාම
6	කේ. එච්. අයි. කේ. අමරසිංහ	කළමනාකරණ සහකාර	10/01/2009	02/26/2010	13,990.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	ඉල්ලා අස්වීම
7	යූ. කේ. ඩී. ආර්. පෙරේරා	කළමනාකරණ සහකාර	10/01/2009	10/01/2013	13,990.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	ඉල්ලා අස්වීම
8	ජේ. යූ. ලියනගේ	කළමනාකරණ සහකාර	05/26/2014	05/28/2014	13,990.00	ප්‍ර. ඉංජිනේරු කාර්යාලය තණමල්විල	නොදන්වා සේවය අතහැර යාම
9	එස්. එම්. ජී. ලියනගේ	කළමනාකරණ සහකාර	04/15/2010	11/14/2014	13,990.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	ඉල්ලා අස්වීම
10	ඊ. ඩී. සී. සංජීව	ගිණුම් ලිපිකරු	03/01/2009	06/25/2012	13,120.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	ඉල්ලා අස්වීම
11	බී. ජී. ඩබ්. කුමාර	රියදුරු	11/04/2013	01/05/2014	12,470.00	ක්ෂේත්‍ර කාර්යාලය - කරඳගොල්ල	ඉල්ලා අස්වීම
12	අයි. එන්. ප්‍රනාන්දු	රියදුරු	05/23/2009		12,470.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	සේවා කාලය අවසන් වීම.
13	එම්. බී. ජයසේන	රියදුරු	07/07/2009	07/07/2010	12,470.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	සේවා කාලය අවසන් වීම.
14	බී එම්. සමන්	රියදුරු	02/01/2009	04/12/2010	12,470.00	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	නොදන්වා සේවය අතහැර යාම

15	ඩී. දිසානායක	රියදුරු	11/04/2013	21/05/2015	12,470.00	ක්ෂේත්‍ර කාර්යාලය - කරඳගොල්ල	ස්ථාන මාරුවීම
16	ඩබ්. එන්. එම්. වීරසිංහ (MASL)	කාර්යාල කාර්ය සහයක	02/16/2015	07/19/2015	...	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	සේවයෙන් විශ්‍රාම ගැන්වීම.

.....

ආචාර්ය. ඉංජි. එන්. එස්. කේ. එන්. ද සිල්වා
ව්‍යාපෘති අධ්‍යක්ෂ
උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
අමාත්‍ය මණ්ඩල සංදේශය

අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය: වාරි/අමා.සං/ 18 /2012. අමාත්‍යාංශ යොමු අංකය: අයිඇන්ඩබ්ආර්-එම්/ඩී/ඩිඒ(1)/පී/සීඒඑම්

<u>උමාඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතියට අදාල ඉදිකිරීම් සඳහා දේපළ අත්කර ගැනීම හේතුවෙන් බලපෑමට ලක්වන පවුල් සඳහා සහන සැලසීම.</u>

ඉරාන ඉස්ලාමීය ජනරජයේ ආධාර ඇතිව ක්‍රියාත්මක කරනු ලබන උමාඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ ඇමතිතුමා විසින් 2008.02.12 දාතමින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සැලකිල්ලට ගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2008.02.20 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී ඇත.

මෙම ව්‍යාපෘතිය මඟින් පුහුල්පොල, ඩයිරබා, අලිකොට ආර, කුඩාඔය නමින් ජලාශ හතරක් (04) අළුතින් ඉදිකරනු ලබන අතර, හඳපානාගල ජලාශයේ ජල ධාරිතාවද වැඩිකරනු ලැබේ. තවද, පවතින වාරි පද්ධති, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමද , දිගින් කි. මී. 23 ක් වූ උමං පද්ධතියක් හා භූගත ජල විදුලි බලාගාරයක් ඉදිකිරීමටද යෝජිත අතර, එමඟින් මෙගාවොට් 120 ක්ද, ජාතික විදුලිබල පද්ධතියට එකතුකරනු ලැබේ. එමඟින් ජල විදුලිය ජනනය කිරීමෙන් පසු මුදාහරින ජලය වෙල්ලස්ස ප්‍රදේශයේ හා රුහුණුකරයේ උග්‍ර ජල හිඟයෙන් පීඩා විඳින ජනතාවට සහන සැලසීම සඳහාත් කෘෂිකාර්මික කටයුතු සඳහාත් යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් සම්බන්ධයෙන් ඉරාන පරාබ් සමාගම සමඟ ඇතිකරගත් ගිවිසුම අනුව 2010 මාර්තු 15 වන දින ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් කටයුතු ආරම්භ කරන ලදුව, 2015 වර්ෂයේදී අදාල ඉදිකිරීම් කටයුතු අවසන් කල යුතුව ඇත. මේ අනුව, වසර 05 ක් වැනි සීමිත කාලයක් තුල ව්‍යාපෘතියේ පහත සඳහන් ප්‍රධාන කාර්යයන් නිම කරමින්, ව්‍යාපෘතියේ වැඩ අවසන් කල යුතුව තිබේ.

i. ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් කිරීම.
ii. එම ශක්‍යතා අධ්‍යයනය අනුව පාරිසරික ඇගයීම් කටයුතු සිදුකර, අවශ්‍ය අනුමැතිය ලබාගැනීම හා ඊට අදාල කොන්දේසි ක්‍රියාත්මක කිරීම.
iii. ව්‍යාපෘතියේ සැලසුම්ගත ඉදිකිරීම් සඳහා ඉඩම් අත්කර ගැනීම හා බලපෑමට ලක්වන පුද්ගලයින් නැවත පදිංචි කිරීම.
iv. ඉහත iii හි සඳහන් කාර්යයන් නිමකරන අතරතුර, ව්‍යාපෘතියේ ඉදිකිරීම්ද ක්‍රියාත්මක කරමින් 2015 වසර තුලදී ව්‍යාපෘතියේ වැඩ නිම කිරීම.

අදාල ඉදිකිරීම් කඩිනම් කිරීමද අත්‍යාවශ්‍ය වූ නිසා, ඉඩම් අත්කර ගැනීමේ සමාන්‍ය ක්‍රියා පරිපාටිය අනුගමනය කරන අතර තුර, හැකි සෑම අවස්ථාවකදීම අදාල ඉඩම් හිමියන්ගේ එකඟතාවයද ලබාගැනීමෙන් අනතුරුව මෙම ව්‍යාපෘතියේ පහත සඳහන් ඉදිකිරීම් කටයුතු දැනටමත් ඉටුකර ඇත.

i. කරඳගොල්ල උමං පිවිසුම් ප්‍රවේශ මාර්ගය (TBM Access Road) හා ඒ ආශ්‍රිත ඉදිකිරීම්.

ii. මඩුගස්තලාව කොන්ත්‍රාත්කරුගේ කඳවුරු භූමිය ඉදිකිරීම.

iii. ඉළුක් අරාව විදුලි බලාගාරය තෙක් වූ ප්‍රධාන උමං ප්‍රවේශ මාර්ගය (MAT) හා ඒ ආශ්‍රිත ඉදිකිරීම්.

iv. ඩයරබා වේල්ල පිවිසුම් මාර්ගය හා ජලාශය දෙපස උමං දොරටු ප්‍රවේශ මාර්ග ඉදිකිරීම.

v. උමං පිටවුම් ප්‍රවේශ දොරටුව (Trailrace tunnel portal) හා උමං පිටවුම් ප්‍රවේශ මාර්ගය (Tailrace tunnel portal access road) ඉදිකිරීම.

මෙම හදිසි වැඩ කොටස් කරගෙන යාමට අවශ්‍ය ඉඩම් නිදහස් කරගනු ලැබුවේ, එම ඉඩම් කොටස් වල තිබූ වගාවන් සඳහා සංවර්ධිත වටිනාකම පළමුව ලබාදී, ඉඩම් සඳහා වන්දි මුදල් පසුව ලබාදීමට අදාල ඉඩම් හිමියන්ගේ එකඟතාවය ලබාගෙනය. එසේ වුවත්, මෙම ව්‍යාපෘතියේ සියළුම අත්කර ගැනීම් සඳහා මෙම ක්‍රමවේදය කරගෙන යාම ප්‍රායෝගික නොවන බැවින්, තවදුරටත් එලෙස ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම කළ නොහැකිව ඇත. මේ නිසා ව්‍යාපෘතියට අවශ්‍ය ඉතිරි ඉඩම් කොටස් ව්‍යාපෘතියට අත්කර ගැනීම කරන්නේ නම්, එසේ කිරීම සඳහා කඩිනම් වන්දි ගෙවීමේ ක්‍රමයක් සකස් කල යුතුව තිබේ.

ඒ අනුව, ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම් වල නිරවුල් භුක්තිය කඩිනමින් ලබාගත යුතු නමුදු, ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන වලට අනුව වන්දි ගෙවීමේ කාර්යය සඳහා දිගු කාලයක් ගතවන බැවින්, වන්දි ගෙවීමකින් තොරව එකී ඉඩම් වලින් පදිංචිකරුවන් කඩිනමින් ඉවත් කිරීම ගැටළුවක් වී ඇත. මේ නිසා, ඉදිරි ඉදිකිරීම් කටයුතු සඳහා අත්කර ගතයුතු ඉඩම් වල නිරවුල් භුක්තිය කඩිනමින් ලබාගැනීමට නම්, ඒ සඳහා වන වන්දි ගෙවීම් ද කඩිනම් කල යුතුව ඇත. මේ සඳහා ඉඩම් හිමිකරුවන්ට, අත්කර ගැනීමේ පනතේ විධිවිධාන වලට පරිබාහිරව සහන වන්දි ක්‍රමයක් හඳුන්වා දීම තුළින් කඩිනමින් අදාල ඉඩම් වල භුක්තිය භාරගෙන, අදාල ඉදිකිරීම් සමාගමට එම ඉඩම් භාරදීමට අපේක්ෂා කරමි.

මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් නිසා බලපෑමට ලක්වන මුළු පවුල් සංඛ්‍යාව 714 ක් (ඉහල නිම්නයේ 538, පහල නිම්නයේ 176) පමණ වන අතර, එයට නිවාස 280 ක් ද ඇතුලත් වේ. එසේම, අඳගොවීන් 64 දෙනෙකුගේ පමණ ජීවනෝපායන මාර්ග අහිමි වේ. අත්කර ගැනීමට යෝජිත සියළු ඉඩම් බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක තුළ පිහිටා ඇත. ඒ අනුව, මෙම පිරිස නැවත පදිංචි කරවීමට සිදුවන අතර, උමාඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා සකස් කරන ලද පරිසර ඇගයීම් වාර්තාවෙහිද යෝජනා කර ඇති නිර්දේශයන්ට අනුකූල වන පරිදි නැවත පදිංචි කරවීමේ සැලැස්මක්ද සකස් කල යුතු අතර, එම සැලැස්ම අනුව අදාල පුද්ගලයින් නැවත පදිංචිකල යුතුව තිබේ.

01.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නිසා බලපෑමට ලක්වන ජනතාවට සිදුවන ආර්ථික හා සමාජයීය දුෂ්කරතා මගහැරවීමට අදාලව කටයුතු කල යුතුව ඇත. ඒ අනුව, බලපෑමට ලක්වන ජනතාවගේ පදිංචිය සඳහා ඉඩම් ලබාදීම හා ඉවත් කරනු ලබන නිවාස හා ගොඩනැගිලි වලට ප්‍රතිස්ථානගත පිරිවැයත්, ඉඩම් වල වගාවන් සඳහා සංවර්ධිත වටිනාකමත් ප්‍රමාදයකින් තොරව ලබාදීමට යෝජනා කරනු ලැබේ.

මේ අනුව, ඉඩම් අත්කර ගැනීමේදී හා නැවත පදිංචි කිරීමේ කටයුතු ඉටුකිරීමේදී පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටු කල යුතුව ඇත.

i. අත්කර ගන්නා ඉඩම් සඳහා වර්තමාන වෙළඳපළ වටිනාකම පාදක කරගත් වන්දි මුදලක් කඩිනමින් ගෙවීමට කටයුතු කිරීම.

ii. ඉවත් කරනු ලබන නිවාස හා ඒ ආශ්‍රිත ගොඩනැගිලි සඳහා ප්‍රතිස්ථාන ගත පිරිවැය කඩිනමින් ලබාදීම.

iii. ඉඩම් වල වගාවන් සඳහා සංවර්ධිත වටිනාකම කඩිනමින් ලබාදීම.

iv. නැවත පදිංචි කිරීම සඳහා සුදුසු ඉඩම් කොටස් හඳුනාගෙන, එම ඉඩම් රජයට පවරා ගැනීම හා ඊට අදාල වන්දි ගෙවීම් කඩිනම් කිරීම.

02.

මෙම ඉඩම් අත්කර ගැනීමේ කටයුතු කිරීමේදී අදාල තක්සේරු නිර්ණය කිරීම කඩිනම් කිරීමට කොට්ඨාශ මට්ටමේ කමිටුවක්ද, එම කමිටුව විසින් තීරණය කරනු ලබන තක්සේරුගත පිරිවැයට හෝ සංවර්ධිත වටිනාකමට අදාල වන්දි මුදල පිළිබඳ යමෙකු සෑහීමකට පත් නොවන්නේ නම්, ඔහුට/ඇයට තම අභියාචනයන් ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි දිස්ත්‍රික්ක මට්ටමේ අභියාචනා කමිටුවක් වශයෙන් මට්ටම් දෙකකින් යුතු පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත කමිටු දෙකක් මඟින් ක්‍රියාකරමින්, යෝජිත ඉඩම් අත්කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට යෝජනා කරමි.

➢ <u>තක්සේරු කිරීමේ කමිටුව</u>

1. අදාල බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්. - කමිටු සභාපති.
2. පළාත් තක්සේරුකරු හෝ නියෝජිතයෙක්.
3. දිස්ත්‍රික් මැනුම් අධිකාරී හෝ නියෝජිතයෙක්.
4. උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘති මඟින් නම්කරන නියෝජිතයෙක්.
5. ගොවිජන සේවා ප්‍රාදේශීය සංවර්ධන නිලධාරි.

➢ <u>අභියාචනා කමිටුව.</u>

1. අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් - කමිටු සභාපති.
2. ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරී.
3. ප්‍රධාන තක්සේරුකරුගේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයෙක්.
4. ගොවිජන සේවා සහකාර කොමසාරිස්.
5. උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය මඟින් නම්කරනු ලබන ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවරයෙක්.

ඉහත සඳහන් කමිටු වල සාමාජිකයින් සඳහා එක් ඉඩම් කැබැල්ලක් වෙනුවෙන් එක් සාමාජිකයකුට රු: 250/= බැඟින්ද, එම කමිටුවට අදාල රාජකාරීන්හි නිරතවන විෂය ලිපිකරුට එක් ඉඩම් කැබැල්ලක් වෙනුවෙන් රු: 100/= ක් බැඟින්ද දීමනාවක් ගෙවීමට යෝජනා කරමි.

03.

ඒ අනුව, උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් හේතුවෙන් බලපෑමට ලක්වන පවුල් සඳහා පහත සඳහන් සහන ලබාදීම සුදුසු යැයි යෝජනා කරමි.

i. මූලස්ථායී ඉදිකිරීම් (Head Works) නිසා නිවාස අහිමිවන පවුල් වලින් රජයට අත්කර ගන්නා ඉඩම් ප්‍රමාණය මෙන්ම ඉහල නිම්නයේ පවතින ඉඩම් හිඟයද සැලකිල්ලට ගෙන ඌව පරණගම - මොරගොල්ල වත්ත, වැලිමඩ - ඩයිරබා වතුයායෙන් කොටසක් සහ මිරහවත්ත වතුයාය යන ස්ථාන වලින් උපලේඛනයේ විස්තර කර ඇති පරිදි නිවසක් තනාගැනීමට පර්චස් 10 සිට පර්චස් 40 ක් දක්වා ඉඩම් කොටසක් නිවාස ඉදිකිරීම සඳහා පමණක් ලබාදීම,

ii. පහල නිම්නයේ ඉදිකිරීම් (Down stream development) නිසා බලපෑමට ලක්වන පුද්ගලයින්ගේ අභිමතය පරිදි වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ නයිගල් ආර, තෙලිඋල්ල, අළුත්වෙල හා සියඹලාගුණේ යන ස්ථාන වලින් උපලේඛනයේ විස්තර කර ඇති පරිදි නිවසක් තනාගැනීමට පර්චස් 10 සිට පර්චස් 40 ක් දක්වා ඉඩම් කොටසක් නිවාස ඉදිකිරීම සඳහා පමණක් ලබාදීම,

iii. ඉහල නිම්නයේ සහ පහල නිම්නයේ ගොවිබිම් අහිමි වන පවුල් සඳහා අඳ ගොවියන්ද ඇතුළුව උපරිමය ගොඩ සහ මඩ ඉඩම් අක්කර 02 ක් පහල නිම්නයෙන් ලබාදීම,

iv. මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම පවත්වන ලද සමාජ/ආර්ථික සමීක්ෂණය මඟින් අනාවරණය වී ඇති අනුපවුල් සහ දීර්ඝ කාලීන කුලී නිවැසියන් සඳහා පර්චස් 10 බැගින් ඉඩම් කොටස් ලබාදීමටද, ව්‍යාපාරික ස්ථාන අහිමිවන්නන් සඳහා ඌව පළාත් සභාව තුළ ක්‍රියාත්මක වන අවම ඉඩම් ඒකකයට යටත්ව වාණිජ ඉඩම් ලබාදීම,

v. 1995.06.15 දිනට පෙර රජයේ ඉඩමක් අනවසරයෙන් අල්ලා ගෙන සංවර්ධනය කරමින් පදිංචිව සිටින බව විධිමත් පරිදි තහවුරු කරන්නේ නම්, එම ඉඩම්ද බලපත්‍ර ඇති ඉඩම් සේ සළකා පුද්ගලික ඉඩම් රජයට අත්කර ගැනීමේදී ගෙවනු ලබන ප්‍රතිලාභයන් පනතට හා චක්‍රලේඛ උපදෙස් වලට අදාලව ගෙවීමත්, එසේම අනවසර නියමානුකූල කරනු නොලැබූ රජයේ ඉඩම් හා රක්ෂිත වල දීර්ඝ කාලයක් පදිංචි අනවසර පදිංචි කරුවන්ට රජයේ ප්‍රධාන තක්සේරු විසින් තීරණය කරනු ලබන වන්දි මුදලක් ගෙවීමත් සුදුසු බව යෝජනා කරමි.

4. මෙම යෝජනාවන් ක්‍රියාත්මක කිරීමේදී පවත්නා විධිවිධාන ඉක්මවා කටයුතු කිරීමට සිදුවන බැවින්, පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කරමි.

i. ඉහත අංක 01, 02 සහ 03 යටතේ දක්වා ඇති යෝජනා ක්‍රියාත්මක කිරීම.

ii. එම යෝජනා ක්‍රියාත්මක කිරීමේදී උප ලේඛන අංක I හි සඳහන් කර ඇති අංක 01 සිට 13 දක්වා වන නිර්දේශ අනුව කටයුතු කිරීම.

නිමල් සිරිපාල ද සිල්වා
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය.

නිමල් සිරිපාල ද සිල්වා
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය,
නො: 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.
2012 මැයි මස 30 වැනි දින.

01. ඉහළ නිම්නයේ මූලස්ථායී වැඩ හේතුකොටගෙන (Head Works) නිවාස අහිමිවන පවුල් සඳහා පමණක් පහත සඳහන් පරිදි නිවාස ඉඩමක් ලබාදෙනු ලැබේ.

i. අත්කර ගන්නා ඉඩම් ප්‍රමාණය පර්චස් 0 සිට 10 දක්වා නම්, - පර්චස් 10

ii. අත්කර ගන්නා ඉඩම් ප්‍රමාණය පර්චස් 10 සිට 20 දක්වා නම්, - පර්චස් 20

iii. අත්කර ගන්නා ඉඩම් ප්‍රමාණය පර්චස් 20 සිට ඉහළට නම්, - පර්චස් 40

iv. ඉහල නිම්නයේ ගොවිබිම් අහිමිවන ඉඩම් හිමියන්ට ඉහල නිම්නයෙන් ලබාදුන් නිවාස ඉඩමේ ප්‍රමාණයද ඇතුලත් වන පරිදි පහල නිම්නයෙන් ගොඩ/මඩ ඉඩම්,- අක්කර 02

02. පහළ නිම්නයේ නිවාස අහිමිවන පවුල් සඳහා පහත සඳහන් පරිදි නිවාස ඉඩම් ලබාදෙනු ලැබේ.

i. අත්කර ගන්නා ඉඩම් ප්‍රමාණය පර්චස් 0 සිට 10 දක්වා නම්, - පර්චස් 10

ii. අත්කර ගන්නා ඉඩම් ප්‍රමාණය පර්චස් 10 සිට 20 දක්වා නම්, - පර්චස් 20

iii. අත්කර ගන්නා ඉඩම් ප්‍රමාණය පර්චස් 20 සිට ඉහළට නම්, - පර්චස් 40

iv. අත්කර ගනු ලබන්නේ නිවස සහ ගොවිබිම හෝ ගොවිබිම් පමණක් නම්, ගොඩ/මඩ- ඉඩම්

- උපරිමය අක්කර 02

03. ව්‍යාපෘතිය මඟින් ලබාදීමට යෝජිත නිවාස ඉඩම වෙනුවට, ඉඩම් හිමියාගේ අභිමතය පරිදි වෙනත් නිවාස ඉඩමක් මිලදී ගැනීමට ඉල්ලුම් කරන්නේ නම්, ව්‍යාපෘතිය සඳහා අත්කර ගන්නා ඉඩමේ භුක්තිය නියමිත පරිදි භාරදුන් පසු, ඔහුට මෙම ව්‍යාපෘතියෙන් ලබාදීමට නියමිත ඉඩම් කොටසේ තක්සේරුගත වටිනාකම ලබාගැනීමට ඉඩ ප්‍රස්ථා සලසා දෙනු ලැබේ.

04. උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය මඟින් පවත්වන ලද සමාජ ආර්ථික සමීක්ෂණය මඟින් අනාවරණය වූ, ඉඩම් අත්කර ගැනීම තුළ බලපෑමට ලක්වූ, සින්නක්කර ඉඩම් වල හෝ රජයේ දීමනා පත්‍ර සහිත ඉඩම් වල හෝ, බල පත්‍ර සහිත ඉඩම් වල හෝ පිහිටි නිවාස වල පදිංචි පවුල් සහ අනු පවුල්ද, රක්ෂිත ඉඩම් වල හැර රජයේ ඉඩම් වල 1995.06.15 ට පෙර අනවසරයෙන් පදිංචි ගොවි පවුල් සහ අනු පවුල්ද, අයිතිය ලිඛිතව තහවුරු කර ගැනීමට නොහැකි පරවේනිගත ඉඩම් බවට තහවුරු කෙරෙන ඉඩම් වල පදිංචි පවුල්/අනු පවුල්ද, දීර්ඝ කාලීන කුළී පදනම මත පදිංචිව සිටින කුළී නිවැසියන්ද, මෙම යෝජනා ක්‍රමය යටතේ නිවාස ඉඩමක් ලැබීමට සුදුස්සන් වන අතර, කෘෂිකාර්මික ඉඩමක් අත්කර ගැනීම තුළ ජීවනෝපායන මාර්ග අහිමිවන ඉඩම් හිමියන්ද, අඳ ගොවියන්ද කෘෂිකාර්මික ඉඩමක් ලැබීමට හිමිකම් ලබයි.

05. උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය මඟින් පවත්වන ලද සමාජ ආර්ථික සමීක්ෂණය මඟින් අනාවරණය වූ, බලපෑමට හසුවන ප්‍රදේශයේ ව්‍යාපාරික ස්ථාන පවත්වාගෙන ගිය ව්‍යාපාර හිමියන් සහ කුළී/බදු පදනම මත ව්‍යාපාරික ස්ථාන පවත්වාගෙන ගිය ව්‍යාපාර හිමියන් ඌව පළාත් සභාව තුළ ක්‍රියාත්මක අවම ඉඩම් ඒකකයට යටත්ව, ව්‍යාපෘතිය මඟින් යෝජිත ස්ථානයක වාණිජ ඉඩමක් ලබාගැනීමට හිමිකම් ලබයි.

06. මෙම ව්‍යාපෘතිය මඟින් පවත්වන ලද සමාජ ආර්ථික සමීක්ෂණය මඟින් අනාවරණය වූ බලපෑමට ලක්වන ප්‍රදේශයේ පිහිටි ආගමික ස්ථාන ඉවත් කිරීමට සිදුවන අවස්ථා වලදී, ඒ සඳහා ප්‍රමාණවත් ඉඩම් කොටසක් ප්‍රදානයක් වශයෙන් ලබාදීමට හා අත්කරනු ලබන දේපල සඳහා ප්‍රතිස්ථානගත පිරිවැය සහ වර්තමාන වෙළඳපොළ වටිනාකම පාදක කරගෙන වන්දි මුදල් ලබාදීම.

07. නැවත පදිංචි කරවන පවුලක් සඳහා තාවකාලික නිවසක් ඉදිකර ගැනීමට රු: 30,000/= ක දීමනාවක් සහ වැසිකිළියක් ඉදිකර ගැනීමට රු: 7,500/= ක දීමනාවක් ලබාදීම.

08. අත්කර ගන්නා ලද දේපළ වලට ඇතුලත් ගොඩනැගිලි ද්‍රව්‍ය නැවත පදිංචි කරවනු ලබන **ස්ථානය දක්වා ප්‍රවාහනය** කර ගැනීම සඳහා ප්‍රවාහන දීමනාවක් ගෙවනු ලැබේ. (වර්ග අඩි **500 ට අඩු නිවසක් නම් උපරිම** රු: 5,000/= ද, වර්ග අඩි 500 ට වැඩි නම් උපරිම රු: 10,000/= ද ගෙවීම);

09. නිවස හා/හෝ වාරි වගා ඉඩම හා/හෝ ව්‍යාපාර ස්ථාන අත්කර ගැනීම තුළ ජීවනෝපායන මාර්ග අහිමිවන්නන් සඳහා නිවාස ඉඩමක් හෝ ව්‍යාපාර ස්ථානයක් ලබාදීමෙන් අනතුරුව නිවාස ඉදිකර පදිංචි වීම/ව්‍යාපාරික ස්ථාන ආරම්භ කිරීමේ කාලය සැලකිල්ලට ගෙන ඔවුන්ගේ යැපීම සඳහා මාස 18 කට නොවැඩි කාලයක් සඳහා එක් අයෙකුට මසකට රු: 2,000/= ක් බැගින් එක් පවුලකට උපරිමය මසකට රු: 8,000/= ක් වන සේ දීමනාවක් ලබාදීම.

10. බලපෑමට ලක්වන ප්‍රදේශයේ ස්ථිර පදිංචිය තහවුරු කරගත් නිවාස හිමියන් සඳහා ව්‍යවස්ථාපිත වන්දිය රුපියල් ලක්ෂයකට (රු: 100,000/=) අඩුවන අවස්ථාවේදී, තමා පදිංචි නිවසට වඩා පහසුකම් සහිත නිවසක් තනාගැනීමට කොන්දේසි සහිතව රුපියල් ලක්ෂයක (රු: 100,000/=) මුදලක් ලබාදීම.

11. ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය ගැසට් කිරීමට ප්‍රථම ඉඩම් හිමියන්ගේ එකඟතාවය ලබාගෙන ව්‍යාපෘතියේ හදිසි ඉදිකිරීම් හේතුවෙන් කන්න වගාවන් අහිමිවූ ගොවීන්ට 38 (අ) අතුරු විධානය ගැසට් කල දින දක්වා අත්කර ගත් ඉඩම් ප්‍රමාණය සඳහා පමණක් බලපාන පරිදි අහිමිවූ කන්න ආදායම දීමනාවක් වශයෙන් ලබාදීම.

12. ශාරීරික දුබලතාවයන්ගෙන් පෙලෙන්නන්, ආබාධිත පුද්ගලයින්, වයස අවුරුදු 70 ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ ස්ත්‍රී ගෘහ මූලිකයන් සඳහා විශේෂ වූ යැපීම් දීමනාවක් වශයෙන් මසකට රු: 3,000/= බැගින් උපරිම මාස 06 ක කාලයක් සඳහා ගෙවීම.

13. අත්කර ගන්නා දේපළ වලට අදාලව පිහිටි, සියළුම ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ගස් කොලන් මුදල් ගෙවීමකින් තොරව ඉවත්කර ගැනීමට ඉඩම් හිමියන්ට අයිතිය ලබාදෙනු ඇත. එසේ වුවද, රක්ෂිත සඳහා වෙන්කරන ලද බිම් කොටස් තුළ පිහිටි ගස් කොළන් ඉවත්කර ගැනීමට අවසර නොලැබේ.

RECEIVED FROM: 01143484 20/08 2012 08:07

(9)

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் அமைச்சு
MINISTRY OF FINANCE AND PLANNING

ශ්‍රී ලංකා රජයේ කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.

செயலகம், கொழும்பு 01. இலங்கை

The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700

ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823

වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

අපේ අංකය / எமது இல. / Our No.: PFD/ASD/CM/56

ඔබේ අංකය / உமது இல. / Your No.: 12/0747/508/018

දිනය / திகதி / Date: 2012.06.

අමාත්‍ය මණ්ඩල සංදේශය
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ නිර්දේශය

අමාත්‍යාංශය : වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ

ශීර්ෂය හා දිනය : උමාඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතියට අදාල ඉදිකිරීම් සඳහා දේපළ අත්තර ගැනීම හේතුවෙන් බලපෑමට ලක්වන පවුල් සඳහා සහන සැලසීම
2012.05.30

යෝජනා/ඉල්ලීම් : පහත සඳහන් යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කෙරේ.

1. අමාත්‍ය මණ්ඩල සංදේශයේ අංක 01, 02, සහ 03 යටතේ දක්වා ඇති යෝජනා ක්‍රියාත්මක කිරීම.

2. එම යෝජනා ක්‍රියාත්මක කිරීමේදී උප ලේඛන අංක 1 හි සඳහන් කර ඇති අංක 01 සිට 13 දක්වා වන නිර්දේශ අනුව කටයුතු කිරීම.

නිරීක්ෂණ :

1. මෙම අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් යෝජනා කොට ඇති තක්සේරු කමිටුව සඳහා පළාත් ඉඩම් කොමසාරිස්ගේ නියෝජිතයෙක් ඇතුලත් කිරීමද අගියාවනා කමිටුවේ සභාපති ලෙස දිස්ත්‍රික් ලේකම් වෙනුවට වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු ද, තව සාමාජිකයෙකු ලෙස ඉඩම් අමාත්‍යාංශයේ රෝහණ නියෝජිතයෙක් ඇතුළත් කිරීම යෝග්‍ය බව නිරීක්ෂණය කරමි. එක් සාමාජිකයෙකු බැගින් මෙම කමිටු දෙක සඳහා වැඩිවීම තුළින් ඇතිවන පිරිවැය කළමනාකරණය කිරීමට එක් ඉඩම් කැබැල්ලක් වෙනුවෙන් එක් සාමාජිකයෙකුට ගෙවන රු.250ක මුදල රු.200ක් ලෙස සංශෝධනය කළ යුතුය.

25/06 2012 08:08 RECEIVED FROM: 0112434648

2. ඉහල කිමිනයේ නිවාස හා පශාවිකිමේ අහිමි වන පුද්ගලයින් සඳහා ඉහල කිමිනයෙන් නිවසක් තනා ගැනීමට ඉඩමක් හා පහල කිමිනයෙන් වගාබිම් ලබාදීම තුළින් ප්‍රායෝගික ගැටළු ඇති නොවන්නේද යන්න යළි සොයා බැලීම යෝජනා කරමි.

3. උපලේඛන අංක 1හි අංක 12 යටතේ සඳහන් පුද්ගලයන් සඳහා ලබා දෙන රු.3000න මාසික දීමනාව අංක 09 යටතේ සෑම පුද්ගලයෙකුටම ලබාදෙන රු.2000ක දීමනාවට අමතරවද යන්න, පැහැදිලිව සඳහන් කළ යුතුය.

4. වන්දි මුදල් වලට අමතරව අංක 2 හා අංක 3හි සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පිරිවැය මෙම ව්‍යාපෘතිය සඳහා 2012 වසර වෙනුවෙන් අමාත්‍යාංශයට වෙන් කර ඇති ප්‍රතිපාදන තුල තුලමනාකරණය කළ යුතුය.

මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය

රහසිගතයි.

පිටපත්: ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
මුදල් හා ක්‍ර./ලේ.
රාජ්‍ය පරිපාලන හා ස්ව.ක./ලේ.
ඉඩම් හා ඉ.සං./ලේ.
ගොවිජන සේවා හා ව.ජී./ලේ.
විගණකාධිපති.

මගේ අංකය: අමප/12/0747/508/018
2012 ජූලි මස 05 දින,
කොළඹ, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේදී ය.

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්.

උමාඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතියට අදාළ ඉදිකිරීම් සඳහා දේපළ අත්කර ගැනීම හේතුවෙන් බලපෑමට ලක්වන පවුල් සඳහා සහන සැලසීම

(වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2012-05-30 දිනැති සංදේශය)

2012 ජූනි මස 27 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමග එවා ඇත.

එල්.පී.ජයම්පති,
අතිරේක ලේකම්.

අ.කළේ/එස්.අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

(ආ) න්‍යාය පත්‍රයේ විෂයයන්:

(I) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා:

09. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 12/0747/508/018 වූ, "**උමාඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතියට අදාළ ඉදිකිරීම් සඳහා දේපළ අත්කර ගැනීම හේතුවෙන් බලපෑමට ලක්වන පවුල් සඳහා සහන සැලසීම**" යන මැයෙන් වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ ඇමතිතුමා ඉදිරිපත් කළ 2012-05-30 දිනැති සංදේශය - (අමප අංක 08/0309/356/002 පිළිබඳව වූ 2008-02-21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළ) ඉහත සංදේශය මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමාගේ නිරීක්ෂණ සමග සලකා බලන ලදුව, අමාත්‍යාංශය විසින් මෙකී නිරීක්ෂණ සැලකිල්ලට ගෙන, ඒ අනුව ක්‍රියා කිරීමට යටත්ව, සංදේශයේ 04 ඡේදයේ (i) සහ (ii) යෝජනා සඳහා අනුමැතිය දෙන ලදී.

→2.

ක්‍රියා කළයුතු: **වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය** - ඉහත නිරීක්ෂණ යාකොට ඇත.

පිටපත්: **මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය**
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යාකොට ඇත.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යාකොට ඇත.
ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යාකොට ඇත.

වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරන අමාත්‍යාංශය

අමාත්‍ය මණ්ඩල සංදේශය

අමාත්‍ය මණ්ඩල සං.අංකය: වා.ජ/අ.මා.සං/03/2013 ලිපිගොනු අංකය : IWRM/TS/04/12/Vol.X

<u>උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය</u>

<u>ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය සඳහා කාර්ය මණ්ඩල බඳවා ගැනීම</u>

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතම සංවර්ධන ව්‍යාපෘතියක් වන අතර වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරන අමාත්‍යාංශය මඟින් දැනට ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යය ව්‍යාපෘති කාර්ය මණ්ඩලය කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇත.

ඒ යටතේ පහත විස්තර සඳහන් නිළධාරීන් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් වශයෙන් බඳවා ගෙන ඇත.

1. ජී.ඒ. දයාරත්න මහතා - නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත්) වශයෙන් 2008.11.01 දින සිට පත්කරන ලද අතර අනතුරුව 2010.02.01 දින සිට වසර 03කට, අංක 10/0557/360/016 හා 2010.03.03 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට ලැබුණු අනුමැතිය පරිදි දීර්ඝ කරන ලදි. ඒ අනුව ඔහුගේ සේවා කාලය 2013.01.31 දිනෙන් අවසන්වීමට නියමිතය.
   ඔහු වෙත ගෙවන ලද පාරිශ්‍රමිකය මාසිකව රුපියල් 110,000.00 කි.

2. ඒ.කේ.ඩී.එන් අතුකෝරල මහතා - නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉන්ජිනේරු) වශයෙන් 2010.02.01 දින සිට අංක 10/0557/360/016 හා 2010.03.03 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට ලැබුණු අනුමැතිය පරිදි පත් කරන ලද අතර ඔහු සේවයට වාර්තාකරන ලද්දේ 2010.05.03 දින සිටය. ඔහුගේ සේවා කාලයද 2013.01.31 න් අවසන් වීමට නියමිතය.

   ඔහු වෙත ගෙවන ලද පාරිශ්‍රමිකයද මාසිකව රු.110,000.00 කි.

ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වන කොන්ත්‍රාත් ගිවිසුම ශ්‍රී ලංකා රජය හා ඉරානයේ ෆරාබ් (Farab) සමාගම අතර අත්සන් තබන ලද අතර එය 2010.03.15 දින සිට බලාත්මක විය. ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන නිම කර මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතියද ලබා ඇති අතර මේ වන විට ඉදිකිරීම් කටයුතු කෙරෙමින් පවතී. ව්‍යාපෘතියේ ඉදිකිරීම් 2015.11.15 දිනට නිම වීමට නියමිත අතර වගකීම් කාලය 2016.11.15 දින දක්වා වේ.

මෙවැනි මහා පරිමාණ ව්‍යාපෘතියක් කළමණාකරනය කිරීම සඳහා ඉහත නම් සඳහන් නිළධාරීන් දෙදෙනා සතු දැනුම හා පළපුරුද්ද මෙන්ම මෙම ව්‍යාපෘතියට සම්බන්ධ වීමට ප්‍රථම ඔවුන් විසින් රාජ්‍ය අංශයේ වගකිව යුතු තනතුරු දරා ලබා ගෙන ඇති අත්දැකීම්ද සැලකිල්ලට ගෙන ව්‍යාපෘතියේ කටයුතු සාර්ථකව නිම කිරීම සඳහා මෙම නිළධාරීන් දෙදෙනාගේ කොන්ත්‍රාත් කාලසීමාව 2013.02.01 දින සිට 2016.11.15 දක්වා දීර්ඝ කිරීම අත්‍යවශ්‍ය බව මා විසින් තරයේ නිර්දේශ කරමි.

ඔවුන්ගේ ජීව දත්ත හා සුදුසුකම් තොරතුරු මේ සමඟ අමුණා ඇත.

කළමණාකරන සේවා චක්‍රලේඛ 33/2007 අනුව නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරු සඳහා ගෙවිය හැකි පාරිශ්‍රමිකය මාසිකව රු.110,000.00 ක් පමණකි.

කෙසේ වෙතත් ව්‍යාපෘතියේ විශාලත්වය හා සංකීර්ණත්වයත් මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ මෙම නිළධාරීන් දෙදෙනා සතු පළපුරුද්ද, කුසලතා මෙන්ම ලබා ඇති අධ්‍යාපනික සුදුසුකම්ද ව්‍යාපෘතියේ සාර්ථක ක්‍රියාකාරීත්වයට මෙම නිළධාරීන් වෙතින් ලැබෙන වටිනා දායකත්වයද සැලකිල්ලට ගෙන ඔවුන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම සමඟම මාසික පාරිශ්‍රමිකයද වැඩිකිරීමට නිර්දේශ කරමි.

ඉහත කරුණු අනුව,

1. ජී.ඒ.දයාරත්න මහතාගේ හා ඒ.කේ.ඩී.එන්. අතුකෝරල මහතාගේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත්) හා නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉන්ජිනේරු) වශයෙන් සේවා කොන්ත්‍රාත් කාලය 2013.02.01 දින සිට 2016.11.15 දක්වා දීර්ඝ කිරීමටත්,

2. මෙම නිළධාරීන් දෙදෙනාට මාසිකව රු.180,000/- බැගින් පාරිශ්‍රමිකයක් හා වාර්ෂිකව 10% වැටුප් වර්ධකයක් සමඟ කළමණාකරන සේවා චක්‍රලේඛ 33/2007 හි සඳහන් අනෙකුත් අදාල දීමනා ගෙවීමටත් ,

3. කළමණාකරන සේවා චක්‍රලේඛ 33/2007 හි විෂයය අංක 5.2 හා 5.3 සඳහන් වන ප්‍රතිලාභ උක්ත නිළධාරීන් දෙදෙනා වෙත ලබා දීමටත්,

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කරමි.

නිමල් සිරිපාල ද සිල්වා
වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරන අමාත්‍ය

නිමල් සිරිපාල ද සිල්වා
වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍ය

2013. මැයි මස 10 දින
වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරන අමාත්‍යාංශය
අංක: 500, ටී.බී. ජයා මාවත
කොළඹ-10

Name : G.A. DAYARATNE

Permanent Address : 12 A. First Lane. Wanatha Road. Gangodawila.

Residence Telephone No.: 011- 2856793 Mobile. 0773221832

E-Mail : gadayaratne@yahoo.com

Profession: Chartered Engineer

Date of Birth: *01.08.1948*

Nationality: *SRI LANKAN*

Name of present Employer & Address : Uma Oya Project Office, No. 26, Jawatta Road, Colombo-05

Name of former Employer & Address : Central Engineering Consultancy Bureau. 415, Bauddhaloka Mawatha, Colombo-07

Years of Experience : 40 years.

Membership in Professional Societies:

- Chartered Mechanical Engineer - CEI (UK) - 1983
- Fellow of the Institution of Mechanical Engineers (FIMech.E) – UK – 2002
- Member of the Institution of Mechanical Engineers (MIMechE) –UK -1983 to 2001
- Member of the Institution of Engineers. Sri Lanka (MIE(SL)) - 1980
- Member of the Association of Consulting Engineers. Sri Lanka (MACE) - 1991

Key Qualifications:

- Preparation of Pre-qualification document. Tender document and Request for Proposals.
- Reviewing of Tender Document. Invitation of tenders. Evaluation. and award.
- Evaluation of Consultancy Proposals. and proposals of Project Proponents.
- Contract Negotiation. Contract Administration. evaluation and progress monitoring of major development projects. preparation of quarterly and annual progress reports.
- Reviewing of Procurement Guidelines for Goods & Works and Guidelines on Selection and Employment of Consultants
- Reviewing of and improvements to the internal operating procedure on procurement and logistics.
- Introduction and implementation of standard documents for procurement.

- Introduction and implementation of improved procedures for initial contract administration activities, monitoring and contract closeout activities.

- Preparation of specifications for hydro-mechanical works and electro-mechanical works, formulation of standard specifications for electro-mechanical equipment of Water Supply Schemes, Hydro Power Projects and Multi-Story Buildings.

- Checking and approval of drawings of Hydro-Mechanical equipment of dams and waterways.

- Checking and approval of drawings of Electro-Mechanical Plant & equipment at power stations.

- Investigation, planning, design, and supervision of installation of power transmission lines.

- Supervision of plant installation, testing and commissioning of hydro-mechanical gates and associated equipment; electro-mechanical equipment such as turbines, generators, overhead traveling cranes, hydraulic gates, air-conditioning and ventilation systems in hydropower stations.

- Inspection of regulating, monitoring and protection equipments of the Headwork of the reservoirs and canals.

- Inspection of Electro-Mechanical equipment such as Hydraulic Gates, Trash Raking Machines, Hoisting mechanism, and Diesel Generators, and advising the clients on operational, maintenance and safety aspects of same, under Dam safety program.

- Development of management information system.

- Reviewing of Environment Impact Assessment (EIA) Reports.

- Design of Central Air Conditioning systems, Fire Protection and Detection systems.

- Conducting Training Courses and Workshops on procurement, system improvement to enhance capacity and skill development of staff.

- Implementation of Quality Assurance systems.

- Conducting lectures on Procurement and Contract Administration for Masters Programs and Diploma Program.

Education :

- *B.Sc.Eng. (Hons) in Mechanical Engineering - 1972*
  University of Ceylon, Peradeniya, Sri Lanka
- *Part I, The Institute of Cost and Management Accountants (UK) - 1981*
- *Master of Business Administration - 1991*
  University of Colombo, Sri Lanka

Employment Record :

Nov. 2008 – To date *Uma-Oya Multipurpose Development Project (UOMDP)*
Deputy Project Director (Contract & Procurement)

- *Preparation of Particular Conditions of Contract for EPC/ Turnkey Type contract, negotiation with the contractor and contract administration*
- *Preparation of Request for Proposals for Consultancy services.*
- *Reviewing of Technical Specifications for Electro-Mechanical and Hydro-Mechanical equipment of the hydropower plant.*
36. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 16/1123/704/027 වූ, "**උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ මූලස්ථායී වැඩ කොන්ත්‍රාත්තුව ලබා දී ඇති ඉරාන ජාතික ෆරාබ් සමාගම (FARAB Energy & Water Project Company) වෙත ඇමරිකානු ඩොලර් මිලියන 50ක අතිරේක අත්තිකාරම් මුදලක් ගෙවීමටත්, අය කර ගෙන ඇති ප්‍රමාද ගාස්තු මුදල වන ඇමරිකානු ඩොලර් මිලියන 6.6ක මුදල යළි ගෙවීමටත්, කොන්ත්‍රාත්තුව නිම කිරීමේ කාලය 2018 ජූනි 30 දක්වා දීර්ඝ කිරීමටත් අනුමැතිය ඉල්ලීම**" යන මැයෙන් මහවැලි සංවර්ධන හා පරිසර ඇමතිතුමා ඉදිරිපත් කළ 2016-06-09 දිනැති සංදේශය - ඉහත සංදේශය මුදල් ඇමතිතුමාගේ නිරීක්ෂණ සමඟ සලකා බලන ලදී. මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, මුදල් ඇමතිතුමාගේ නිරීක්ෂණ සැලකිල්ලට ගෙන ඒ අනුව ක්‍රියා කරන ලෙස මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්ට නියම කිරීමට තීරණය කරන ලදී.

→ 2

මෙම තීරණය සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වේ නම් කරුණාකර 2329621

ක්‍රියා කළ යුතු: **මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය** -ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

පිටපත්: **ජනාධිපති ලේකම්** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
අග්‍රාමාත්‍ය ලේකම් - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
මුදල් අමාත්‍යාංශය
වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

(B) Agenda Items :

(II) Cabinet Papers - Procurement Related Matters

36. Cabinet Paper No.16/1123/704/027, a Memorandum dated 2016-06-09 by the Minister of Mahaweli Development and Environment on **"Request for approval of a payment of US$ 50 million as an Additional Advance, Refund of US$ 6.6 million deducted as delay damages and extension of Contract Period of the FARAB Energy and Water Project, the contractor of Headwork of Uma Oya Multipurpose Development Project, until 30th June 2018"** - the above Memorandum was considered along with the observations of the Minister of Finance. After discussion, it was decided to direct the Secretary, Ministry of Mahaweli Development and Environment, to take note of the observations of the Minister of Finance and pursue action accordingly.

Action by: **My/Mahaweli Development and Environment** - above observations annexed.

Copied to: **Secretary to the President** - copy of Memorandum and above observations annexed.
Secretary to the Prime Minister - copy of Memorandum and above observations annexed.
My/National Policies and Economic Affairs - copy of Memorandum and above observations annexed.
My/Finance
My/Irrigation and Water Resources Management - copy of Memorandum and above observations annexed.

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
අමාත්‍ය මණ්ඩල සංදේශය

අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය: 19/2016 . ලිපිගොනු අංකය:MMDE/TS/Cab.Pap./2015/016

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන උමඟෙහි ඇති වූ ජල කාන්දුව හේතුවෙන් බලපෑමට ලක් වූ වෙහෙරගල තැන්න, මකුල් ඇල්ල හා කුරුඳු ගොල්ල යන ප්‍රදේශ වල ජනතාවට පානීය ජලය සැපයීම සඳහා ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

1. පසුබිම:

1.1 "උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ මූලස්ථායී වැඩ වල ඉදිරි කටයුතු" යන මැයෙන් 2015-03-23 ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අංක: 15/0311/604/002 දරණ සංදේශයට පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2015-04-02 දින ලැබී ඇත. **(ඇමුණුම -01)**

(අ) උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන උමඟෙහි ඇතිවූ ජල කාන්දුව හේතුවෙන් බලපෑමට ලක්වූ ජනතාවට පානීය ජලය සැපයීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද රු. මිලියන 188 ක ඇස්තමේන්තු ගත පිරිවැයක් යටතේ ජල සම්පාදන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම හා එලෙස පානීය නල ජලය ලබා දීම සඳහා කඩිනමින් ඉටුකළ හැකි ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා ඇස්තමේන්තු ගත පිරිවැය වන රු.මිලියන 55 ක මුදල වහාම මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත නිදහස් කිරීම සඳහා ද,

(ආ) පානීය ජල පහසුකම් ලබා දීම කඩිනම් කරවීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ අධීක්ෂණය යටතේ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත එම ඉදිකිරීම් වැඩ කටයුතු පැවරීම සඳහා,

1.2 ඒ අනුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අධීක්ෂණය යටතේ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය මඟින් ඉහත දැක්වෙන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම ඉදිකිරීම වහාම ආරම්භ කරන ලද අතර එම ඉදිකිරීම් කටයුතු කරගෙන යන අතරතුරේදී ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් වැඩිදුරටත් කරන ලද විමර්ශන මඟින් අනාවරණය වූයේ;

(අ.) ජල සම්පාදන යෝජනා ක්‍රම තුනෙහිම, ජල මූලාශ්‍ර සමීපයේ පදිංචි ජනතාව සහ පීඩාවට පත්වූ පවුල් ද ඇතුළුව මුළු පවුල් සංඛ්‍යාව 1417 සිට 2400 දක්වා ඉහල යන බවත්;

(ආ.) ජල මූලාශ්‍රවල ජලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පානීය ජලය සඳහා වන ප්‍රමිතීන්ට වඩා පහල තත්වයේ පවතින බැවින් එම ජලය පිරිපහදු කිරීම සඳහා පහසුකම් අන්තර්ගත කිරීමට සිදු වන බවත්;

(ඇ.) ඉහත කරුණු හේතුවෙන් එකතු කල අගය මත බද්ද (VAT) සහිතව රු. මිලියන 188 ක පිරිවැයකින් ඉදිකිරීමට යෝජනා කරන ලද ජල සම්පාදන යෝජනා ක්‍රමය එකතු කල අගය මත බද්ද (VAT) නොමැතිව රු. මිලියන. 317.23 දක්වා ඉහල ගොස් ඇති බවත්ය.

2. යෝජනාව

2.1 කළින් එකතු කල අගය මත බද්ද (VAT) සහිතව මුළු පිරිවැය රු .මිලියන 188 න් ඉදිකිරීමට යෝජනා කරන ලද ජල සම්පාදන යෝජනා ක්‍රම හා නව යෝජනා ඇතුලත්, එකතු කල අගය මත බද්ද (VAT) නොමැතිව පිරිවැය රු .මිලියන 317.23 වන සංශෝධිත ජල සම්පාදන යෝජනා ක්‍රම ඇතුලත් සංසංදනාත්මක වාර්තාවක් හා නව යෝජනාවලට හේතු වූ කරුණු පිළිබඳ විස්තර මේ සමඟ අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇත. (ඇමුණුම 02)

2.2 ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඉදිරිපත් කරන ලද නව ඇස්තමේන්තුව අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ඉල්ලීම මත අමාත්‍ය මණ්ඩලය මගින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවට සහාය වීම සඳහා, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කරන ලදි. උක්ත ඇගයීම් කමිටුවේ වාර්තාව ඇමුණුම -03 ලෙස පෙන්වා ඇත.

2.3 එම තාක්ෂණික කමිටු වාර්තාව අධ්‍යයනය කිරීමෙන් පසු අමාත්‍ය මණ්ඩලය විසින් පත්කල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර ඇත. (ඇමුණුම 04)

(අ). ඉහත සඳහන් ජලසම්පාදන යෝජනා ක්‍රම තුන වන මකුල්ඇල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය, වෙහෙරගලතැන්න ජල සම්පාදන යෝජනා ක්‍රමය, කුරුඳුගොල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා එකතු කල අගය මත බද්ද (VAT) නොමැතිව ඇස්තමේන්තු කරන ලද රු. 317,237,067.66 මුදලකට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සමඟ ගිවිසුම් ගත වීමට;

සහ

(ආ). ඉහත සඳහන් ජල සම්පාදන යෝජනා ක්‍රම තුනේ සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් කටයුතු සහ ජල නළ එලීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමඟ ගිවිසුම් ගත වීමට; මේ සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙතින් ලංසු කැඳවා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඉදිරිපත් කල සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් කටයුතු සහ ජල නළ එලීම සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල තුල සාකච්ඡා කර සම්මුතියට පැමිණීමට,

3. ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය

3.1 තවද, ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරඇති අංක 273/2015 දරණ අයදුමට අනුව, උමා ඔය උමග තැනීම නිසා බලපෑමට ලක්වූ ප්‍රදේශ වෙත නල ජලය 2016 ඔක්තෝබර් මස 30 වැනි දිනට පෙර ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ලබාදිය යුතු බව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය නියෝගකර ඇත. (ඇමුණුම - 05)

4.අනුමැතිය

2016 වර්ෂය තුල උමා ඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය වෙනුවෙන් වෙන්වී ඇති ප්‍රතිපාදන තුල කළමනාකරණය කරගැනීමට යටත්ව,

අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව මගින් නිර්දේශ කර ඇති ඉහත 2.3හි (අ), (ආ) යන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා

අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කරමි

මෛත්‍රීපාල සිරිසේන
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
නො.500, ටී.බී. ජායා මාවත
කොළඹ -10
2016.08.10

අමුණුව -01

රහසිගතයි

අමාත්‍ය මණ්ඩල කාර්යාලය
அமைச்சரவை அலுவலகம்
OFFICE OF THE CABINET OF MINISTERS

CABINET DECISION අමාත්‍ය මණ්ඩල තීරණය அமைச்சரவைத் தீர்மானம்

පිටපත් ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
විදුලිබල හා බලශක්ති/ලේ.
වාරිමාර්ග/ලේ.
අභ්‍යන්තර ප්‍රවා./ලේ.
නිවාස හා සමෘද්ධි රාජ්‍ය/ලේ.
ඌව පළාත් ප්‍රධාන ලේකම්.
විගණකාධිපති.

මගේ අංකය: අමප/15/0311/604/002
2015 අප්‍රේල් මස 02 දින.

ක්‍රියා කළ යුතු : මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්.
මුදල් අමාත්‍යාංශයේ ලේකම්.

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ
<u>මූලස්ථායි වැඩවල ඉදිරි කටයුතු</u>

(මහවැලි සංවර්ධන හා පරිසර ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2015-03-23 දිනැති සංදේශය)

2015 මාර්තු මස 23 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු
අතිරේක ලේකම්.

අ.කළේ/එස්.අබේසිංහ
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

(ඇ) රැස්වීමේදී සභාගත කළ පත්‍රිකා:

28. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 15/0311/604/002 වූ, "**උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ මූලස්ථායි වැඩවල ඉදිරි කටයුතු**" යන මැයෙන් මහවැලි සංවර්ධන හා පරිසර ඇමතිතුමා ඉදිරිපත් කළ 2015-03-23 දිනැති සංදේශය - මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පහත සඳහන් පරිදි තීරණය කරන ලදී:

(i) සංදේශයේ අවසන් ඡේදයේ සඳහන් (i), (ii), (iii) සහ (iv) යෝජනා සඳහා අනුමැතිය ලබා දීම; සහ

→ 2.

මෙම තීරණය සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වේ නම් කරුණාකර 2325279 හෝ 2329621

(ii) සංදේශයේ (v) වන යෝජනාවේ (අ), (ආ) සහ (ඇ) යටතේ දක්වා ඇති කරුණු පරීක්ෂාකර බලා සති දෙකක් (02) ඇතුළත සලකා බැලීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් අමාත්‍යවරුන්ගෙන් සැදුම්ලත් අමාත්‍ය කමිටුවක් පත් කිරීම:

* මුදල් අමාත්‍යතුමා - (සභාපති);
* විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා;
* වාරිමාර්ග අමාත්‍යතුමා;
* අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමා;
* නිවාස හා සමෘද්ධි රාජ්‍ය අමාත්‍යතුමා; සහ
* ඌව පළාත් ප්‍රධාන අමාත්‍යතුමා.

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම් ඉහත කමිටුවේ ලේකම්/කැඳවුම්කරු වශයෙන් ක්‍රියා කළ යුතු බවටත්, කමිටුවේ කාර්යයන් සඳහා අවශ්‍යයැයි සැලකෙන අන් කවර හෝ නිලධාරියකුගේ සේවය කමිටුව විසින් ලබා ගත හැකි බවටත් තීරණය කරන ලදී.

ක්‍රියා කළ යුතු: **මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**
මුදල් අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් යා කොට ඇත.

පිටපත්: **විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය** - සංදේශයේ පිටපතක් යා කොට ඇත.
වාරිමාර්ග අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් යා කොට ඇත.
අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් යා කොට ඇත.
නිවාස හා සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් යා කොට ඇත.
ඌව පළාත් ප්‍රධාන ලේකම් - සංදේශයේ පිටපතක් යා කොට ඇත.

(D) Cabinet Papers Tabled at the Meeting:

28. Cabinet Paper No.15/0311/604/002, a Memorandum dated 2015-03-23 by the Minister of Mahaweli Development and Environment on "**Head Works of Uma Oya Multipurpose Development Project (UOMDP) - Future Course of Action**" - After discussion, it was decided -

(I) to grant approval to the proposals (i), (ii), (iii) and (iv) in the final paragraph of the Memorandum; and

(II) to appoint a Ministerial Committee comprising of the following to examine the matters indicated under (a), (b) and (c) in proposal (v) of the Memorandum and submit recommendations to the Cabinet within two (02) weeks, for consideration:

* Minister of Finance - (Chairman);
* Minister of Power and Energy;
* Minister of Irrigation;
* Minister of Internal Transport;
* State Minister of Housing and Samurdhi; and
* Chief Minister, Uva Province.

It was decided that the Secretary, Ministry of Mahaweli Development and Environment should function as the Secretary/Convenor of the above Committee. The Committee could co-opt any other officials deemed necessary for its deliberations.

Action by: **My/Mahaweli Development and Environment**
My/Finance - copy of Memorandum annexed.

Copied to: **My/Power and Energy** - copy of Memorandum annexed.
My/Irrigation - copy of Memorandum annexed.
My/Internal Transport - copy of Memorandum annexed.
State Ministry of Housing and Samurdhi - copy of Memorandum annexed.
Chief Secretary, Uva Province - copy of Memorandum annexed.

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

අමාත්‍ය මණ්ඩල සංදේශය

අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය: 03/2015 මගේ අංකය: 2-2-2/1/6-15

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ මූලස්ථායි වැඩ වල ඉදිරි කටයුතු

<u>පසුබිම:</u>

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2011 අප්‍රේල් 12 වැනි දින වසර තුනක් සඳහා අනුමැතිය ලබා දුන් අතර පසුව 2014 ජූලි මස එම අනුමැතිය 2017 අප්‍රේල් 11 දින දක්වා දීර්ඝ කර ඇත.

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ මූලස්ථායි වැඩ වල ඉදිකිරීම් කටයුතු සඳහා ඉරානයේ ෆරාබ් සමාගම හ අත්සන් කල දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ගිවිසුම බලාත්මක වූයේ වර්ෂ 2010 මාර්තු මස 15 දිනදීය.

ශ්‍රී ලංකා රජය සහ ඉරානයේ අපනයන සංවර්ධන බැංකුව (Export Development Bank of Iran/EDBI) සමග අත්සන් කළ එම ණය ගිවිසුම අනුව මුළු කොන්ත්‍රාත් මුදල ඇමරිකානු ඩොලර් 529,059,198 ක් වන අතර එයින් ඇමරිකානු ඩොලර් 79,059,198 ක් ශ්‍රී ලංකා රජය මගින් දැරිය යුතු වූ අතර ඇමරිකානු ඩොලර් 450,000,000 ක මුදලක් EDBI මගින් ලබා දීමට නියමිත විය. ගිවිසුම ක්‍රියාත්මක කරවීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් දැරිය යුතුව තිබුනු ඇමරිකානු ඩොලර් 79,059,198 ක මුදල රජය විසින් කොටස් දෙකකින් ගෙවා ඇත.

ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කළ දින සිට ඇමරිකානු ඩොලර් 50,619,304 ක මුදලක් EDBI වෙතින් කොන්ත්‍රාත්කාර සමාගම වෙත ගෙවා ඇති අතර, ඉන් අනතුරුව ඉරානය හා ශ්‍රී ලංකාව අතර බැංකු ගණු දෙනු සම්බාධක වලට යටත් වූ බැවින් EDBI වෙතින් ගෙවීම් කර වීමේ අවස්ථාව ඇහිරී ගොස් ඇත. එම සම්බාධක නිසා ඇති වූ තත්වය හේතුවෙන් 2013 මාර්තු මස සිට මේ දක්වා කොන්ත්‍රාත්කාර සමාගම වෙත ගෙවීම් කර ඇත්තේ ශ්‍රී ලංකා රජයේ අරමුදල් වලින්ය. ඒ අනුව මේ දක්වා ඇමරිකානු ඩොලර් 109,174,429.35 ක මුදලක් ශ්‍රී ලංකා රජයේ අරමුදල් වලින් ඉරාන කොන්ත්‍රාත් සමාගම වෙත ගෙවා ඇත.

මෙම ව්‍යාපෘතිය සඳහා වර්ෂ 2015 අයවැයෙන් රුපියල් 15,600,000,000 ක ප්‍රතිපාදන වෙන්කර ඇති අතර එයින් රුපියල් 15,100,000,000 ක මුදලක් දේශීය අරමුදල් වශයෙන්ද, රුපියල් 500,000,000 ක මුදලක් විදේශීය අරමුදල් වශයෙන්ද ලබා දිය යුතුව ඇත. නමුත් මෙම වර්ෂයේ මේ වනතුරු ව්‍යාපෘතියට ලබා දී ඇති මුළු අග්‍රිම මුදල වනුයේ රුපියල් 220,000,000 පමණකි.

එසේ වුවද, එලෙස අවශ්‍ය අග්‍රිම මුදල් නොලැබුනු බැවින්, 2014 වර්ෂයේ ඔක්තෝබර් ,නොවැම්බර් හා දෙසැම්බර් යන මාස වල ඉරාන කොන්ත්‍රාත් සමාගම විසින් කරන ලද වැඩ සඳහා ගෙවීමට නියමිත මුදලින් ඇමරිකානු ඩොලර් 22,200,976.65 ක මුදලක් මේ වනවිට ගෙවීමට නොහැකි වී ඇත. තවද 2015 පෙබරවාරි අග දක්වා එලෙස කොන්ත්‍රාත් සමාගමට ගෙවිය යුතු මුදල ඇමරිකානු ඩොලර් 40,000,000 ක් පමණ දක්වා වර්ධනය වී ඇත.

තවද දැනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 47% ක් පමණ වේ

එතෙකුදු වුවද, 2014 දෙසැම්බර් මස 24 දින සිට ඇති වූ ප්‍රධාන උමග තුලට ජලය කාන්දු වීමේ සංසිද්ධියත් සමග බණ්ඩාරවෙල සහ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් ග්‍රාම සේවා වසම් හයක ලිං සිඳී යාම, ගෙවල් ඉරිතැලීම හා වගා විනාශ වීම ආශ්‍රිතව සමාජීය හා ආර්ථිකමය ගැටළු රාශියක් නිර්මාණය වී ඇත.

මෙම පාරිසරික බලපෑම් නිසා ඇති වූ සමාජ අසහන තත්වය සලකා පෙරාර උමගේ (Head Race Tunnel) ජල කාන්දුව නතර කිරීමට අවශ්‍ය කටයුතු සඳහා හා ඉදිකිරීම් වල අවධානම් තත්වය මගහැරවීම පිණිස අත්‍යවශ්‍ය වැඩ හැර ව්‍යාපෘතියේ මූලස්ථායි වැඩ වල ඉදිකිරීම් 2015-02-16 දින තාවකාලිකව අත්හිටුවන ලදි.

එම තීරණය ගැනීමට හේතු වූයේ දැනට ඇති වී තිබෙන පාරිසරික හා තාක්ෂණික තත්වයන් පිළිබඳව පිළිවෙලින් මධ්‍යම පරිසර අධිකාරියෙන් හා ඒ සඳහාම විශේෂයෙන් පත්කල විද්වත් මණ්ඩලයකින් නිර්දේශ ලබාගෙන ව්‍යාපෘතියේ ඉදිරි ක්‍රියාකාරකම් පිළිබඳ තීරණයක් ගැනීම පිණිසය.

ඒ අනුව ඇති වූ තත්වය හා ඉදිරි කටයුතු පිළිබඳ අවශ්‍ය නිර්දේශ සති 3 ක් ඇතුලත ඉදිරිපත් කිරීම සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ භූ විද්‍යා අංශයේ ප්‍රධානියාගේ සභාපතිත්වයෙන් වූ විද්වත් මණ්ඩලයක් පත්කරන ලද අතර මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ ඉදිරිපත් කරන ලෙස එම අධිකාරියේ සභාපතිවරයා වෙත උපදෙස් දෙන ලදි.

විද්වත් මණ්ඩලයේ වාර්තාව ද , මධ්‍යම පරිසර අධිකාරිය විසින් පිළියෙල කරන ලද වාර්තාව ද මේ වනවිට ඉදිරිපත් කර ඇති අතර එම වාර්තාවල සඳහන් නිර්දේශ සියල්ල මෙම කැබිනට් පත්‍රිකාව සමග වන ඇමුණුමේ සඳහන් කර ඇත.

<u>නිරීක්ෂණ :</u>

විද්වත් මණ්ඩලය විසින් නිර්දේශිත ප්‍රතිකර්ම කටයුතු බොහෝමයක් කොන්ත්‍රාත්කාර ඉරාන සමාගම විසින් ඉටුකල යුතුව ඇති අතර ඉදිරි කාලය තුල නැවත එවැනි තත්වයන් ඇති නොවීම සඳහා විමංසනය සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශමය කාර්යංශය මගින් හා අනෙකුත් ආයතන වලින් උපදේශක සේවාවන් අඛණ්ඩව ලබා ගත වේ ඇත.

එසේ වුවද එම කටයුතු සඳහා ව්‍යාපෘතිය වෙත අග්‍රිම මුදල් අවශ්‍ය පමණ නොලැබීම හා කොන්ත්‍රාත්කාර සමාගමට ගෙවිය යුතුව ඇති මුදල් ගෙවීම ප්‍රමාද වීම නිසා ගැටළු රාශියක් පැන නැගී ඇත. එයින් ප්‍රධාන ගැටළු පහත දැක්වේ.

ව්‍යාපෘති කළමණාකාර ඒකකය සම්බන්ධ ගැටළු:

i. ඇති වී ඇති ආපදා තත්වය සමනය කිරීම සඳහා ඉක්මනින් ගතයුතු ක්‍රියාමාර්ග එනම් අදාල වන්දි මුදල් ගෙවීම, පානීය ජලසම්පාදන හා අනෙකුත් කටයුතු කරගෙන යාමේ අපහසුතාවය

කොන්ත්‍රාත්කාර සමාගම විසින් මුහුණ පා ඇති ගැටළු:

i. දේශීය වශයෙන් ගත්කල දහසකට අධික දේශීය සේවක සංඛ්‍යාවකට මේ වන විට වැටුප් සහ අනෙකුත් දීමනා ගෙවීමට නොහැකි වීම.
ii. දේශීය සැපයුම්කරුවන් වෙත මාස හතරකට වැඩි කාලයක් තුල මුදල් ගෙවා නොමැති වීම.
iii. ඒ අනුව දේශීය වශයෙන් කිසිම ආයතනයකින් සේවාවන් ලබාගැනීමට ඉරාන කොන්ත්‍රාත් සමාගම අපොහොසත් වීම.
v. විදුලිබල මණ්ඩලය වෙත විදුලිය බිල්පත් ගෙවීම ප්‍රමාද වීම නිසා විදුලිය විසන්දි කිරීමට ඇති ඉඩකඩ
v. වාර්තා වන අන්දමට තුන් සියය කට අධික විදේශීය සේවකයින් සඳහා මාස හතරකට වැඩි කාලයක් සඳහා වැටුප් සහ අනෙකුත් දීමනා ගෙවා නොමැති වීම.
vi. ඉරාන කොන්ත්‍රාත් සමාගම විසින් මුදල් ගෙවීමට නොහැකි වීම නිසා මෙම ව්‍යාපෘතිය සඳහා විදේශයන් වල නිෂ්පාදනය කරමින් පවතින ජල විදුලි බලාගාරය සඳහා අවශ්‍ය විදුලි ජනක යන්ත්‍ර හා තල හමණය සහ අනෙකුත් උපාංග නිපදවීම එම විදේශීය සමාගම් විසින් අත්හිටුවීමට තීරණය කර තිබීම.

තවද ජල කාන්දු වීම නවතා දැමීමට කඩිනම් පියවර ගෙන ඇති නමුත් එය සාර්ථකව නිම කිරීම සඳහා විශාල මුදලක් වැය කිරීමට කොන්ත්‍රාත්කාර සමාගමට සිදු වන අතර, මෙම අළුත්වැඩියා කටයුත්ත නිම කිරීම සඳහා ද එම සමාගම වෙත මුදල් නොමැති බව දන්වා ඇත. එසේ වුවද, පවත්නා කොන්ත්‍රාත් ගිවිසුම අනුව මුළු කොන්ත්‍රාත් මුදලට අමතරව මේ සඳහා කොන්ත්‍රාත්කාර සමාගම වෙත අතිරේක මුදල් ගෙවීමට අවශ්‍ය නොවේ.

අවශ්‍ය අග්‍රිම මුදල් නොමැති කමින් ඉහත සඳහන් කල ගැටළු සඳහා වන ප්‍රතිකර්ම ප්‍රමාද වන නිසා ඊට සමගාමීව නවත් සමාජ ආර්ථිකමය ගැටළු ද වර්ධනය වෙමින් පවතී. දැනට පවතින තත්වය මෙසේ බැවින් දැනට දිගු කලක් නිස්සේ ගෙවාගත නොහැකිව තිබෙන ඇමරිකානු ඩොලර් 22,200,976.65 ක මුදල හැකි ඉක්මනින් කොන්ත්‍රාත් සමාගම වෙත ගෙවීමට අවශ්‍ය පියවර ගැනීම අත්‍යවශ්‍ය වී ඇත.

ඊට අමතරව ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අග්‍රිම දේශීය අරමුදල් වලින් ලබාගැනීමේදී ඇතිවන අපහසුතාවය සලකා ඉරානයේ අපනයන සංවර්ධන බැංකුව (EDBI) වෙතින් ලබා ගත හැකිව තිබෙන ණය මුදල නැවත සක්‍රිය කිරීම සඳහා මෙම ව්‍යාපෘතියට අරමුදල් ලබා දීමේදී ඉරාන රජය වෙත පනවා තිබෙන ජාත්‍යන්තර සම්බාධක ඉවත් කර ගැනීමට රජය විසින් මැදිහත් වී කටයුතු කිරීමද සුදුසුය.

අනුමැතිය :

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් පහත i සිට v දක්වා වූ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කරමි. ව්‍යාපෘතියේ පසුබිම හා වර්තමාන තත්වය දැක්වෙන වාර්තාවක් මේ සමග අමුණා ඇත.

i. උමඟ තුලට වූ ජල කාන්දු තත්වය හේතුකොට ගෙන හානියට පත් වී ඇති 600 ක් පමණ වූ නිවාස සඳහා ඇස්තමේන්තු ගත පිරිවැය වන රුපියල් මිලියන 300 ක් වූ මුදල කොන්ත්‍රාත් සමාගමෙන් ලබා ගැනීමට යටත්ව, ශ්‍රී ලංකා රජය මගින් එම මුදල ගෙවීමට හා ඒ සඳහා වන අග්‍රිම මුදල් මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය වෙත ලබා දීම සඳහාද,

ii. බලපෑමට ලක් වූ පවුල් සඳහා අඛණ්ඩව පානීය නල ජලය ලබා දීම සඳහා ජාතික ජලාපවහන මණ්ඩලය මගින් ඉදිරිපත් කරන ලද රුපියල් මිලියන 188 ක් වූ මුළු ඇස්තමේන්තු පිරිවැය අනුමත කිරීම සඳහා සහ ඒ සඳහා ශ්‍රී ලංකා රජය මගින් ප්‍රතිපාදන ලබා දීමට හා එලෙස පානීය නල ජලය ලබා දීම සඳහා කඩිනමින් ඉටු කල හැකි ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා ඇස්තමේන්තු ගත පිරිවැය වන රුපියල් මිලියන 55 ක මුදල වහාම මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත ලබා දීම සඳහා ද,

iii. පානීය ජල පහසුකම් ලබා දීම කඩිනම් කර වීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අධීක්ෂණය යටතේ මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යංශය වෙත එම ඉදිකිරීම් වැඩ කටයුතු පැවරීම සඳහාද,

iv. මූලස්ථායි වැඩ කොන්ත්‍රාත්කාර සමාගම වන ෆරාබි සමගම වෙත 2014 දෙසැම්බර් 31 දින දක්වා කරන ලද වැඩ වලට කළ යුතු වූ සහතික කළ ගෙවීම් වලින් ගෙවීමට ඉතිරිව ඇති ඇමරිකානු ඩොලර් 22,200,976.65 ක් වන මුදලින් 50% ක් වන මුදලක් 2015 අයවැයෙන් දේශීය අරමුදල් යටතේ ඉක්මණින් ලබා දීමට ද ,

v. පහත සඳහන් (අ) සිට (ඇ) දක්වා සඳහන් කර ඇති කරුණු සම්බන්ධයෙන් දක්වා ඇති පරිදි කටයුතු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් පත් කිරීමට ද,

(අ) කොන්ත්‍රාත්කාර සමාගම වෙත නිකුත්කර ඇති තාවකාලික වැඩ අත්හිටුවීමේ නියෝගය ඉවත්කර ගැනීම ප්‍රමාදවීම හේතුකොට ගෙන සේවායෝජකයා වන ශ්‍රී ලංකා රජය වෙත පැනනැගිය හැකි අවාසිදායක තත්වයන් මඟහැරවීම පිණිස, හැකි ඉක්මණින් එම අත්හිටුවීමේ නියෝගය ඉවත් කිරීම සම්බන්ධව තීරණයක් ලබා දීම.

(ආ) මධ්‍යම පරිසර අධිකාරිය සහ විද්වත් මණ්ඩලය විසින් ලබා දී ඇති නිර්දේශ සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘතියේ වැඩ ඉදිරියට ගෙන යාම සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම.

(ඇ) ව්‍යාපෘතිය සම්බන්ධව පැන නැගී ඇති මූල්‍යමය ගැටළු අධ්‍යයනය කර ඒ සඳහා අවශ්‍ය පිළියම් නිර්දේශ කිරීම.

මෛත්‍රීපාල සිරිසේන
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
82 "සම්පත්පාය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

2015 මාර්තු ..22.....

ඇමුණුම : උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ පසුබිම හා වර්තමාන තත්වය

අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය: 03/2015 මගේ අංකය: 2-2-2/1/6-15

1. පසුබිම

1988 - 89 යුගයේදී කරගෙන ගිය මහවැලි නියමු සැලසුම් අධ්‍යනය මගින් උමා ඔය ද්‍රෝණියේ ජල විදුලි බල සංවර්ධනය සඳහා විකල්ප මාර්ග කිහිපයක් යෝජනා කර තිබුණි. උමා ඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා වූ දැනට ක්‍රියාත්මක කොන්ත්‍රාත්තුව යටතේ සවිස්තර ශක්‍යතා අධ්‍යනයන්ට පෙර උමා ඔය ගංගා ද්‍රෝණියේ සංවර්ධනය හෝ අන්තර් ද්‍රෝණි හැරවුම් ගැන අධ්‍යන කිහිපයක් ජර්මනියේ ලාමෙයාර්, ශ්‍රී ලංකාවේ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, ජපානයේ ඉංජිනේරු උපදේශක සංගමය, කැනඩාවේ එස්. එන්. සී. ලැවලින් ආයතනය යන වූ උපදේශක ආයතන හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් 1987 -2004 කාලය තුල යළි සළකා බලන මට්ටමින් සිදුකර තිබිණි. ලාමෙයාර් උපදේශකයන් විසින් ව්‍යාපෘතිය අධ්‍යනය කර පිළියෙළ කරන ලද අධ්‍යනයේ වූ වේලි කිහිපයක් සහ ආශ්‍රිත ජල විදුලි බලාගාර ඉදිකිරීමට යෝජනා කර තිබිණි. මෙම අධ්‍යනයන්හි ප්‍රතිඵලයක් ලෙස දකුණු දිග වියළි ප්‍රදේශයන්ට ජල සම්පාදනය සඳහා සැලකිල්ල යොමු විය. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් ; 1 දී පූර්ව ශක්‍යතා මට්ටමින් ප්‍රථම වතාවට උමා ඔය අන්තර්ද්‍රෝනි හැරවුම් ව්‍යාපෘතිය අධ්‍යයනය කරන ලදී. ,ව 2002 දී ශක්‍යතා මට්ටමින් එස්. එන්. සී. ලැවලින් ආයතනය මගින් එම අධ්‍යනය තවදුරටත් කරගෙන යන ලද අතර අවසානයේදී 2007 දී රජය විසින් උමා ඔය අන්තර් ද්‍රෝණි හැරවුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පහත දැක්වෙන ලෙස මූලස්ථායි වැඩ හා යටිගං සංවර්ධන වැඩ නම් වූ ප්‍රධාන කොටස් දෙකක් යටතේ අදාල වැඩ වර්ගීකරණය කර තිබුණි.

මූලස්ථායි වැඩ: උමා ඔය හරස්කර ඉදිවන පූහුල්පොල ජලාශය සහ මාතැවිල්ල ඔය හරස් කර ඉදිවන ඩයරබා ජලාශය යන ජලාශ දෙක, එම ජලාශ දෙක සම්බන්ධ කරන උමඟ, පෙරාර උමඟ, සිරස් පීඩන පතල් ළිඳ, සර්ජන කුටීරය, මෙගා වොට් 120ක භූගත බලාගාරය (120 MW), අවර උමඟ, වහරු අංගනය හා බදුල්ල ජාල උප මධ්‍යස්ථානයට කිලෝ වොට් 132 ක සම්ප්‍රේෂණ මාර්ග; සහ

යටි ගං සංවර්ධන වැඩ: විදුලි බලාගාරයට පහළින් ඉදිකරන අලිකොට ආර ජලාශය, ඇළ පද්ධතිය, හඳපානගල ජලාශයේ පූර්ණ සැපයුම් මට්ටම එසවීම ඇතුළුව මොනරාගල දිස්ත්‍රික්කයේ පවතින ජලාශ වැඩිදියුණු කිරීම සහ ; ඔය ජලාශය නම් වූ අනෙක් නව ජලාශය ඉදිකිරීම.

ඉරාන රජයේ මූල්‍ය සහාය මත සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන මත ඉදිවන මූලස්ථායි වැඩ ක්‍රියාත්මක කිරීමටත් ශ්‍රී ලංකා රජයේ අරමුදලින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව හරහා යටිගං සංවර්ධන වැඩ ක්‍රියාත්මක කිරීමටත් සැලසුම් කර ඇත.

2. මූලස්ථායි වැඩ ක්‍රියාත්මක කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග

- ශ්‍රී ලංකා රජය සහ ඉරාන රජය අතර අවබෝධතා ගිවිසුමක් 2007 නොවැම්බර් 27 වැනි දින අත්සන් කරන ලද අතර ඇමරිකානු ඩොලර් 450, 000, 000 ක මූල්‍යාධාරයක් ඉරාන අපනයන සංවර්ධන බැංකුව හරහා සැපයීමට ඉරාණ රජය එකඟ විය. එය ව්‍යාපෘතියේ පිරිවැයෙන් 85 % ක් වන අතර, ඉතිරි 15 % ශ්‍රී ලංකා රජය මගින් දැරිය යුතු විය. ඉරාන රජය විසින් ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකරීම් සඳහා පාරිසරික කොන්ත්‍රාත්කරු ලෙස ෆරාබ් සමාගම නම් කරන ලදී.
- ඉහත අංක (1) හි සඳහන් පරිදි උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජය සහ ඉරාන රජය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට අමාත්‍ය මණ්ඩලයේ ආවරණ අනුමැතිය 2007 දෙසැම්බර් 19 වන දින ලැබී ඇත.
- ඉරාන අපනයන සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකාවේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය අතර අංක 870/එල්/එල්කේජී/01 දරණ මූල්‍ය එකඟතාවයක් අත්සන් කරනු ලැබූ අතර ඇමරිකානු ඩොලර් 450,000,000 ක් නොඉක්මවන කොන්ත්‍රාත් වටිනාකමෙන් උපරිම 85% ක් වන මූල්‍ය පහසුකම් වාර්ෂිකව ලයිබෝර් අනුපාතිකයේ පහසු අයකිරීම් මත සැපයීමට ඉරාන අපනයන සංවර්ධන බැංකුව එකඟ වී සිටී. එම මූල්‍ය එකඟත්වය 2010 පෙබරවාරි 07 වන දා සිට බලාත්මක වන අතර එහි වලංගු කාලය 2015 පෙබරවාරි 7 වැනි දින අවසන් විය.

- ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙක් පත්කිරීමට, ෆරාබි සමාගමෙන් තාක්ෂණික හා වාණිජ යෝජනා ලබා ගැනීමට සහ මෙහෙයුම් කමිටුවක් පත්කිරීමට 2008 පෙබරවාරි 28 වැනි දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.
- අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන සම්මුති කමිටුවක් පත් කිරීමට ද, ව්‍යාපෘති කමිටුවක් පත් කිරීමට ද, ඉරානයේ ෆරාබි ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට ද, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයාට බලය පැවරීම සඳහා 2008 අප්‍රේල් 30 වැනි දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.
- වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය සහ ෆරාබි සමාගම අතර කොන්ත්‍රාත් ගිවිසුම 2008 අප්‍රේල් 28 වැනි දින අත්සන් තිබේ.
- කොන්ත්‍රාත් මිල (Contact Price), ප්‍රතිපාදන මුදල (Provisional Sum) අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබූ සම්මුති කමිටුවේ (CANC) වාර්තාව මත පදනම්ව කොන්ත්‍රාත් වටිනාකම සහ කොන්ත්‍රාත් ගිවිසුමට අතිරේකයක් අත්සන් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට 2008 දෙසැම්බර් 08 වැනි දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත.
- කොන්ත්‍රාත් මිල (Contact Price), ප්‍රතිපාදන මුදල (Provisional Sum), කොන්ත්‍රාත් වටිනාකම (Contract Sum) සහ කොන්ත්‍රාත් ගිවිසුමට අතිරේකයක් අත්සන් කිරීම සඳහා වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යාංශයට 2008 දෙසැම්බර් 24 වැනි දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවිය.
- වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය සහ ෆරාබි සමාගම අතර කොන්ත්‍රාත් එකඟතා ගිවිසුමෙහි 1 වැනි අතිරේකය 2009 පෙබරවාරි 22 වන දින අත්සන් කරන තිබේ.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් පාරිසරික බලපෑම් ඇගයීම සිදුකර ඇති අතර, ව්‍යාපෘතිය සඳහා වසර 3 කට මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය 2011 අප්‍රේල් 12 වැනි දින ලැබුණු අතර 2014 ජූනි 10 හා 11 වැනි දින විමංශන කමිටුව විසින් සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් පසුව එම අනුමැතිය 2017 අප්‍රේල් 11 වැනි දින දක්වා දීර්ඝ කර ඇත.

3. සම්පූර්ණ පිරිවැය ඇස්තමේන්තුව

- යටිගං සංවර්ධන වැඩ ඇතුළු උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය ඇස්තමේන්තුව සඳහා අනුමැතිය අපේක්ෂාවෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් 2010 ජූලි 29 වැනි දින ඉදිරිපත් කරන ඇත.
- ව්‍යාපෘතියේ මුළු වැය ඇස්තමේන්තුවට 2010 නොවැම්බර් 04 වැනි දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය පහත පරිදි ලබා දී ඇත.

<u>මූලස්ථායි වැඩ</u>	
විදේශ සංරචක: ෆරාබි සමාගමේ මූලස්ථායි වැඩ ඉදිකිරීමේ වටිනාකම (සම්භාවිතා ගණන ඇතුළත්ව)	ඇමරිකානු ඩොලර් 529,059,198
ඇස්තමේන්තු ගත දේශීය වියදම :	රු 6,121,750,000
<u>යටිගං සංවර්ධන වැඩ</u>	
උමා ඔය උප ද්‍රෝණියෙන් හැරවූ ජලය භාවිතයෙන් කිරිඳි ඔය ද්‍රෝණියේ යටිගං සංවර්ධන ආශ්‍රිත වියදම	රු 9,352,500,000

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2015 අයවැය වෙන්කිරීම් (ශීර්ෂය 160)

අයිතම 11: දේශීය අරමුදල් සඳහා	- රු 500,000,000
අයිතම 12: විදේශීය අරමුදල් යටතේ	- රු 500,000,000
අයිතම 17: විදේශීය අරමුදල් සම්බන්ධ දේශීය වියදම් යටතේ	- <u>රු 14,600,000,000</u>
මුළු ගණන	- රු 15,600,000,000

4. වර්තමාන තත්වය

මූලස්ථායි වැඩ:

ඉරානයේ ෆරාබ් සමාගම සමඟ කොන්ත්‍රාත් ආරම්භ කල දිනය	2010 මාර්තු 15
ඉදිකිරීම් වැඩ ආරම්භ කළ දිනය	2011 මැයි 15
වැඩ අවසන් කිරීම සඳහා මුලින් නියම කල දිනය	2015 මාර්තු 15
වැඩ අවසන් කිරීම සඳහා සංශෝධිත දිනය	2015 නොවැම්බර් 15
ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා සංශෝධිත දිනය	2016 නොවැම්බර් 15
ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත දිනය	2017 පෙබරවාරි මස

සටහන:
වර්තමානයේ ඇති වී ඇති තත්වය අනුව සැලසුම් කළ පරිදි නිම කිරීමේ දිනයට ව්‍යාපෘතිය අවසන් කිරීමට කොන්ත්‍රාත්කාර ෆරාබ් සමාගමට හැකියාවක් නැති බව පෙනේ. වර්තමාන ප්‍රගති අනුපාතිකය සහ යෙදී සිටින භූගත වැඩ වල තත්වයට අනුව කොන්ත්‍රාත්කරුට ව්‍යාපෘතිය 2017 පෙබරවාරියේදී පමණ අවසන් කිරීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. කොන්ත්‍රාත්තුවේ ප්‍රතිපාදනවලට අනුව ව්‍යාපෘතිය නිම කිරීමේ ප්‍රමාදය ගැන කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් පියවර ගනු ලැබේ.

මූල්‍යනය:
මේ දක්වාවූ සම්පූර්ණ මූල්‍ය ප්‍රගතිය ඇමරිකනු ඩොලර් 243,354,362.00 ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 47% කි. ඇමරිකානු ඩොලර් 270,704,836.00 ක් වන ඉතිරි 53% ක මූල්‍ය ප්‍රගතිය ඉදිරි මාස 24 තුල අවසන් කිරීමට බලාපොරොත්තු වේ.

ඉරාන අපනයන සංවර්ධන බැංකුවෙන් ව්‍යාපෘතියට මූල්‍ය සහාය හිමිවූවද එය 2013.01.11 දිනැති කොන්ත්‍රාත්කරුගේ ඉන්වොයිස් අංක 9 දරණ කාර්යසාධන ප්‍රකාශනයේ ගෙවීම් දක්වා පමණක් සීමා විය. මෙම පහසුකම ඉරාන රජය වෙත අන්තර් ජාතික ගනුදෙනු සඳහා පනවන ලද සීමාවන් හේතුවෙන් පසු ගෙවීම් සඳහා යොදා ගත නොහැකි විය. එමනිසා, 2013.01.02 දින සිට කාර්ය සාධන ප්‍රකාශන ගෙවීම් (SOP) සඳහා ශ්‍රී ලංකා රජයේ අරමුදල් භාවිතා කිරීමට කටයුතු කර ඇත.

එක් එක් මූල්‍ය මූලාශ්‍ර වලින් කරනු ලැබූ ඇති ගෙවීම් පිළිබඳ සාරාංශය පහත පරිදිවේ:

- ඉරාන අපනයන සංවර්ධන බැංකුව විසින් ගෙවනු ලැබූ සමුච්චිත මුළු ගණන (පහසුකමින් 11.25%)	ඇමරිකානු ඩොලර් 50,616,304.00
- ශ්‍රී ලංකා රජයේ ආධාර භාවිතා කර ගෙවනු ලැබූ සමුච්චිත මුළු ගණන	ඇමරිකානු ඩොලර් 109,174,429.35

ඉරාන අපනයන සංවර්ධන බැංකුවේ මූල්‍ය එකඟතාවේ වලංගුතාවය 2015 පෙබරවාරි 07 වැනි දින අවසන් විය.

2014-12-31 වැනි දිනට ඉන්වොයිස් මත ෆරාබ් සමාගමේ මුළු හිඟ මුදලවූ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන භාවිතා කිරීමට සිදුවන ප්‍රමාණය ඇමරිකානු ඩොලර් 22,200,976.65 කි.

ඉන්වොයිස් මත ගෙවීම් පියවීමේ ප්‍රමාදය කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පමණක් නොව ව්‍යාපෘතියේ ප්‍රගතිය කෙරෙහිද අහිතකර බලපෑම් ඇති කර ඇත.

ක්ෂේත්‍රයේ ගැටළු:
2014 දෙසැම්බර් 24 වැනි දින උමං හාරන යන්ත්‍ර මගින් උමඟ කැනීමේදී පෙරාර උමඟට විශාල ජල කාන්දුවීමක් සිදුවීම නිසා ඇතිවූ දැඩි පාරිසරික බලපෑම් නිසා හා නොනවතින ජල ගැලීම් හා අනෙක් ඉදිකිරීම් නිසා සිදුවූ පාරිසරික බලපෑම් හේතුවෙන් උද්ගතවූ සමාජ අසහනය සළකා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ නියෝග මත වහාම ක්‍රියාත්මක වන පරිදි 2015.02.16 වැනි දින පෙරාර උමඟේ ඉතිරි වැඩ හැර උමාඕය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ මූලස්ථායි වැඩවල ඉදිකිරීම් තාවකාලිකව අත්හිටුවන ලදී. එම තීරණය ගනු ලැබුවේ සති 3ක් ඇතුලත මධ්‍යම පරිසර අධිකාරියෙන් හා විද්වත් කමිටුවක් මගින් ව්‍යාපෘතියේ අදාල තත්වයන් පිළිබඳව අධ්‍යනය කොට වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව ඒවායේ නිර්දේශයන්ට අනුකූලව ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු ගැන සුදුසු පියවර ගැනීමේ අභිලාශයෙන්ය.

5. මධ්‍යම පරිසර අධිකාරියේ හා විද්වත් මණ්ඩලයේ නිර්දේශ

මධ්‍යම පරිසර අධිකාරියෙන් හා විද්වත් මණ්ඩලයෙන් සකස් කරන ලද වාර්තා මේ වන විට මෙම අමාත්‍යාංශයට ලැබී තිබේ. ඒවායේ අදාල නිර්දේශයන් මෙහි පහත සඳහන් වේ.

5.1 මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ

ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු කරගෙන යාම පිණිස පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූ විද්‍යාඥ අංශ ප්‍රධානියාගේ සහභාගිත්වයෙන් යුත් මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ ඇතුලත් වාර්තාව අමාත්‍යාංශය වෙත ලැබී ඇත.

ව්‍යාපෘති යෝජක විසින් පහත අවශ්‍යතා කඩිනමින් සපුරාලිය යුතු බවට නිර්දේශ කර ඇත.

<u>කෙටිකාලීන</u>

- ජල කාන්දුව වලකාලීම - දැනට ප්‍රධාන උමං මාර්ගය අශ්‍රිතව ඇති වී ඇති ජල කාන්දුව හැකි ඉක්මණින් නැවැත්වීම.
- ජල සම්පාදනය - ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නිසා ජල මූලාශ්‍ර/ ප්‍රභව අහිමි වීම නිසා බලපෑමට ලක් වී ඇති ගම්මානවල ජීවත්වන ජනතාවට අවශ්‍ය ජල පහසුකම් කඩිනමින් ලබා දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- වන්දි ලබා දීම - ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නිසා ගම්මාන හා නිවැසියන්ට සිදු වී ඇති හානිය වෙනුවෙන් අවශ්‍ය වන්දි ලබා දීම.
- ප්‍රජා සහභාගිත්වය සහිත පසුවිපරම් කමිටුවක් ඇති කිරීම - පවත්නා තත්වය විමර්ශනය කිරීම සහ විසඳුම් ලබා දීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා/ වරිය සහ ව්‍යාපෘතියේ නියෝජිතයෙකු ඇතුළු අනෙකුත් නිලධාරීන්, ප්‍රජා නියෝජිතයන් හා අනෙකුත් අදාල පාර්ශවයන්ගෙන් සමන්විත පසුවිපරම් කමිටුවක් ඇති කිරීම.

<u>දිගුකාලීන</u>

- භූ ස්ථායීතාවය පිළිබඳ විමර්ශනය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහ මධ්‍යම ඉංජිනේරු කාර්යාංශය ඇතුළු භූ විද්‍යාඥයන්ගෙන් සමන්විත කමිටුවක් හරහා පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිරීක්ෂණ හා නිර්දේශ ලබා ගැනීම.
  - ජල මාර්ග වියලී ගොස් ඇති ප්‍රදේශයේ සහ භූමියේ පැල්ම ඇති ස්ථානවල නායයාමේ අවදානමක් තිබේද යන්න,
  - පූහුල්පොල ජලාශය හා ඩයරාබා ජලාශය යා කරමින් සාදනු ලබන උමං මාර්ගයේ ඉදිකිරීමේ කටයුතු නිසා නාය යාම හෝ භූමිය ගිලා බැසීමේ ප්‍රවනතාවයක් ඇත්දැයි විමර්ශනය කිරීම ,
  - ජලාශවලට ප්‍රවිශ්ඨ වීම සඳහා ඉදිකරනු ලබන මාර්ග හා බදුල්ල වැලිමඩ විකල්ප මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අශ්‍රිතව නාය යාමේ අවදානමක් සහිත භූමියේ අස්ථාවර ස්ථාන තිබේද යන්න,
- භූගත ජලය - උමං මාර්ගය ඉදිකිරීම් නිසා භූගත ජල මට්ටමේ වෙනස් වීමක් සිදුවේද යන්න පිළිබඳව පූර්ව හඳුනා ගැනීමක් සිදු කිරීම සහ එය වලක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- අපද්‍රව්‍ය බැහැර කිරීම - ඉදිකිරීම් කටයුතු නිසා ජනනය වන ද්‍රව්‍ය බැහැරලීමට සුදුසු ස්ථාන හඳුනාගෙන එකී ස්ථාන වල බැහැර කර ලීමට අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම.
- පාංශු ඛාදනය - පාංශු ඛාදනය සිදුවිය හැකි ස්ථානවලින් එකී තත්වය වැලැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම.

- සවිස්තරාත්මක පරිසර කළමනාකරණ සැලැස්ම - පරිසර බලපෑම් අවම කර ගැනීම සඳහා ව්‍යාපෘති යෝජක විසින් ගනු ලබන ක්‍රියාමාර්ග ඇතුලත් සවිස්තරාත්මක පරිසර කළමනාකරණ සැලැස්ම ව්‍යාපෘති යෝජක විසින් වහාම පිළියෙල කිරීම. මෙම සැලැස්මේ කෙටුම්පතක් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් දැනටමත් පිළියෙල කර ඇති එම සැලැස්මට පහතින් දක්වා ඇති කරුණු ද අන්තර්ගත විය යුතුය.

  - පරිසර කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කාල වකවානුව
  - එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමේ ක්‍රමවේදය
  - මේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ආයතනික ව්‍යුහයක් සකස් කිරීම.
  - මේ සඳහා ප්‍රජා සහභාගිත්වය ලබා ගැනීම.

සටහන් :

- උක්ත නිර්දේශ නිසි පරිදි ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයක් මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් ඇති කිරීම වැදගත් වේ.
- මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධානත්වයෙන් පිහිටුවා ඇති පසුවිපරම් කමිටුව මගින් මෙම කරුණු සම්බන්ධයෙන් නිරන්තරයෙන් විමර්ශනය සහ අධීක්ෂණය කිරීමේ හැකියාව පවතී.

2 විද්වත් මණ්ඩලයේ නිර්දේශ

මේ වනවිට ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු කරගෙන යාම පිණිස පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූ විද්‍යාඥ අංශ ප්‍රධානියාගේ ප්‍රධානත්වයෙන් පත්කරන ලද විද්වත් මණ්ඩලයේ නිර්දේශ ඇතුලත් වාර්තාව ද මේ වන විට අමාත්‍යාංශය වෙත ලැබී ඇත.

ජල කාන්දුවීම හේතුකොට ගෙන දැනට උද්ගත වී තිබෙන තාක්ෂණික හා සමාජීය ගැටළු වලට පිළියම් වශයෙන් හා ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු කරගෙන යාමේදී උද්ගත විය හැකි එවැනිම හා අනෙකුත් ගැටළු අවම කරවීම සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් පියවර ගැනීම එම වාර්තාවෙන් නිර්දේශ කොට ඇත.

- ප්‍රධාන උමගේ ජල කාන්දුව නවතා දැමීමට සහ දුර්වල කොටස් ශක්තිමත් කිරීමට වහාම ක්‍රියාත්මක වීම.
- උමග කැනීමේදී, එයින් ඉදිරියට හමුවන පාෂාණ වල තත්වයන් සවිස්තරාත්මකව සමීක්ෂණය කොට හඳුනා ගැනීම සහ කැනීමට පෙර ඒවා තුලින් ජලය කාන්දු වීමට ඇති ඉඩකඩ වසා දැමීම සඳහා අවශ්‍ය ප්‍රතිකර්ම සිදුකිරීම.
- කැනීමෙන් අනතුරුව, ජල කාන්දුව සම්පූර්ණයෙන් නවතා දැමීමට හෝ පිළිගත හැකි ප්‍රමාණයක් දක්වා අඩු කිරීමට අදාල පිළියම් කිරීම.
- ප්‍රධාන උමගේ ගමන් මාර්ගය දිගේ අතිරේක ඉංජිනේරු භූ විද්‍යාත්මක සිතියම් ගත කිරීම් හා භූ භෞතික විද්‍යාත්මක සමීක්ෂණ කිරීම හා අවශ්‍ය යැයි හැගෙන ස්ථානවල අතිරේක මිහිවිදමන් කැනීම හා අදාල භූ තාක්ෂණික සමීක්ෂණ කිරීම.
- භූගත ජල මට්ටම් මාපක සවිකිරීම හා මතුපිට හා භූගත ජල මට්ටම අඛණ්ඩව නිරීක්ෂණය කිරීම.
- නිවාස හා ගොඩනැගිලි වල ඇති වී තිබෙන ඉරි තැලීම් සමීක්ෂණය කිරීම.
- ප්‍රශ්නාර්ථයක් වී තිබෙන පාංශ භූණු ගල් තිබිය හැකි ප්‍රදේශයන් හඳුනා ගැනීම.
- උමග තුල විරූපනය වීම් විමර්ශනය සඳහා අවශ්‍ය උපකරණ සවි කිරීම.
- ග්‍රාමීය මට්ටමේ සම්බන්ධීකරණ කමිටු ස්ථාපණය කිරීම.
- පාලන කමිටුවක් පත් කිරීම.
- බලපෑමට ලක් වූ ගම්වැසියන් හට පානීය ජලය ලබා දීම සුරක්ෂිත කිරීම.
- දැනට උද්ගත වී ඇති තත්වය හා ඒවා මැඩ පැවැත්වීමට ගෙන ඇති පිළියම් සම්බන්ධයෙන් ගම්වාසීන් හා බලපෑමට ලක් වූ ප්‍රජාව දැනුවත් කිරීම.
- ඇති වී තිබෙන හානීන් තක්සේරු කිරීම හා ඒවාට වන්දි ලබා දීම සහ පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය සහය ලබා දීම.
- සමාජීය, පාරිසරික හා තාක්ෂණික තත්වයන් පළිබඳව නිරතුරුවම සමාලෝචනය කිරීම.

6. <u>යටිගං සංවර්ධන වැඩ</u>

සෘජු කම්කරු පදනම මත ශ්‍රී ලංකා රජයේ ආධාර භාවිතයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතියේ මෙම සංරචකය ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ. යටිගං සංවර්ධන වැඩ සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2013 සැප්තැම්බර් 27 වැනි දින අනුමැතිය ලබා දී ඇත.

මේ දක්වා මූල්‍ය ප්‍රගතිය 6% ක් වන අතර අවශ්‍ය අග්‍රිම මුදල් ලබා ගැනීමේ ප්‍රමාදය වැඩ වල ප්‍රගතිය කෙරෙහි දැඩි ලෙස බලපා ඇත.

- ආරම්භ කළ දිනය 2013
- අවසන් කිරීමට සැලසුම් කළ දිනය 2017

2015 මාර්තු 23 දින

මකුල්ඇල්ල, වෙහෙරගල තැන්න, කුරුඳුගොල්ල ජලසම්පාදන යෝජනා ක්‍රම -

විෂය පථය, ආවණ ද ශ, ජල ප්‍රභවය හා පිරිවැය වෙනස්වීම පිළිබ විස්ත

අංකය	ජල සම්පාදන යෝජනා ක්‍රමය	ආවරණය වන ප්‍රදේශ (ග්‍රාම නිලධාරී කොට්ඨාශ අනුව)		පවුල් සංඛ්‍යාව		ප්‍රභවය		ඇස්තමේන්තුව (10% අවිනිශ්චිත වියදම් ඇතුළුව) රු. මිලියන			විෂය පථය හා පිරිවැය වෙනස් වීම සම්බන්ධ කරුණු
								එකතු කළ අගය මත බද්ද ඇතුළුව		එකතු කළ අගය මත බද්ද	
		මුල් යෝජනාව	සංශෝධිත යෝජනාව	මුල් යෝජනාව	සංශෝධිත යෝජනාව	මුල් යෝජනාව	සංශෝධිත යෝජනාව	මුල් යෝජනාව	සංශෝධිත යෝජනාව	සංශෝධිත යෝජනාව	
1	වෙහෙරගල තැන්න	වෙහෙරගල තැන්න හා බොරලන්ද යන ප්‍රදේශ	වෙහෙරගල තැන්න, එගොඩගම, පල්ලේ පේරුව හා හීල් ඔය යන ග්‍රාම නිලධාරී	200	500	බණ්ඩාරවෙල ජලාශ යෝජනා ක්‍රමය දීර්ඝ කිරීම		133.0	102.73	92.54	*පවුල් සංඛ්‍යාව වැඩි වුවද මුලින් යෝජිත පීඩන පොම්ප විස්තරාත්මක සැලසුම් අවස්ථාවේ අනවශ්‍ය බව
2	මකුල් ඇල්ල	මකුල්ඇල්ල ප්‍රදේශය	මකුල්ඇල්ල ග්‍රා.නි කොට්ඨාශය හා බඹරගම, අඹදන්ඩේ ගම, එගොඩගම හා මැදපේරුව යන ග්‍රා.නි කොට්ඨාශ වලින් කොටස බැගින්	720	1500	අඹදන්ඩේ ඔය		40.0	237.29	213.78	* පවුල් සංඛ්‍යාව වැඩි වීම * ජල පිරිපහදු ක්‍රියාවලිය වැඩි * පවුල් සංඛ්‍යාව වැඩි වීම නිසා අවශ්‍ය පොම්ප, ජල නල හා ටැංකි වල ධාරිතාව වැඩි වීම
		එගොඩගම මැදපේරුව	-	150	-	කන්ද අරාව වැව	-	10.0	0.0	0.0	*ගොවි සංවිධානයේ විරෝධතාවය නිසා අත්හරින ලදි.
3	කුරුඳු ගොල්ල	කුරුඳු ගොල්ල	කුරුඳු ගොල්ල සහ වෙහෙරගල තැන්න ග්‍රාම නිලධාරී	347	400	උල්පතකින්		5.0	12.11	10.91	* පවුල් සංඛ්‍යාවේ වැඩි වීම හා ඒ අනුව අවශ්‍ය ටැංකි වල ධාරිතාවය වැඩි වීම
	එකතුව			**1417**	**2400**			**188.0**	**352.1**	**317.23**	

1068

අමුණුව - 02

A(3)50 3

Minutes of the Technical Evaluation Committee

Ministry of Mahaweli Development and Environment (MMDE)

Procurement Guide line reference 2.11.3

Nature of Procurement Committee		*TEC*		Name of Procurement Entity (PE)	*Ministry of Mahaweli Development and Environment(MMDE) and/or Institutions and Project under MMDE*
Title of Procurement		*Various as described below.*			
Meeting No	*TEC/MMDE/ 2016/01*	Date/Time	*2016/05/20 at 14.30 hrs.*	Purpose/Purposes	*To assist SCAPC Implementation of three water supply schemes to provide drinking water for the affected people in the area of Weheragalathenna, Makulella and Kurundugolla due to the Headrace Tunnel of UOMDP.*

Present

Members of TEC		Others	
Name	Capacity	Name	Capacity
1. Eng.G.A. Dayarathne *2. Eng. L.R.H. Perera* *3. Mr.K.A. Ananda* *4.Eng. H.R.A.K. Dammika* *5.Mr. P.K.D.M. Gunasena*	*Chairman* *Member* *Member* *Member* *Member*		
Eng.(Mrs)D.N.H.L.Madawalagama *Director(PI& T)*	*Secretary to MPC.*		

TEC Report on Implementation of Three Water Supply Schemes (WSS) to Provide Drinking Water for the Affected People in the Area of Weheragalathenna, Makulella and Kurundugolla due to the Headrace Tunnel of Uma Oya Multipurpose Development Project (UOMDP), to assist SCAPC

TEC having gone through the documents pertaining to above 3-WSS made available by PMU, observed followings;

- The Ministry of Mahaweli Development and Environment (MMDE) has invited proposal for implementation of above mentioned three WSS from National Water Supply and Drainage Board (NWS&DB) being the sole Authority in implementation of Public Water Supply Schemes and Water Distribution Systems in Sri Lanka. The Total Estimate Cost (TEC) submitted by NWS&DB on 29.01.2015 for the 3 WSS was Rs. 188 million. Cabinet of Ministers has granted approval on 02.04.2015 for the implementation of three Water Supply Schemes (WSS) urgently at a total cost Rs. 188 million to provide drinking water to the people affected by the construction activities of UOMDP.

- The Committee observed that immediate action has been taken by PMU for the implementation of 3 WSS as per directive of the Cabinet of Ministers and they are now at various stages of construction progress.
- In view of the above, there is no need to prepare bidding document for the above work; as such Procurement Time Schedule (PTS) is not relevant at this stage.

- The Total Estimate Cost (TEC) of the 3 WSS has gone up Rs. 317.23 Million (including 10% contingency) plus VAT from its original TEC of Rs. 188 Million, as per revised proposal dated 01.03.2016 submitted by NWS&DB.
- Reasons for increase in costs of the 3-WSS are mainly due to change of scope as a result of increase in coverage area and introduction of treatment facilities (See details in Annexure-1)
- Cabinet of Ministers has granted approval on 02.04.2015 for the implementation of the 3 WSS on the following basis:
    1. To provide funds by GOSL towards the implementation above WSS at the estimated cost of Rs. 188 Million submitted by the NWS&DB to provide pipe borne water supply to the affected people, and to provide an imprest of Rs. 55 Million to the Ministry of Mahaweli Development and Environment (MMDE) being the cost of Rural Water Supply Schemes (RWS) that could be implemented immediately.
    2. In order to expedite providing potable water supply facility, to entrust the said construction work to Central Engineering Consultancy Bureau (CECB) under the supervision of NWS&DB.
- From the information received from Project Management Unit (PMU), it is observed that Total Estimate Cost of NWS&DB had been prepared based on approved rates of the NWS&DB and according to their approved design and service connection to the consumers too are included in the estimate. In view of above mentioned facts, evaluation of rates ofthe NWS&DB proposal does not arise.

Recommendation:

TEC recommend that the revised proposal submitted by NWS&DB for implementation of 3 WSS for a total Cost of Rs. 317.23 Million (including 10% contingency) plus VAT be accepted subject to implementation of schemes on the following basis as previously approved by Cabinent of Ministers.

1. Implementation of 3 WSS be entrusted to NWSDB with the provisions including Design, supply of pipes/equipment, construction supervision, installation, testing and commissioning of the plant & Equpment and Contract Management of work to be entrusted as per the proposal to CECB,by NWS&DB.
2. Construction work including laying of pipe lines of 3 WSS to be entrusted to Central Engineering Consultancy Bureau (CECB) under supervision of NWS&DB, on negotiated contract prices within the approved cost estimate of the relavant component of the proposal. NWSDB shall enter into a Contract Agreement with CECB for this purpose.
3. Payments be made to NWS&DB on their monthly invoices on actual work performed including work entrusted to CECB.

Signatures:

	Name	Capacity	Agreed with Above Decision/s (Yes / No)	Signature
1.	*Eng.G.A. Dayaratne*	Chairman	Yes	
2.	*Eng. L.R.H. Perera*	Member	Yes.	
3.	*Mr.K.A. Ananda*	Member	Yes	
4.	*Eng. H.R.A.K. Dammika*	Member	Yes	
5.	*Mr. P.K.D.M. Gunasena*	Member	Yes	

Annwx-1

COMPARISION OF CHANGE OF SCOPE OF THE WORK, COVERAGE AREA, SOURCE, COST WITH JUSTIFICATIONS

MAKULELLA, WEHERAGALATHANNA AND KURUNDUGOLLA WSS

No.	TYPE OF WATER SUPPLY SCHEME	INITIAL COVERED AREA (GS DIVISIONS)	REVISED COVERED AREA (GS DIVISIONS)	NO. OF FAMILIES (INITIAL STAGE)	NO. OF FAMILIES (REVISED STAGE)	LOCATION OF SOURCE (INITIAL STAGE)	LOCATION OF SOURCE (REVISED STAGE)	INITIAL COST ESTIMATE INCL. CONTIGENCIES(10 %)+VAT/(Rs.Mn)	REVISED TOTAL COST ESTIMATE INCL. CONTIGENCIES(10 %)+VAT/(Rs. Mn)	JUSTIFICATION FOR CHANGE OF THE SCOPE & INCREASING THE COST
1	Weheragalathanna (WSS)	Weheragalathanna & Boralanda area	Part of Weheragalathanna, part of Egodagama and part of Palleperuwa and part of Heeloya.	200	500	Extension from Bandarawela WSS	Extension from Bandarawela WSS	133	102.73	* At detail design stage booster pumps were removed. * No. of families increased
2	Makulella (WSS)	Makulella area	Makulella, Part of Bambaragama, Part of Ambadandegama and Part of Egodagama & Madaperuwa	720	1500	Ambadandegama Oya	Ambadandegama Oya	40	237.29	* No. of families increased * Water treatment process improved. * In detail design stage, aerator, flocculator, sedimentation unit, rapid sand filters, chlorinators, back wash system with air blowers, etc. were added. *Increased coverage resulted increased capacities of pumps, pipe lines, storage, etc.
		Egodagama & Madaperuwa		150		Kanderawa Lake		10	0	*Abandoned as farmers organization objected
3	Kurundugolla (WSS)	Kurundugolla	Kurundugolla & Part of Weheragalathanna	347	400	Spring	Spring	5	12.11	Additional coverage and enhanced storage
	Total			**1417**	**2400**			**188**	**352.13**	

WSS* Water Supply Scheme

Uma Oya Multipurpose Development Project (UOMDP)

TEC Report
on
NWSDB Proposal for Implementation of Three Water Supply Schemes to Provide Drinking Water for the People Affected in the Areas of Weheragalatenna, Makulella and Kurundugolla due to construction activities of the Headrace Tunnel of UOMDP

Prepared by Technical Evaluation Committee (TEC) to Assist SCAPC–May 20, 2016

1.0 Background

With heavy ingress of water encountered on and after 24th December 2014 while the Headrace Tunnel (HRT) was being excavated using a Tunnel Boring Machine (TBM) ground water levels in the area of **Weheragalatenna, Makulella and Kurundugolla** started depleting and subsequently dug wells in the vicinity too started drying. Further, cracks in the houses too started appearing and about 800 families living in the area were thoroughly disturbed.

At the meeting held at the Bandarawela Divisional Secretary's office in January 2015, it has transpired that there were a few Rural Water Supply Schemes (RWSS) planned by the National Water Supply & Drainage Board (NWS&DB), to provide pipe borne water to areas covering most of the affected people, but awaiting funds. Then, at request of the Secretary, Ministry of Mahaweli Development & Environment, NWS&DB has submitted the following tentative estimates on 29th January 2015.

Area covered from proposed Extension and RWS Schemes	Families	Cost (Rs.Million)	
Weheragalathanna and Boralanda area-pipe line extension from Bandarawela WSS	200	133	
Egodagama and Madaperuwa Area-Construction of new RWSS	150	10	Rs.55 Million
Kurundugolla-Rehabilitation of Existing RWSS	347	5	
Makulella – RWSS	720	40	
	1417	**188**	

1.1 Approval of the Cabinet of Ministers:

Due to the exigency of providing a solution to the drinking water problem of the affected families, approval of the Cabinet of Ministers has been sought by the Cabinet Memorandum dated 23.03.2015 inter-alia for the implementation of the above proposed water supply schemes. Approval of the Cabinet of Ministers was granted on 02.04.2015 for the implementation of the schemes at a total estimated cost of **Rs. 188 million** as follows;

- To provide funds by GOSL towards the implementation above WSS at the estimated cost of Rs. 188 Million submitted by the NWS&DB to provide pipe borne water supply to the affected people, and to provide an imprest of Rs. 55 Million to the Ministry of Mahaweli Development and Environment (MMDE) being the cost of Rural Water Supply Schemes (RWS) that could be implemented immediately.
- In order to expedite providing potable water supply facility, to entrust the said construction work to Central Engineering Consultancy Bureau (CECB) under the supervision of NWS&DB.

1.2 Immediate Action Taken:

No sooner above approval of the Cabinet of Ministers was received, action was taken by the Project Management Unit (PMU) to start work on the Water Supply Schemes through NWS&DB and CECB.

1.3 Change of Scope of Work:

During the detailed investigation and survey of the affected area, NWS&DB has identified that certain changes to the original scope has to be made to accommodate the following requirements:

a). Need to introduce full treatment process to the Makulelle WSS which was initially designed as a Rural Water Supply Scheme without treatment facility;

b). Increase in coverage area and number of families to be served at the request of the Respective Divisional Secretaries which in turn increased the water demand.

The relevant details are given in the Annex-1.

1.4 Revised Cost Estimate:

The General Manager, NWSDB by his letter No. Adgm/SE/Dev/21 dated 01.03.2016, has submitted revised total cost estimate amounting to **Rs. 352.13 million** (including 10% contingency plus 11% VAT) with justifications and detailed estimate based on the change of the Scope mentioned in 1.3 herein above including service connection to the consumers.

The detailed breakdown of the Revised Proposal –February 2016, is for a total estimated cost of Rs. 317.23 million (including 10% Contingency) plus VAT for the three Water Supply Schemes (WSS) which are made up as follows:

	NWSDB Comp.(Rs.)	CECB Comp.(Rs.)	Total (Rs.)
• Makulella Water Supply Scheme for	110,473,257.32	103,306,754.18	213,780,011.50
• Weheragalatenna WSS for	58,657,912.43	33,891,333.87	92,549,246.30
• Kurundugolla WSS for	5,562,790.07	5,345,019.79	10,907,809.86
Total amount of Revised Proposal (excluding VAT)			**317,237,067.66**

2.0 Observations

TEC observed that:

i). According to the information furnished by the PMU of UOMDP, construction work of all three above mentioned Water Supply Schemes (WSS) which are to be done by CECB under the supervision of NWSDB as per the approval granted by the Cabinet of Ministers, are now at various stages of progress as indicated below:

Makulella Water Supply Scheme (WSS)

Construction of intake well & pump house, treatment plant, office Building, storage tanks, DI pipe laying is in progress (40%)

Weheragalathanna Water Supply Scheme (WSS)

Construction of Care Taker's house, 80 m3 storage tanks, uPVC pipe laying is in progress (55%)

Kurundugolla Water Supply Scheme (WSS)

Only construction of 20 m^3 Ferro cement tank and cleaning and improvement of intake well are completed which is about 10% of the total work.

ii). National Water Supply & Drainage Board (NWSDB) being the sole authority in implementation of Public Water Supply Schemes in Sri Lanka, have been entrusted with implementation of the above three WSS by the MMDE/PMU following the approval of the Cabinet of Ministers.

iii). From the information received from PMU, the estimated costs of NWSDB are based on the rates approved by NWSDB. Hence, further evaluation of the rates quoted rates may not be required.

iv). Considering the facts in (i) to (iii) herein above, study of PTS, scrutinizing the bid data & special Conditions of contract, study of BOQ etc. as mentioned in the Terms of Reference attached to the letter of appointment of TEC, are not relevant at this stage.

3.0 Recommendation

(a) TEC recommend that based on the concept of implementation of the three Water Supply Schemes as approved by the Cabinet of Ministers on 02,04.2015, NWSBD be entrusted with the total package of Investigation, Design, Supply of Pipes, Plant & Equipment, Service connection to the consumers, Construction Supervision, Contract Management, installation, testing and Commissioning of the plant & Equipment and taking over of the WSS with provision for NWSBD to directly obtain services of CECB for Construction Works & Laying of

Pipe Lines of the said WSS on separate Contracts at the negotiated Contract Prices within the relevant Estimated Costs shown below. Accordingly, Contract Agreement be entered in to between the Project Director (UOMDP) and NWSDB for the implementation of the three WSS as follows:

	NWSDB Comp.(Rs.)	CECB Comp.(Rs.)	Total (Rs.)
• Makulella Water Supply Scheme for	110,473,257.32	103,306,754.18	213,780,011.50
• Weheragalatenna WSS for	58,657,912.43	33,891,333.87	92,549,246.30
• Kurundugolla WSS for	5,562,790.07	5,345,019.79	10,907,809.86
Total amount of Revised Proposal (excluding VAT)			**317,237,067.66**

(b) TEC recommend that NWSDB shall enter in to separate contracts for the civil construction works including laying of pipes for each of the said WSS on negotiated Contract Prices within the estimated costs under CECB Component of the NWSDB Proposal and shall be responsible for the Contract Management of same.

(c) TEC recommend that payments to NWSBD be made on their monthly invoices submitted based on the actual Progress of works at the rate quoted/negotiated rates with CECB as applicable.

.....	.....	.....
Eng. G.A. Dayaratne,	Eng. L.R.H. Perera,	Mr.K.A. Ananda,
Deputy Project Director (P&C),	Director (WRP),	Accountant (Finance),
UOMDP	MMDE	MMDE
Chairman	Member	Member
.....	.....	
Eng. H.R.A.K Dammike,	Mr. P.K.D.M. Gunasena,	
Project Engineer (P&C),	Assistant Director,	
UOMDP	Dept. of Treasury Operation.	
Member	Member	

Encl; Annex- 1

Note:-

UOMDP	-	Uma Oya Multipurpose Development Project
GOSL	-	Government of Sri Lanka
RWSS	-	Rural Water Supply Scheme
WSS	-	Water Supply Scheme
WSP	-	Water Supply Project
NWS&DB	-	National Water Supply & Drainage Board
CECB	-	Central Engineering Consultancy Bureau
MMDE	-	Ministry of Mahaweli Development and Environment
